# පහන් ටැඹ දැල්වූවෙමු

එච්.අයි. සමන්මලී... මතක ආවර්ජනා



# පහන් ටැඹ දැල්වූවෙමු

එච්.අයි. සමන්මලී... මතක ආවර්ජනා

# පහන් ටැඹ දැල්වූවෙමු

ප්‍රකාශනය - ඩාබිඳු සාමූහිකය
ISBN 978-955-8023-09-9

---

ප්‍රථම මුද්‍රණය - 2025 ඔක්තෝබර්
පිටකවර සැකසුම - ප්‍රසාද් චන්දිමාල්
සංස්කරණය - සුමිකා පෙරේරා
සංස්කරණ සහය - චමිලා තුෂාරි
මුද්‍රණය - චාමරා ප්‍රින්ටර්ස්, මොරටුව.

# පටුන

**පිටු අංකය**


කම්කරු සටන් සහ මාගේ සමාජ ජීවිතයේ ආරම්භය ................. 15

පොලිටෙක්ස් වැඩ වර්ජනය සහ කාන්තා ව්‍යාපාරයේ පිබිදීම........... 21

කම්කරු සටන් වලින් ඔබ්බට ස්ත්‍රීන්ගේ පෙළගැස්ම .................. 25

කම්කරු සටන් තුළ ගොඩනැගුණු උතුරු සහ දකුණු කම්කරු
සහයෝගීතාවය ........................................................ 33

1983 කළු ජූලිය .......................................................... 35

පුරුෂාධිපත්‍යය ස්ත්‍රී මධ්‍යස්ථානයේ විනාශයට හේතු විය ............. 42

ඩාබිඳු සාමූහිකයේ ආරම්භය ............................................. 44

නිදහස් වෙළඳ කලාපයේ ප්‍රථම පුවත් පත ඩාබිඳු ආරම්භය
සහ විකාශනය ............................................................. 49

රාජ්‍ය මර්දනය ක්‍රියාත්මක වීම ලයනල් සහ රංජිත්
අතුරුදහන් කරවීම .................................................... 62

බියගම ඩාබිඳු ශාඛාව ආරම්භ කිරීම ................................ 71

ඇන්සල් ලංකා කම්කරු සටනේ ජයග්‍රහණයට කැප වූ
බියගම ඩාබිඳු ............................................................ 75

ජාත්‍යන්තර සබඳතා ........................................................ 86

4 වැනි ජාත්‍යන්තර කාන්තා සමුළුව.......................................... 90

# පෙරවදන

# අපට පහනක් වූ දිරිය සහෝදරී, සමන්මලී

මට සමන්මලීව මුලින්ම මුණගැසුනේ ඒකල කාර්මික ජනපදය තුළ පිහිටි ඇයගේ ගල්ලවත්ත නිවසේදී ය. සුන්දර සිනහවකින් යුත් 30 හැවිරිදි ඇය, අවුරුදු දහයට අඩු දරුවන් හතර දෙනෙකුගෙන් යුත් නිවසක සහෘදයින් පිරිසක් රැකබලාගත් කඩිසර සහ ලස්සන ගැහැණියක වූවාය.

ඇගේ සැමියා, සෝමේ (සෝමපාල) එකල ලංකා වෙළඳ, කාර්මික සහ පොදු කම්කරු සංගමයේ (CMU) සාමාජිකයෙක් වූ අතර, ඔවුන්ගේ ශාඛා යුනියන් කාබයිඩ්, මොන්ටා ගාර්මන්ට් ආදී ආයතනවල පිහිටුවා තිබුණි. සෝමේ විප්ලවවාදී මාක්ස්වාදී පක්ෂයේ (RMP) සාමාජිකයෙක් ද වූවේය. මා ද එම පක්ෂයේ සාමාජිකයෙක් වූ අතර මට සමන්ව මුලින්ම මුණගැසුණේ ඔවුන් පැවැත් වූ දේශපාලන සාකච්ඡාවලින් එකකදී ය.

කර්මාන්තශාලා අසල නිවසක් තිබුණේ සමන් සහ සෝමේට පමණි. එය සැමවිටම පාහේ කාර්යය බහුල නිවෙසක් විය. ඒ මන්ද යත් යුනියන් ක්‍රියාමාර්ග සැලසුම් කිරීම, වැඩ වර්ජන ක්‍රියාමාර්ගවලට සහාය දීම, සේවක දුක්ගැනවිලි සාකච්ඡා කිරීම සහ සහයෝගීතා ක්‍රියාමාර්ග

ගොඩනැගීම සඳහා ඔවුන් නිරන්තරයෙන් සම්බන්ධ වූ නිසාය. ක්‍රියාකාරිනියක ලෙසින් වැඩ කරන අතරම මවක වූ සමන්, ළමයින්ගේ පාසල් වැඩ, නිවසේ ඉවුම් පිහුම් වැඩ ටික ද නොපිරිහෙලා සිදු කළාය. ගෙදර වැඩ මෙන්ම අප්‍රමාණවත් තේ කෝප්ප ප්‍රමාණයක් හෝදන්නට ඇයට සිදු වුණි. ඇය කළ ඒ වැඩ සියල්ලක්ම සැඟවුණු වැඩ ලෙසින් පැවතුණි.

සමන්ගේ ගෙබිම පෝස්ටර් වලින් පිරී තිබුණි. එහි සෑම හිස් ඉඩකම පත්‍රිකා සහ පුවත්පත් මිටි ගණනින් ගොඩ ගැසී තිබුණි. සමන් සහ මම බොහෝ විට හවස් වරුවලත් සති අන්තවලත් ඒකල කාර්මික ජනපදය පුරා මේ පුවත් පත් පෝස්ටර් විකිණීමට, බෙදා හැරීමට ගිණි අව්වේ සැතපුම් ගණනක් ඇවිද්දෙමු. මේ සජීවී පරිසරය තුළ සමන් ඇගේ දේශපාලන දැනුම සහ සවිඥානය මුවහත් කරගත්තාය, ඇගේ සටන්කාමීත්වය ශක්තිමත් කර ගත්තාය, පොලීසියටත් ආයතනික සහ දේශපාලන මැරයන්ටත් මුහුණ දෙමින් ඇය, ඇගේ ධෛර්යය විදහා පෑවාය.

1980 දී, ජූලි මහා වැඩ වර්ජනයේ පරාජයෙන් පසු, RMP නායකත්වය බාලා තම්පෝගෙන් උපාලි කුරේ වෙතට මාරු වූවේය. මෙම නව නායකත්වය යටතේ RMP හි ජා-ඇළ ශාඛාව, සෝමේ, කේ. ආර්. ප්‍රනාන්දු, ආතර් ගෝමස්, බැසිල්, යූ. එල්. ඒ. ජෝසප් සහ ඇන්ටන් මාකස් යන අයගෙන් සමන්විත විය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් කලින් CMU හි සාමාජිකයින් වී පසු කාලයේ එයින් කැඩී ගොස් කාර්මික ප්‍රවාහන සහ පොදු සේවක සංගමය (ITGWU) පිහිටුවා ගත්තේය. මේ අතර RMP පක්ෂය තුළ “කාන්තා විමුක්ති ව්‍යාපාරය” (WML) යන කුඩා කාන්තා සංවිධානයක් බිහි කිරීමට අවස්ථාවක් උදා වුණි. එය පක්ෂයට අයත් කාන්තාවන්ගෙන් සමන්විත, ලිහිල් කණ්ඩායමක් විය. මම, සමන්මලී, කුමුදිනී රෝසා, ෆිලෝමිනා, මාලා රත්නශීලි, සහ මල්ලිකා ඒකල කාර්මික ජනපදයේ කර්මාන්තශාලාවල කාන්තාවන් හා එක්ව කාන්තා අධ්‍යයන කව ආරම්භ කළෙමු.

ඇඟළුම් කර්මාන්තවලත්, අපනයන සැකසුම් කලාපවලත් වන ශ්‍රම කොල්ලය, කාන්තාවන්ට එරෙහි පීඩනය සහ ඔවුන්ගේ ද්විත්ව/ත්‍රිත්ව බර

සාකච්ඡා කළ මෙම අධ්‍යයන කව සංවිධානය කිරීමේ මූලිකත්වය ගත්තේ සමන්මලී සහෝදරියයි. මාධ්‍ය තුළ කාන්තාව සෘණාත්මකව නිරූපණය කිරීම, වතුකරයේ කාන්තාවන් සූරාකෑම, හෙදියන්ගේ අරගලය, කාන්තාවන් සඳහා රාත්‍රී වැඩ, කාන්තාව සහ පවුල යනාදිය අඩංගු 'කාන්තා හඬ' සඟරාවේ ලිපි ද මෙම අධ්‍යයන කවවල සාකච්ඡා විය. මෙම සාකච්ඡා සමන්මලීගේ ජීවිත කාලය පුරාවටම ඩාබිඳු පුවත්පතේ ලියූ ලිපිවලටත් ස්ත්‍රී අධ්‍යාපන හා පුහුණුවීමේ ආයතනය (WETI) නිර්මාණය කළ අධ්‍යාපනික පත්‍රිකාවලටත් සාධනීය ආභාසයක් ලබා දුණි. පසුව WLM සහ RMP වතුකරයේ කාන්තා සේවිකාවන්ගේ සහභාගීත්වයෙන් නාවලපිටිය දක්වාත්, කාන්තා ශිෂ්‍යාවන් සමඟ යාපනය දක්වාත්, කාර්මික අංශයේ කාන්තා සේවිකාවන් සමඟ රත්මලාන දක්වාත් මෙම අධ්‍යයන කව ව්‍යාප්ත කිරීමට අපි සමත් වීමු.

1980 ජූලි මහා වැඩ වර්ජනය පරාජය වූයේ කම්කරු පන්තිය දැඩි ලෙස මර්දනයට ලක් කරමිනි. ඉන් පසුව කාන්තා කම්කරුවන් සංවිධානය කිරීම තරමක දුෂ්කර කාර්යයක් විය. එහෙත් මෙම කාලය තුළ සමන්මලී, ෆිලෝමිනා සහ මා ඒකල කාර්මික ජනපදය වටා ඇවිද යමින් නේවාසික කම්කරු සේවක සහෝදරියන් බැහැදකිමින්, පත්‍රිකා බෙදා හරිමින් RMP-ITGWU හි වෘත්තීය සමිතියට කාන්තාවන් බඳවා ගැනීමට කටයුතු කළෙමු.

පොලිටෙක්ස් ගාමන්ට්හි වෘත්තීය සමිතියක් පිහිටුවීමට සමන්මලී, බන්දු ශාන්ති, ලීලා ෆර්ඩිනැන්ඩස් සහ පද්මිණී මාතරගේ සමඟ සංවිධානය කරන ලද සාකච්ඡා මගේ මතකයේ ඇත. ඔවුන් ශාඛා සමිතියක් පිහිටුවාගත් අතර එය 1982 දෙසැම්බර් මාසයේ සුප්‍රසිද්ධ පොලිටෙක්ස් වැඩ වර්ජනයට හේතු විය. කාන්තා සේවිකාවන් සමඟ පැය 24 ම සෘජුව සම්බන්ධ වූ එකම පුද්ගලයා වූ සමන් මෙම අරගලයේ කේන්ද්‍රීය වැඩකොටසක් කළ ප්‍රබලතම ක්‍රියාකාරිනිය විය. නායිකාව විය.

1982 මැද භාගය වන විට, කාන්තා විමුක්ති ව්‍යාපාරය විසින් ජා-ඇළ තුඩැල්ල හි (මීගමුව ප්‍රධාන මාර්ගයේ) ස්ත්‍රී මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදී. මෙය කාන්තා සේවිකාවන්ට හමුවීමට ඉඩ අවකාශයක් ලබාදිය හැකි ස්ථානයක් බවට පත්වීම අප ලද සුවිශේෂ සාර්ථකත්වයක් විය.

එකල සමන්මලී, ෆිලෝමිනා සහ මා ස්ත්‍රී මධ්‍යස්ථානයේ සේවය කළෙමු. කාන්තා සේවිකාවන්ගේ අයිතිවාසිකම්, කම්කරු අයිතිවාසිකම්, සමාජවාදී ස්ත්‍රීවාදය, ලංකාවේ කාන්තා ව්‍යාපාරයක් ගොඩනැගීමේ අවශ්‍යතාවය පිළිබඳව ද අප විසින් සාකච්ඡා සංවිධානය කළ අතර දෙමළ වතු කම්කරුවන්ගේ ප්‍රශ්න සහ ජනවාර්ගික ගැටුම පිළිබඳව ද සාකච්ඡා ආරම්භ කළෙමු.

1982 දෙසැම්බර් පොලිටෙක්ස් වැඩ වර්ජනය දියත් කරන අවස්ථාවේ දී අපට මෙන්ම එම සේවිකාවන්ට ද කම්කරු පන්තියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව හෝ සංවිධානාත්මක ක්‍රම පිළිබඳව පූර්ව අත්දැකීමක් නොතිබුණි. සේවිකාවන්ගේ සටන්කාමීත්වය සහ උපායමාර්ගික කුසලතා බොහොමයක් ඔප් නංවන ලද්දේ ඒකල කාර්මික ජනපදයේ ජීවිතයට සහ රැකියාවට එළඹීමෙන් මය. කාර්මික, ප්‍රවාහන සහ පොදු සේවක සංගමය (ITGWU) හරහා සේවකයින්ට සංවිධානය වීමට ඇති අයිතිය, වැටුප් වැඩි කිරීම සහ නත්තල් ප්‍රසාද දීමනාවක් ඉල්ලා 1,300ක ශ්‍රම බලකායකින් කාන්තාවෝ 750 ක් පමණ 1982 දෙසැම්බර් මාසයේ දී වැඩ වර්ජනය දියත් කළෝය.

පොලිටෙක්ස්හි වැඩකරන පරිසරය එහි සේවකයින්ට දුෂ්කර විය. එහි සේවකයින්ගෙන් 95% ක් කාන්තාවන්ගෙන් සමන්විත වූ අතර දක්ෂ යන්ත්‍ර ක්‍රියාකරුවන් සඳහා ආරම්භක දෛනික වැටුප රු. 11.74ක් ද නුපුහුණු අයට රු. 8.60ක් ද ගෙවන ලදී. සේවකයින්ට අර්ධ දින නිවාඩු පහසුකමක් හෝ ඔවුන් ඉල්ලා සිටි දිනවල නිවාඩු ලබා ගැනීමට අයිතියක් නොතිබුණි. දිවා ආහාර සඳහා වූ විවේකය පැය භාගයකට සීමා විය (ජයකොඩි සහ ගුණතිලක, 1988). ඔවුන් විසින් දිගු දින වැඩකරන ලදී. ඇණවුම් ඉහළ මට්ටමක පැවති කාලවල දී අතිකාල වැඩ අනිවාර්ය වූ අතර පැයක නිෂ්පාදන ඉලක්ක අධික විය. 800 ක ශ්‍රම බලකායක් සඳහා වෙන්ව තිබුණේ වැසිකිළි හතරක් පමණයි. මේ මඟින් සේවිකාවන්ගේ වැසිකිළි භාවිතය සීමා කර තිබුණි. ස්ථාවර වැටුප් දින නොතිබූ පොලිටෙක්ස් ආයතනය, වැටුප් මණ්ඩලය විසින් නියම කරන ලද වැටුප්වලට වඩා අඩු වැටුපක් සේවකයින්ට ගෙවන ලදී.

1980 දී පළමු වැඩ වර්ජනයෙන්, පොලිටෙක්ස්හි කම්කරු කාන්තාවෝ තම වෘත්තීය සමිති නායකත්වය අත්හිටුවීමට එරෙහිව සටන් කිරීමටත්

වෘත්තීය සමිතිගත වීමේ අයිතිය ආරක්ෂා කිරීමටත් ශක්තිය සහ අත්දැකීම් ලබා ගත්හ. 1982 දෙසැම්බර් වැඩ වර්ජනයේ යෙදී සිටි කාන්තාවන්ට පොලිසිය විසින් දරුණු ලෙස පහර දී ඔවුන්ගේ ශාඛා වෘත්තීය සමිති නායකයින් වන බන්දු ශාන්ති සහ ලීලා ෆර්ඩිනැන්ඩ්ස් හදිසි නීතිය යටතේ අත්අඩංගුවට ගෙන මහර බන්ධනාගාරයේ රඳවා තබන ලදී.

වැඩ වර්ජනය කළ කාන්තා සේවිකාවන් ස්ත්‍රී මධ්‍යස්ථානය විසින් බලමුලු ගන්වන ලදී. නායකත්වය සිරගත වූ විට, කාන්තා නායිකාවන්ගේ දෙවන ස්ථරයක් ඉදිරියට පැමිණි අතර මෙයින් ප්‍රධාන පිරිස වූයේ පද්මිණී ලියනගේ, හේමා මාතරගේ සහ තවත් කාන්තාවන් දෙදෙනෙකි. දක්ෂ කතිකයෙක් වූ ඔවුන්ගෙන් එක් අයෙක් 'යක් මාලා' ලෙසින් ජනප්‍රිය වූ අතර, 'පොකට් මාලා' ලෙසින් ප්‍රකට වූ අනෙකා සේවය කළේ එකලස් කිරීමේ අංශයේය. මෙම සේවකයින් සංවිධාන ගත කිරීමේ කාර්යයෙහි දී සමන්මලී තීරණාත්මක සාධකයක් වූවාය. ස්ත්‍රී මධ්‍යස්ථානයේ දී රැස් වූ අපි වැඩ වර්ජනය අඛණ්ඩව තබා ගැනීමට උපාය මාර්ග සකස් කළෙමු. කාන්තා සේවිකාවන් 750 දෙනෙකු සඳහා අපි අවට වතුවලින් කොස්, දෙල් සහ පොල් එකතුකොට ඔවුන්ට ආහාර වේල් ලබා දුන්නෙමු. අපි සේවකයින් හා එක්ව වර්ජනය අඛණ්ඩව ගෙන ගිය අතර, ප්‍රදේශයේ ජනතාව, අවට කර්මාන්තශාලාවල කම්කරුවන්, ජාතික මට්ටමේ කාන්තා කණ්ඩායම්, කොළඹ වරාය සේවකයින්, රජයේ ලිපිකරු සේවා සංගමය සහ ලංකා ගුරු සංගමය වැනි අනෙකුත් වෘත්තීය සමිතිවල සහාය ලබා ගත්තෙමු. මෙය පොලිටෙක්ස් සටනට සහාය දෙන පොදු ව්‍යාපාරයක් බවට පත් වුණි. මේ කාලයේ දී ස්ත්‍රී මධ්‍යස්ථානය සහ සමන්ගේ නිවස නිරන්තර සෝදිසියට ලක් වූවා සේම සමන්ට ජීවිත තර්ජනවලින් යුත් මෙම කාර්යය අවදානම් බහුල එකක් විය.

පොලිටෙක්ස් අරගලය සඳහා සහයෝගීතාවය තහවුරු කර ගැනීමේ උත්සාහය තුළ කාන්තා ක්‍රියාකාරීන් පිරිසක් එක්රැස් වූහ. එලෙස සංවිධානය වූ ක්‍රියාකාරීන් විසින් 1982 දෙසැම්බර් මාසයේ දී කාන්තා ක්‍රියාකාරී කමිටුව පිහිටුවා ගන්නා ලදී.

1982 දෙසැම්බර් මාසයේ නත්තලට පෙර පොලිටෙක්ස් අරගලය ජයග්‍රාහී ලෙස නිමා විය. වසර කිහිපයකට පසුව, ප්‍රවීණ වෘත්තීය සමිතිවේදියෙකු සහ සමාජවාදී නායකයෙකු වන බැටී වීරකෝන් සඳහන්

කළේ, "කම්කරු පන්ති සටන්කාමීත්වයේ කොඳු නාරටිය 1980 දී ජේ.ආර්. ජයවර්ධන විසින් බිඳ දැමුව ද ඒකල කාර්මික ජනපදයේ සහ නිදහස් වෙළෙඳ කලාපයේ (කාන්තා) කම්කරුවන් අතරින් වඩාත්ම අනපේක්ෂිත කණ්ඩායම හරහා කම්කරු පන්ති ක්‍රියාකාරිත්වයට නව පණක්" ලැබූ බවයි.

නමුත් සාම්ප්‍රදායික, පීතෘමූලිකත්වය සහිත වෘත්තීය සමිති ව්‍යාපාරය කාන්තාවන් බලමුලු ගන්වන්නේ කෙසේද සහ ඔවුන්ගේ සමාජභාවය පදනම් කරගත් අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දෙන්නේ කෙසේද හෝ ඒවා උපායමාර්ගික ඉල්ලීම් බවට පරිවර්තනය කරන්නේ කෙසේද යන්න පිළිබඳව ව්‍යාපාරයට අවබෝධයක් නොතිබුණි. කාන්තාවන්ගේ ආරක්ෂාව සහ අවශ්‍යතා සම්බන්ධයෙන් වෘත්තීය සමිති සැලකිලිමත් වූයේ නැත. කාන්තාවන් පොදු ස්ථානවල ලිංගික හිරිහැරවලින් ආරක්ෂා කරන මෙන් කළ ඉල්ලීම ඔවුන් භාරගත්තේ නැත. එමෙන්ම කාන්තා සේවිකාවන්ගේ ජීවන තත්වයන් නඟා සිටුවීම මෙන්ම ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය ගැටළු සැලකිල්ලට ගත්තේ නැත. ස්ත්‍රී මධ්‍යස්ථානය සහ ඩාබිඳු සාමූහිකය වැනි සංවිධාන මතු වූයේ මෙම හිඩැස පිරවීමට බව සමන්මලී පැහැදිව අවබෝධ කරගෙන සිටියා ය.

ඒකල කාර්මික ජනපදය තුළත් කටුනායක නිදහස් වෙළෙඳ කලාපය තුළත් සමන්මලීගේ දායකත්වය වර්ධනය විය. සංස්කෘතික වැඩසටහන්, පුස්තකාල, වෛද්‍ය සහ නීති උපදෙස් සායන සංවිධානය කළ අනෙකුත් පිරිස් සමඟ එක්ව ඇය වැඩ කළාය. ඩාබිඳු සාමූහිකය, ස්ත්‍රී අධ්‍යාපනය සහ පුහුණු වීමේ ආයතනය සහ 'කලාපේ අපි', කම්කරු කාන්තාවන්ගේ අයිතිවාසිකම් සඳහා වූ අරගලය ඉස්මතු කිරීමටත් පුළුල් කිරීමටත් අත්පත්‍රිකා සහ පුවත්පත් බෙදා හැරියේ ය. 1985 වන විට, මෙම කණ්ඩායම් වෘත්තීය සමිති සහ කම්කරු සංවිධාන හා එක්ව මහ කොළඹ ආර්ථික කොමිසමට අයත් ප්‍රදේශයන්හි (GCEC) වෙළෙඳ කලාප සහයෝගිතා එකතුව වැනි ජාල පිහිටුවා ගත්හ. ඒ ඔස්සේ කම්කරු අයිතිවාසිකම් මෙන්ම කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ හඬක් මතු කිරීමටත් සමාජභාවය පිළිබඳ ප්‍රශ්න සඳහා සමාජ ව්‍යාපාර සහයෝගිතා ගොඩනැගීමටත් ඔවුන්ට හැකි විය.

1980 දශකයේ මුල් භාගය වන විට අප සියලු දෙනාම "අන්තර් ජනවාර්ගික යුක්තිය සහ සමානාත්මතාවය සඳහා වූ ව්‍යාපාරයේ" (MIRJE) සාමාජිකයෝ ද වූහ. 1977 මහ මැතිවරණයෙන් පසු ඇති වූ ජනවාර්ගික ප්‍රචණ්ඩත්වයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ ජේසු නිකායික පූජ්‍ය පෝල් කැස්පර්ස් විසින් MIRJE සංවිධානය ආරම්භ කරන ලදී. එය වාර්ගික, ආගමික, දේශපාලනික, පන්ති සහ සමාජ පසුබිම්වලින් යුත් විවිධ දේශපාලන සහ සමාජ ක්‍රියාකාරීන්ගෙන් සමන්විත වූ අතර, ඔවුහු ජනවාර්ගික වෙනස්කම් කිරීම්වලට එරෙහිව කටයුතු කිරීමටත් අන්තර් වාර්ගික සාමය සහ යුක්තිය ප්‍රවර්ධනය කිරීමටත් උත්සාහ කළහ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කිරීම සහ වාර්ගික ගැටුමට දේශපාලනිකව සාකච්ඡා කළ විසඳුමක් සඳහා MIRJE සංවිධානය වෙහෙස නොබලා උද්ඝෝෂණය කළේය. සමන් සහ සෝමේ ජා-ඇළ/ඒකල ප්‍රදේශය සඳහා MIRJE හි ශාඛා සංවිධායකයින් වූ අතර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සහ නීති විරෝධී අත්අඩංගුවට ගැනීම්වලට එරෙහිව MIRJE ප්‍රාදේශීය ව්‍යාපාරයන් තුළ ඔවුහු නායකත්වය ගත්හ. 1983 ජනවාර්ගික සංහාරයේදී ඒකල ප්‍රදේශයේ දෙමළ ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීමටත් නිවාස යළි ගොඩනැගීමටත් ඔවුන්ට හැකි වුණි.

මෙම කාල පරිච්ඡේදය තුළ RMP හි මෙන්ම කාන්තා විමුක්ති ව්‍යාපාරයේත් සාමාජිකයින් වූ සමන් සහ මා ඉතා ළඟින් වැඩ කළ අතර ස්ත්‍රී මධ්‍යස්ථානය පිහිටුවීමටත් එය පවත්වාගෙන යාමටත් අපි නායකත්වය ගතිමු. 1984 දී ඇය සහ කුකු රෝසා 'ඩාබිඳු සාමූහිකය' ආරම්භ කළ අතර, මා කාන්තාව සහ මාධ්‍ය සාමූහිකයේ සුනිලා අබේසේකර සමඟ වැඩ කිරීමට එක් වූවාය.

ඒකල කාර්මික ජනපදයේ කම්කරු කාන්තාවන් බලමුලු ගැන්වීමේ සහ වැඩ වර්ජන ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සැලැස්වීමේ අත්දැකීම මගේ දේශපාලන ක්‍රියාකාරිත්වයේ මුල් වසර හැඩගැස්වූවා සේම සමන් මෙම මුල් ගමනේ දී උපදේශකයෙකු සේම අධිෂ්ඨානයෙන් යුතුව වැඩකිරීමට මා වෙත ආශ්වාදයක් ලබා දුන් ආදරණීය මිතුරියකි, සහෝදරියකි.

ඩාබිඳු හි ඇයගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ මට ඇත්තේ සදාකාලික ගෞරවයකි. පසු කාලයේදීත් කාන්තා ක්‍රියාකාරී කමිටුව සහ ලක්ෂ්මි මව්වරු සහ දියණියන් හරහා අපි නිතර සාමූහික ක්‍රියාමාර්ගවල නිරත වීමු. ඇය වසර ගණනාවක් පුරා කාන්තාව සහ මාධ්‍ය සාමූහිකයේ ක්‍රියාකාරීත්වයට වටිනා දායකත්වයක් ලබාදුන් සහෝදරියක වූවාය. ඇය අප සමඟ නිතර නිතර වැඩ වලදී හමු වූ අතර ඇයගේ හාස්‍යජනක කතා අපගේ සන්ධ්‍යාවන් ප්‍රබෝධමත් කළාය. ඇයත් ඩල්සි ද සිල්වාත් සමකාලීන කාන්තා ව්‍යාපාරයේ "නරක හැසිරීම් ඇති ආච්චිලා" (Badly Behaved Achchies) යන නමින් ආදරයෙන් සැලකුම් ලද දෙදෙනෙකි.

සමන්මලීගේ ජීවිතයේ විශාල සහ බලවත් අභිමානය, ඇගේ දරුවන්ගේ ජීවිතවලට, විශේෂයෙන්ම චමිලාගේ ජීවිතය තුළ තවත් දිගු කලක් පවතිනු ඇත. එය කිසි කලෙක මතකයෙන් මැකී නොයනු ඇත. එය ආදරණීය සමන්මලී සහෝදරිය සතු ධෛර්යය සහ කැපවීමේ ගුණය මතු පරපුර වෙත දායාද කිරීමකි.

**කුමුදුනී සැමුවෙල්**
අධ්‍යක්ෂක, වැඩසටහන් සහ පර්යේෂණ
කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය,
56/1, සරසවි මාවත, කාසල් වීදිය,
කොළඹ 08.

# හැඳින්වීම

මෙහි එන්නේ එච්. අයි. සමන්මලී සහෝදරිය විසින් ඇගේ මතක ආවර්ජනය කරමින් වරින් වර ලියන ලද සටහන් කිහිපයක එකතුවක් සහ ඇගේ කාලීන සටන් සගයින් විසින් ලියන ලද කෙටි සටහන්වල එකතුවකි. ඩාබිඳු සාමූහිකයේ නිර්මාතෘවරියක වූ ඇය සිය ජීවිතයේ වැඩිම කාලයක් වැය කරනු ලැබුවේ කම්කරු අයිතිවාසිකම් දිනා ගැනීමේ අරගලය වෙනුවෙනි. මෙහි දී විශේෂයෙන් කම්කරු කාන්තාවන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීමේ අරගලය අත්නොහැරි ඇය ඒ ඔස්සේ ලාංකීය වෘත්තීය සටන් ඉතිහාසයට නව මානයක් සහ ජීවයක් ගෙන ඒමට සමත් වූවාය. 1982 වසරේ දී සිය වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නැගූ පොලිටෙක්ස් කම්කරු කාන්තාවන්ගේ සටන ජයග්‍රාහී මාවතක් කරා ගෙනයාමට නායකත්වය දුන් පිරිස අතර ඇය පෙරමුණෙහිම සිටි සහෝදරියකි. ඇගේ ජිවිතයේ භද්‍ර යෞවනය ගෙවුණේ මහ මග සටන් සහ උද්ඝෝෂණ වෙනුවෙන්ය. පුවත්පත් සහ අත්පත්‍රිකා ඔසවාගෙන නේවාසිකාගාරයක් ගානේ ගිනි මද්දහනේ ඇවිදිමින් කම්කරු කාන්තාවන් අතර ඒවා බෙදා දෙමින් ඔවුනට කියවීමේ පහසුකම් සම්පාදනය කරමින් ය. සෞඛ්‍ය සායන මෙන්ම සංස්කෘතික වැඩසටහන් සංවිධානය කරමින් ය.

ඇඟළුම් ක්ෂේත්‍රයේ කාන්තා සේවකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් සේම කාන්තාවන් ලෙසින් සිය සේවා ස්ථානයේ දී, මහ මගදී, නේවාසිකාගාරවලදී පොදු ප්‍රවාහනයේදී ඔවුන් මුහුණ දෙනු ලබන හිංසනය සහ ප්‍රචණ්ඩත්වයට එරෙහිව ඇය, ඇගේ පෑන මෙහෙයවූවා සේම සුවිශාල ක්‍රියාකාරී වැඩකොටසක් වෙනුවෙන් ද නායකත්වය ගත්තාය. සටන් මෙහෙය වූවාය. රාජ්‍ය මර්දනයට සහ අභියෝගවලට මුහුණ දෙමින් අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව කටයුතු කිරීමට ඇය සමත් වූවා පමණක් නොව නිදහස් වෙළඳ කලාපය ආශ්‍රිත කම්කරුවන්ගේ ප්‍රශ්න සහ ඉල්ලීම් කෙරෙහි ජාතික මෙන්ම ගෝලීය තලයේ අවධානය යොමු කිරීමේ කාර්යයන්හි ද නිරත වූවාය. ජාතික මට්ටමේ සහයෝගීතා, සන්ධාන ගොඩනගා ගනිමින් ජාත්‍යන්තර සහයෝගීතා ව්‍යාපාර සමඟ ඒකාබද්ධ වෙමින් සාමූහික ක්‍රියාවලියක් ඔස්සේ සිදුකරන ලද උද්දේශන සහ උද්ඝෝෂණ බොහොමයක් මඟින් සාර්ථක ප්‍රතිඵල අත්කර දෙන ලදී. මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු එක් කාරණයක් වන්නේ සන්නාම පිළිබඳ චර්යාධර්ම මාලා සකස් කිරීමේ කාර්යය උදෙසා ජාත්‍යන්තර මට්ටමින් සහයෝගීතාවය වර්ධනය කරගනිමින් ඇය විසින් සිදුකරන ලද ක්‍රියාකාරී වැඩ කොටසයි.

ආන්තීකරණයට ලක් වූ, හුදෙකලා වූ විවිධාකාර උප සංස්කෘතීන් හමුවේ වෙනස්කොට සැලකීම් වලට භාජනය වන බිම් මට්ටමේ කම්කරු ප්‍රජාවගේ වෘත්තීය අයිතීන්, ප්‍රජනන සහ සෞඛ්‍ය අයිතීන් වෙනුවෙන් පෙනී සිටි සමන්මලී සහෝදරිය එම අයිතීන් සුරක්ෂිත කිරීමට වෙහෙස දැරුවාය. එමෙන්ම සූරාකෑමෙන් තොර පුහුණු ශ්‍රමයේ අවශ්‍යතාවය පෙන්වා දීමට ගනු ලැබූ සාමූහික උත්සාහයන් තුළ ක්‍රියාකාරී වූ ඇය ඒ සම්බන්ධයෙන් දිගුකාලීන ක්‍රියාමාර්ග ගැනීමේ උවමනාවන් කෙරෙහි පාලක පංතියේ අවධානය යොමු කිරීමට ද වෙහෙසුණි. සාමය සහ සමානාත්මතාවය වෙනුවෙන් වූ අසීමිත කැපවීම සිය ජීවිතයේ අනිවාර්ය අංගයක් ලෙසින් බාරගත් සමන්මලී සහෝදරිය භාවිතාවෙන්ම ඒ බව ඔප්පු කිරීමට සමත් වූ ගැහැණියකි.

තරුණ පිරිස් සමඟ වැඩකරමින්, ඔවුන්ට දැනුම ලබාදෙමින්, අවස්ථා නිර්මාණය කරමින් දෙවන පෙළ නායකත්වයක් ගොඩනගන්නට වෙර දරූ ඇය, ඒ තරුණ ප්‍රජාව නායකත්වය ගෙන වැඩකරන දෙස බලා

සිටින්නේ ඉමහත් සතුටිනි. ස්ත්‍රී මධ්‍යස්ථානය සේම ඩාබිඳු සාමූහිකය ගොඩනැගීමෙහි ලා පුරෝගාමී වූ සමන්මලී සහෝදරිය පුරා දශක හතරකට වැඩි කාලයක් සිය ජීවිතය කැපකරනු ලැබුවේ කම්කරුවන්ගේ අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙනි. ඩාබිඳු පුවත් පත දශක හතරකට අධික කාලයක් පුරා පවත්වාගෙන යාමේ වීරවරිය ඇයයි.

පීතෘමූලික සමාජයෙහි පුරුෂයින් විසින් දරනු ලබන ආධිපත්‍යයට අභියෝග කරන්නට සමත් වූ ඇය, පුරුෂයින්ගේ ආධිපත්‍යයෙන් මිදී වැඩ කිරීමෙහි විකල්පය ලෙසින් තෝරා ගත්තේ කාන්තාවන්ගේ සැබෑ නායකත්වයෙන් යුත් කාන්තා සංවිධානයක් ගොඩනැගීමයි. ඇය සිය ජීවිතයට සේ ආදරය කරමින් ගොඩනැගූ ඩාබිඳු සාමූහිකය අද වන විට කම්කරු කාන්තාවන්ගේ මෙන්ම සමස්ත කම්කරු පංතියෙහිම අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නඟන, විදීයට බසින රටේ ප්‍රමුඛතම සංවිධානයකි. ඒ බව අප මෙහි සඳහන් කරන්නේ නිහතමානී ආඩම්බරයකින් යුතුවය.

සමන්මලී සහෝදරිය ඇතුළු අතීත නායිකාවන් එක්ව දල්වනු ලැබූ පහන් ටැඹෙහි ආලෝකය දිගේ අපි ගමන් කරමින් සිටිමු. ඔවුහු, අයිතිවාසිකම් දිනාගැනීමේ දිගු ගමනේ, ධාවනයේ බැටන් එක අප වෙතට දී ඇත. අපි එය වැටෙන්නට නොදී ජයග්‍රහණය කරා ගෙන යන්නෙමු. සමන්මලී සහෝදරියගේ කැපවීම, ශක්තිය සහ ධෛර්යය පිළිබඳව ඇගේ මතක ආවර්ජනය කරන මෙම කෘතිය සම්පාදනයෙහිලා වෙහෙස වූ සැමට අපගේ කෘතඥතාවය පළකරමු. විශේෂයෙන් මෙහි පෙරවදන ලියූ කුමුදුනී සැමුවෙල් සහෝදරියටත්, විශේෂ සටහන් ලියූ බ්‍රිටෝ ප්‍රනාන්දු සහෝදරයාටත්, ජයනි ප්‍රනාන්දු, වයලා අබේගුණවර්ධන, මාලා රත්නශීලී, චාරුණී ගමගේ සහ මෙහි පසු සටහන ලියූ චමිලා තුෂාරි සහෝදරියටත්, ඉතාමත් කැප වීමකින් යුතුව සංස්කරණ කටයුතු කරමින් සහාය වූ සුමිකා පෙරේරා සහෝදරියටත් කවර නිර්මාණය, පිටු සැකැසුම් සහ මුද්‍රණ කටයුතු සිදු කළ ප්‍රසාද් චනදිමාල් සහෝදරයාටත් බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමු.

**ඩාබිඳු සාමූහිකය,**
නො. 221, වෙළබඩ පාර, කටුනායක.
දුර : 011 4 851 383
2025 ඔක්තෝබර් 05 දින දීය.

# කම්කරු සටන් සහ මාගේ සමාජ ජීවිතයේ ආරම්භය

වසර 40 ක් වූ මාගේ සමාජ ජීවිතය තුළ මෙන්ම පෞද්ගලික ජීවිතය තුළ ද මා අත්දුටු විවිධාකාර වූ අත්දැකීම් එකින් එක සිහිපත් කරමි. පැමිණි මග දෙස ආපසු හැරී බලමි.

මා උපන්නේ දරු හත් දෙනෙකු ගෙන් යුතු පවුලක තුන් වැන්නා ලෙසිනි. මාගේ දෙමාපියන් කැළණිය, ගෝනවල පදිංචිකරුවන් විය. අප කුඩා කළ හැදී වැඩුනේ ගෝනවල ප්‍රදේශයේයි. මා ඉගෙනීම ලැබුවේ කැළණියේ ධර්මාලෝක විද්‍යාලයෙනි. කුඩා වයසේ සිටම පවුලෙන් වෙන්ව මිත්තණියගේ ඇසුරෙහි හැදී වැඩුණු මා, ජීවිතයේ මුල් අවධිය ගත කරනු ලැබුවේ කැළණිය, සිංහාරමුල්ල ප්‍රදේශයේයි. විශාල රබර් වතුවල නිදහසේ ඇවිදීම සහ කැළණි ගඟේ දිය නාන්නට යාම එකල මාගේ ප්‍රධාන විනෝදාංශයන් වී තිබුණි. නිවසේ ඇති කළ කතා කරන සුරතල් මයිනකු පිළිබඳ සුන්දර සිදුවීම් තවමත් මාගේ මතකයන් අතර ඇත.

1969 වසරේදී පී.කේ සෝමපාල සමඟ යුගදිවි ආරම්භ කරන්නේ ප්‍රේම සබඳතාවයක ප්‍රතිඵලයක් ලෙසිනි. අප දෙදෙනා එවකට ජීවත් වූ මාගේ උපන් ගම වන කැළණිය ප්‍රදේශයෙන් ජා-ඇළ කුඩහකපොල ප්‍රදේශයට පදිංචියට පැමිණෙන්නේ 1971 වසරේදී ය. එයට හේතු වූයේ ඒකල



විවාහපත් සමන්මලී සහෝදරිය සහ සෝමේ සහෝදරයා

කාර්මික ජනපදය තුළ සැමියා සේවය කිරීමයි. ඒ වනවිට පවුලේ දරුවන් හතර දෙනාගෙන් සිටියේ වැඩිමහල් පුතා සහ දියණිය පමණකි. සෙසු දරුවන් දෙදෙනා අපට එකතු වූයේ මේ කුලී නිවසේ ජීවත් වන අවධියේදී යි. මෙම කාලවකවානුව ජීවිතයේ සුවිශේෂී පරිච්ඡේදයක් ලෙසින් හැඳින්විය හැකිය. මන්ද යත් ඒ වනවිට 71 තරුණ කැරැල්ල ආරම්භ වී තිබූ අතර රට තුළ පැවතියේ නොසන්සුන්කාරී, අර්බුදකාරී දේශපාලන තත්ත්වයක් බැවිනි.

සැමියා, සිය වෘත්තීය අරගල ජීවිතය ආරම්භ කරන්නේ එකල කම්කරුවන්ට දරුණු සූරාකෑමකට යටත්ව අයහපත් සේවා පරිසර තත්ත්වයන් යටතේ වැඩ කිරීමට සිදුව තිබීම හේතුවෙනි. ඒකල කාර්මික ජනපදයේ පිහිටි යූනියන් ක්නිටින් නමින් වූ හකෝබා එම්බ්‍රොයිඩර් සහ මැන්ටල් නිෂ්පාදනය කරන ලද කර්මාන්ත ශාලාවක ආරක්ෂක නිලධාරියෙකු වශයෙන් එවකට ඔහු සේවය කළේය.

මෙහිදී ඔහු තමන් වෙනුවෙන් පමණක් නොව සිය සහෝදර සගයින් ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ද පෙනී සිටියේය. හඬ නැගුවේය. මෙහි ප්‍රතිඵලයක් ලෙසින් යුනියන් ක්නිටින් ආයතනයේ පාලන අධිකාරිය විසින් ඔහු සේවයෙන් පහ කරන ලදී. කුඩා දරුවන් හතර දෙනෙකුත් සමඟ ජීවිතයේ බොහෝ දුෂ්කරතා වලට මුහුණ දෙන්නට අපට සිදු වූයේ මේ සිදුවීමත් සමඟය. අමතර ආදායම් මාර්ග සොයමින් විවිධාකාරයේ ස්වයං ආදායම් උත්පාදන මාර්ගවල නිරත වෙමින් කෙසේ හෝ පවුලේ කටයුතු කළමනාකරණය කරගැනීමට අපට සිදුවිය. මෙහිදී සිය වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් නඩු මගට පිවිසි ඔහු එයින් ජයග්‍රහණය ලැබුවා පමණක් නොව ඉන් නොනැවතී කාර්මික ජනපදය පුරා සේවය කළ කම්කරු සහෝදරයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් ද පෙනී සිටිමින් ඔවුන්ට මග පෙන්නුවේය. එපමණකුත් නොව, ප්‍රබල වෘත්තීය සමිති නායකයකු වූ බාලා තම්පෝ සහෝදරයාගේ නායකත්වයෙන් යුත් ලංකා වෙළඳ සේවක සංගමයේ (CMU) ජා-ඇළ ප්‍රදේශයේ නායකත්වය ගෙන කටයුතු කරන්නට විය.



ඒකාබද්ධ මැයි දින අවස්ථාවක්

මාගේ සැමියාගේ රැකියාව නැතිවී ගියේ කම්කරුවන් වෙනුවෙන් වෘත්තීය සමිති පිහිටුවා ගැනීමට සහ කම්කරු අයිතීන් දිනාගන්නේ කෙසේද යන්න පිළිබඳව කම්කරුවන් දැනුවත් කිරීම සිදු කළ නිසාවෙනි. ඒ වන විට ඔහු විප්ලවීය මාක්ස්වාදී පක්ෂයේ සක්‍රීය සාමාජිකයෙකු ලෙස කටයුතු කළ අතර CMU වෘත්තීය සමිතියේ ප්‍රාදේශීය සංවිධායක සහ මර්ජ් ආයතනයේ ජා-ඇළ ප්‍රදේශයේ ලේකම් ලෙස සේවය කළේය. කම්කරු අයිතිවාසිකම් පිළිබඳව හසල දැනුමක් ලද ඔහු ජාති, ආගම්, කුලභේද වලින් තොරව සියලු දෙනාට සහය වූවා සේම නිවස තුළ කටයුතු වලට ද දායක විය.




වැඩවර්ජනයකට සහය දැක් වූ අවස්ථාවක දී

ඔහුගේ මෙම වෘත්තීය සමිති කටයුතු හේතුවෙන් 1978 වසරේ දී දරුවන් හතර දෙනා ද රැගෙන ඒකල කාර්මික ජනපදය තුළ වූ කුලී නිවසක පදිංචියට යාමට අපට සිදුවිය. මෙම කාල පරාසය වන විට ලංකා වෙළඳ සේවක සංගමයේ සහ විප්ලවීය මාක්ස්වාදී පක්ෂයේ ක්‍රියාකාරීන් කොළඹට ආසන්නව පිහිටි ජා-ඇළ, ඒකල ප්‍රදේශයේ කර්මාන්ත ශාලාවල සේවකයින්ගේ ප්‍රශ්නවලට මැදිහත් වෙමින් ඔවුන් සමඟ යහපත් සම්බන්ධතා ගොඩනගා ගෙන තිබුණි.

ඒකල ප්‍රදේශයේ නිවසට පැමිණීමත් සමඟ සැමියාගේ වෘත්තීය සමිති ක්‍රියාකාරකම් තවදුරටත් පුළුල් වන්නට විය. විශේෂයෙන්, ට්‍රයිකෝට්, කොරුගේටට්, යුනියන් කාබයිට්, මොන්ටා සහ පොලිටෙක්ස් යන කර්මාන්තශාලා ආශ්‍රිතව පැනනැගි වැඩ වර්ජන නිසා සැමියාගේ කාර්ය බහුල වූ සමාජ වැඩ හේතුවෙන් පවුලේ වැඩ සහ දරුවන් පිළිබඳ වැඩි වගකීම මා හට දරන්නට සිදු වුව ද මාගේ ජීවිතයේ හැරවුම් ලක්ෂයක් වූවේ, ඔහුගේ මෙම වෘත්තීය අයිතිවාසිකම් පිළිබඳ ක්‍රියාකාරිත්වයයි. අපගේ නිවස නිරන්තරයෙන්ම කම්කරු අරගල මධ්‍යස්ථානයක් ලෙසට භාවිතා විය. වැඩ වර්ජිත කම්කරු සහෝදරයින් සිය රැස්වීම් සඳහා යොදා ගත්තේ අපගේ නිවසයි. සාකච්ඡා රැස්වීම් සඳහා නියමිත ස්ථානයක් ඔවුන්ට නොවූ හෙයින් ඒ හැම දෙනාටම රැස්වීමේ ඉඩකඩ තිබූ නිදහස් පරිසරයක් අප නිවසේ නිර්මාණය වී තිබුණි.



සෝමේ සහ රංජිත් සහෝදරයා ඒකල වෘත්තීය සමිති සාකච්ඡාවක අතරතුර

1977 මෙරට දේශපාලන ඉතිහාසයේ තවත් එක් සංධිස්ථානයක් සනිටුහන් කරමින් එක්සත් ජාතික පක්ෂය හයෙන් පහක බලය ලබා ගනිමින් රටේ ආණ්ඩුකරණය අතට ගත්තේය. එවකට රට තුළ පැවැති සංවෘත ආර්ථික ප්‍රතිපත්තිය වෙනුවට සම්පූර්ණයෙන් විවෘත කරන ලද ආර්ථික ප්‍රතිපත්තියක් මෙම ආණ්ඩුව විසින් හඳුන්වා දෙන ලදී.

මෙහි ප්‍රතිඵලයක් ලෙසින් විදේශීය ආයෝජන ආරම්භ කිරීමත් සමඟ මහකොළඹ ආර්ථික කොමිසම යටතේ ආයෝජන ප්‍රවර්ධන කලාප (නිදහස් වෙළඳ කලාප) බිහිවීමත් සිදු විය. මෙහි පළමු ආයෝජන කලාපය 1978 වසරේ දී කටුනායක ප්‍රදේශය මුල්කරගෙන ආරම්භ වූවේය. පසුව විදේශ ආයෝජකයින් දිරිගැන්වීම පිණිස යටිතල පහසුකම් සපයමින් රටේ ප්‍රධාන නගර කේන්ද්‍ර කොටගෙන නිදහස් වෙළඳ කලාප ආරම්භ කෙරුණි. මේ හේතුවෙන් ගම්බද විරැකියාවෙන් පෙළුණු තරුණ තරුණියෝ රැකියා සඳහා නගරය කරා සංක්‍රමණය වීමට පටන් ගත්හ. මෙම සංක්‍රමණිකයින් ගෙන් බහුතරය වූයේ තරුණ කාන්තාවෝය. මේ හේතුවෙන් සැලකිය යුතු කාන්තා ශ්‍රමිකයින් පිරිසක් රටේ ශ්‍රම බලකායට ඇතුළත් වූවා සේම මෙම අභ්‍යන්තර ශ්‍රම සංක්‍රමණික කාන්තාවන්ට විශාල ප්‍රශ්න රාශියකට ද මුහුණ දීමට සිදු විය.



සමන්මලී සහෝදරිය තරුණ කාලයේ දී

# පොලිටෙක්ස් වැඩ වර්ජනය සහ කාන්තා ව්‍යාපාරයේ පිබිදීම

අඩු වැටුප් සහ අසතුටුදායක සේවා තත්ත්වයන්ට එරෙහිව පොලිටෙක්ස් ගාමන්ට් පළමු වර්ජනය 1980 දී ආරම්භ විය. දින 30 ක් පුරා අඛණ්ඩව පැවති වර්ජනයකින් පසුව සිය අයිතිවාසිකම් දිනාගන්නට 800 ක් පමණ වූ කාන්තා කම්කරුවන් සමත් වූවේ, ලංකා වෙළඳ සේවක සංගමයේ මග පෙන්වීම ඔස්සේය. මෙය වෘත්තීය සටන් ඉතිහාසයේ ස්ත්‍රී සලකුණ සනිටුහන් කළ ස්වර්ණමය කම්කරු අරගලයක් ලෙසින් සඳහන් කළ හැකිය.

එවකට ඒකල කාර්මික ජනපදය තුළ පනස් දාහකට අධික කම්කරු පිරිසක් ජීවත් වූ අතර පොලිටෙක්ස් ඇඟළුම් කම්හල තුළ සේවක පිරිසෙන් 95% ක්ම කාන්තාවෝ වූහ. ඔවුන් අඩු වැටුපකට සේවය කළ අතර මෙම ඇඟළුම් කර්මාන්තය අලුත් ක්ෂේත්‍රයක් වූ නිසාවෙන් ද බොහොමයක් පිරිස ග්‍රාමීය පසුබිමකින් පැමිණ තිබූ නිසා ද කම්කරු අයිතිවාසිකම් පිළිබඳව වැඩි දැනුමක් ඔවුන් තුළ නොවීය. ඇතැම් ශ්‍රමිකයින් කම්කරු අයිතිවාසිකම් පිළිබඳව දැන සිටිය ද ඒවා ක්‍රියාත්මක කිරීමට කිසිඳු අවස්ථාවක උත්සාහ ගෙන නැත්තේ ඔවුන්ගේ රැකියාව අහිමි වේ යැයි යන බියෙන් සහ වෘත්තීය අයිතිවාසිකම් සඳහා වන කටයුතු රාජ්‍ය ද්‍රෝහී ක්‍රියාවන් ලෙසින් හඳුන්වනු ලබන තත්ත්වයක් රට තුළ

පැවැති බැවිනි. ඔවුන් බොහෝ විට සටන් කරනු ලැබුවේ, උද්ඝෝෂණය කරනු ලැබුවේ ශ්‍රමයට සරිලන වැටුපක් සහ යහපත් සේවා තත්ත්වයන් ඉල්ලා සිටිමිනි.

පොලිටෙක්ස් වැඩ වර්ජනය අවස්ථාවෙහි දී වෘත්තීය සමිති සහෝදරයින්ට සේම මෙම කම්කරු සහෝදරියන්ට ද ඔවුන්ගේ වැඩ වර්ජිත සමය තුළ රැස්වීමේ පහසුකම් මෙන්ම ආහාර පිසගැනීමේ පහසුකම් අප නිවසේ දී සපයන්නට අපි සමත් වීමු. ඊට හේතු වූයේ ඔවුන්ට තරමක් ලොකු කෑම වේලක් පිසගැනීමේ හැකියාවක් නොතිබූ නිසාවෙනි. කුඩා මුට්ටියක බතක් පිස එක් ව්‍යාංජනයක් සමඟ සිය ආහාර වේල සකසා ගත් ඔවුනට කල්දේරම්වල කෑම පිසීමට පළපුරුද්දක් නොතිබුණි. එහෙත් සැමියාගේ සහ මාගේ උපකාර ඇතිව කාන්තා සහ පුරුෂ යන දෙපාර්ශවයේම සහයෝගයෙන් මෙම වැඩ වර්ජිත සමයේ ඔවුන් සඳහා ආහාර පිසින්නට අපට හැකි විය.



වැඩ වර්ජනය කළ කම්කරු ස්ත්‍රීන් අමතන හේමා මාතරගේ සහෝදරිය

විශේෂයෙන්ම නේවාසික ජීවිත ගත කරන කාන්තාවන්ට පෝෂ්‍යදායි ආහාර වේලක් නොලැබුන අතර බොහෝවිට ඔවුන්ගේ බත් පතේ සුලභ වශයෙන් දක්නට ලැබුණේ එක් එළවළුවක් සහ සම්බෝලයක් පමණකි. මෙවැනි පීඩිත තත්ත්වයක් තුළ ජීවත් වූ කම්කරු සහෝදරියන්ගේ ජීවිත මෙම වැඩ වර්ජිත සමය තුළ තව තවත් දුෂ්කර වන්නට විය. මේ කාලයේ දී උදේ පාන්දරින් නැගිට දරු හතරදෙනා ලෑස්ති කර පාසල් යවා සැමියා සමඟ පාපැදියෙන් යන්නේ තුඩැල්ලේ පිහිටා තිබූ පොලිටෙක්ස් වැඩවර්ජන භූමිය වෙතටයි. ඇතැම් දිනවල අප එහි යන විට ළූණු කිලෝ ගණන් කපා මේසයක් මතය. පොල් ගා තවත් මේසයක් මතය. ඒ ඔවුන් දන්නා තරමිය. මාත් මාගේ සැමියාත් එක්වී ලිප් සකසා

පරිප්පු සමඟ බත් උයා ඔවුන්ගේ උදේ සහ දවල් කෑමවේල් සකස් කර දෙන්නෙමු. ඔවුන් උදේ ආහාරය ගෙන දවල් ආහාරය ද රැගෙන පිටත් වන්නේ කැට ව්‍යාපාරයේ යෙදෙමින් වර්ජනයට ප්‍රචාරයක් මෙන්ම මූල්‍ය සහාය සොයා ගැනීම පිණිසය. එමෙන්ම විවිධ ආයතන සහ ප්‍රභූ පිරිස් හමුවී ආධාර උපකාර ලබා ගැනීමට ය.

පොලිටෙක්ස් වැඩ වර්ජනයේ ජයග්‍රහණ සඳහා අප දෙදෙනා (සෝමේ සහ මම) දිවා රෑ නොබලා වෙහෙස වූවෙමු. ස්ත්‍රී අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි අපට පිරිමින්ගේ වෙනස්කොට සැලකීම්වලට භාජනය වීමට ද

කම්කරු කාන්තාවන් ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් කටයුතු කිරීමට ද මේ අතරවාරයේ සිදු විය.

1980 පළමු පොලිටෙක්ස් වැඩ වර්ජනය ජයග්‍රහණය කිරීමෙන් නොනැවතී විවිධ ඉල්ලීම් මුල්කර ගනිමින් දිගින් දිගටම පොලිටෙක්ස් වැඩ වර්ජන ඇති වූ අතර මේ අවධියේ දී වැඩ වර්ජිත කාන්තාවෝ නීති ආධාර සඳහා සහාය පතා අප නිවස තුළ එක්රැස් වන්නට වූහ.



පොලිටෙක්ස් සටන මෙහෙය වූ ලීලා පර්ඩිනන්ඩ්ස් සහෝදරිය, 1984 වැඩවර්ජිත සමයේ පැවැති ස්ත්‍රී දින සැමරුමට එක්වෙමින්

1982 වසරේ දී යළි ආරම්භ වූ පොලිටෙක්ස් වැඩ වර්ජනයේ දී පොලිටෙක්ස් ශාඛා සමිතියේ සභාපති වූ ලීලා ෆර්ඩිනැන්ඩ්ස් සහ බන්දුශාන්ති යන සහෝදරියෝ පොලිස් අත්අඩංගුවට පත්වූහ. දිගින් දිගටම සිදු වූ වැඩ වර්ජන හේතුවෙන් ස්ත්‍රී මධ්‍යස්ථානයට මූල්‍යමය වශයෙන් මහත් අභියෝග වලට මුහුණ පෑමට සිදු විය. එනිසා විවිධ උපක්‍රම යොදා මුදල් සෙවීම සඳහා කටයුතු කළ අතර කැට ව්‍යාපාරයන්හි යෙදීම ද නත්තල් සමයේ කැරොල් නාට්‍ය රඟ දැක්වීම ද මෙයින් ප්‍රධාන තැනක් ගනු ලැබිණි. ඊට මාගේ පවුලේ සියලු දෙනා සිය දායකත්වය දැක්වූහ. එය නත්තල් සමය නිසා කැරොල් එකක් යාමට ලෑස්ති කළෙමු. අපගේ වැඩිමහල් දියණිය මරියතුමිය ලෙසත් ලොකු පුතා

ජුසේ තුමා ලෙසත් දෙවෙනි දියණිය එඬේරකු ලෙසත් බාල පුතා බැටළුවකු ලෙසත් රඟපාමින් එයට එක්විය. ත්‍රිපෝෂ ශාඛාවේ වැඩ වර්ජනයේ දී සිටි පිරිසෙන් තුන්දෙනෙකු රජ තුන් කට්ටුව සඳහා රඟපෑ අතර තුඩැල්ලේ සිට කපුවත්ත වන තෙක් රාත්‍රී හතේ සිට දොළහ පමණ වනතුරුම ගෙයින් ගෙට ගොස් කැරොල් පෙන්වා ආධාර මුදල් එකතු කළෙමු. ඉන්පසු ඒ රාත්‍රියේම සැමියා සමඟ අප සියළු දෙනා පා පැදියෙන් තුඩැල්ලේ සිට ඒකල පිහිටි අපගේ නිවසට පැමිණියේ පසු දින උදෑසනම දරුවන් පාසල් යැවීමට තිබූ බැවිනි. සැමියා බයිසිකලය පැදවූ අතර මා බයිසිකල් බාර් එකේ ද දුවලා දෙන්නා පිටුපස ලගේජ් එකේ ද ලොකු පුතා බයිසිකලය පිටුපස ෆ්‍රීවීල් එකේ කකුල් දෙක තබාගෙන ද අනෙක් පුතා හැඩල් එක උඩ ද තබාගෙන ඔහුව තදින් බදාගෙන, අප හය දෙනාම නිවස වෙත එන්නට වීමු. ඒ එන මග වලවල් වලට වැටී හැඬලය මත හිඳ සිටි දරුවා වැටෙන්නට යන විට ඔහුව තදින් අල්ලාගෙන බයිසිකලය නවත්වා ගත්තේ ඉතා අසීරුවෙනි. මෙය මට කිසි දිනක අමතක නොවන දිනයකි. එම වැඩසටහනින් ලද ආධාර ත්‍රිපෝෂ කම්හලේ වැඩ වර්ජනයේ නියුතුව සිටි කම්කරු සහෝදරයින් සඳහා ලබා දුන්නෙමු.


වැඩ වර්ජනය කළ පොලිටෙක්ස් කම්කරු ස්ත්‍රීන්

# කම්කරු සටන් වලින් ඔබ්බට ස්ත්‍රීන්ගේ පෙළගැස්ම

විප්ලවීය මාක්ස්වාදී පක්ෂයට සම්බන්ධව 1980 දී පමණ පිහිටුවා ගෙන තිබූ ස්ත්‍රී විමුක්ති ව්‍යාපාරයේ ක්‍රියාකාරිනියන් කිහිපදෙනකු අප නිවසට පැමිණෙන්නේ ඒකල කාර්මික ජනපදයේ කාන්තා කම්කරුවන්ගේ සුවිශේෂ ප්‍රශ්න සාකච්ඡා කිරීමටය. පසුව දිගින් දිගට ඇති වූ පොලිටෙක්ස් වැඩ වර්ජන වලට නායකත්වය දුන්නේ කුමුදිනී රෝසා, පිලමිනා ද සිල්වා, මාලා රත්නශීලි, කුමුදුනී සැමුවෙල්, සහ මා ද ඇතුළත් වූ ස්ත්‍රී විමුක්ති ව්‍යාපාරය යි. එමෙන්ම 1982 දී, ස්ත්‍රී විමුක්ති ව්‍යාපාරයේ මග පෙන්වීම ඇතිව අප එක්ව තුඩැල්ල, ජා-ඇළ ප්‍රදේශයේ ස්ත්‍රී මධ්‍යස්ථානය නමින් නව කාන්තා සංවිධානයක් ස්ථාපනය කළෙමු. පසුව මෙය පොලිටෙක්ස් අරගලයට ශක්තිය ලබා දුන් ප්‍රධාන සංවිධානය බවට පත් විය. පොලිටෙක්ස් ගාමන්ට් හා ඒකල ප්‍රදේශයේ සේවය කළ ස්ත්‍රී කම්කරුවෝ තම කම්හල් තුළ සිදුවන අයුක්තිය, අසාධාරණය, සේවයෙන් පහකිරීම යනාදී ප්‍රශ්න ගණනාවකට විසඳුම් ලබා ගැනීම සඳහා අප මධ්‍යස්ථානයට පැමිණි අතර එසේ එක්රොක් වූ කම්කරු ස්ත්‍රීන්ට, ස්ත්‍රී මධ්‍යස්ථාන භූමිය සිය වෘත්තීය සටන් සඳහා සහාය සැලසූ මහා ක්ෂේම භූමියක් විය.



පොලිටෙක්ස් සටනට පොදුජන සහාය - තුඩැල්ල ස්ත්‍රී මධ්‍යස්ථානය ඉදිරිපිට දී

කාන්තාවන් ද මනුෂ්‍යයින් ලෙසින් සමානව සැලකුම් ලැබිය යුතු ජන කොටසක්ය යන මතවාදය සම්බන්ධයෙන් පළමුවෙන්ම සිතන්නට මා පෙළඹුනේ කුඩා කණ්ඩායමක් ලෙසින් අප කාන්තාවන් පිරිසක් එකතු වී වරින් වර කරන ලද කතා බහ සමඟිනි. මේ දැනුවත්වීම් සහ ක්‍රියාකාරිත්වයන් ඔස්සේ කම්කරු කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් ක්‍රියාකාරී වෙමින් ජා-ඇළ ස්ත්‍රී මධ්‍යස්ථානය ගොඩනැගීමෙහි ලා කැපවීමට මා වෙත ශක්තිය ලැබෙන්නේ මෙම කුඩා කණ්ඩායම් සාකච්ඡා වලින් ලද දැනුම සහ අවබෝධය තුළිනි.

කුමුදුනී සැමුවෙල්, මාලා රත්නශීලී, පිලමිනා ද සිල්වා සහ මා ස්ත්‍රී මධ්‍යස්ථානයේ පූර්ණකාලීන ක්‍රියාකාරීන් ලෙසින් සේවය කළ අතර කුමුදිනී රෝසා සහෝදරිය විදේශීය සංවිධානවලින් සහ පුද්ගලයින් වෙතින් පොලිටෙක්ස් වැඩ වර්ජනයට මුදල් ආධාර සොයා ගැනීමට සමත් වූවාය. එම ආධාර මුදල් වලින් වර්ජනයේ යෙදී සිටින කම්කරුවන්ට උදේ, දවල් සහ රාත්‍රී ආහාර ලබා දුන් අතර ඇතැම් දෙනෙකුට ගමන් වියදම් සහ බෝඩිම් කුලිය ද ලබා දුන්නේ වැඩ වර්ජනය සාර්ථක කර ගැනීමට එම ධෛර්ය දීම් අත්‍යාවශ්‍ය වූ බැවිනි. එසේම ඇය, අයිතිවාසිකම් සම්බන්ධයෙන් අප දැනුවත් කරමින් කාන්තා අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර අත්දැකීම් අප සමඟ බෙදා ගැනීමට කටයුතු කිරීම අපගේ වෘත්තීය අරගල ගමනට මහත් රුකුලක් විය.



මෙයට අමතරව ස්ත්‍රී විමුක්ති ව්‍යාපාරය විසින් කර්මාන්තශාලාවල කාන්තාවන් සමඟ සම්බන්ධතා ඇතිකර ගනිමින් කාන්තා අධ්‍යයන කව සංවිධානය කිරීමට පටන් ගන්නා ලදී. මේවායෙහි දී අපි, ඇඟළුම් කර්මාන්තය තුළ කාන්තා කම්කරුවන් මුහුණ දෙන ශ්‍රම සූරාකෑම, කාන්තා අයිතිවාසිකම් කඩවීම යනාදී වශයෙන් වූ විවිධ තේමාවන් ඔස්සේ කම්කරු කාන්තාවන්ගේ අවබෝධය ඉහළ නංවාගැනීමේ කුඩා සාකච්ඡා පැවැත් වූ වෙමු. මෙම අධ්‍යයන වැඩසටහන් ඊකල, ජා-ඇළ, යාපනය, රත්මලාන සහ නාවලපිටිය යන ප්‍රදේශ දක්වා පැතිරුණි.

1982 දෙසැම්බර් මාසය වනවිට පොලිටෙක්ස් අරගලය යළිත් උත්සන්න විය. මෙවර පොලිටෙක්ස් කාන්තා කම්කරු වැඩ වර්ජනය, පුරා මසකට අධික කාලයක් පැවැති අතර ඉතා දැඩි මර්දනකාරී තත්ත්වයන්ට මුහුණ දීමට එයට නායකත්වය ගත් කම්කරු කාන්තාවන්ට සිදු විය. මැරවරයින්ගේ සහ පොලිසියේ පහරදීම්වලට ලක්වීමට මෙම කම්කරු ස්ත්‍රීන්ට සිදු වූ අතර සැලසුම් සහගත ලෙස වර්ජනය කඩාකප්පල් කිරීමට එවකට පැවැති ආණ්ඩුවේ වෘත්තීය සමිති විසින් ගත් උත්සාහයන් ව්‍යර්ථ කිරීමට අපි සමත්වීමු. 1983 ජනවාරි 13 වන දින සියළු ඉල්ලීම් දිනා ගනිමින් අතිසාර්ථක ලෙසින් වැඩ වර්ජනය අවසන් කිරීමට පොලිටෙක්ස් කාන්තා කම්කරුවෝ සමත් වූහ. මෙහි දී පොලිටෙක්ස් කර්මාන්තශාලාව ආශ්‍රිතව වෘත්තීය සංගමයක් පිහිටුවීමේ අයිතිවාසිකම ද ඔවුහු දිනා ගත්හ. මෙම ජයග්‍රහණය බන්දේසියක තබා ලැබුණක් නොව බොහෝ පිරිසක් සිය ජීවිත පරදුවට තබා කළ කැප කිරීම්වල ප්‍රතිඵලයක්

ලෙසින් දිනා ගත්තකි. මෙම පිරිස අතර සිටි ලීලා ෆර්ඩිනැන්ඩිස්, බන්දුශාන්ති, පද්මිණී ලියනගේ, මල්ලිකා සේනාරත්න සහ හේමා මාතරගේ යන කම්කරු සහෝදරියන්ගේ කැපවීම අතිමහත්ය. සැබැවින්ම මෙම වැඩ වර්ජනය ජයග්‍රහණය කිරීමට සමත් වූයේ, කාන්තා ක්‍රියාකාරීන් සහ ස්වාධීන කාන්තා සංවිධානවල සබඳතා ජාලයක් ඔස්සේ ගොඩනැගුණු කාන්තා ක්‍රියාකාරී කමිටුව සහ ස්ත්‍රී විමුක්ති ව්‍යාපාරය සමඟ බිහි වූ ජා-ඇළ ස්ත්‍රී මධ්‍යස්ථානයේ නායකත්වය සහ කැපවීම හේතුකොට ගෙනය. කාන්තා සංවිධාන ගණනාවක් සහ ස්වාධීන කාන්තා ක්‍රියාකාරීන් පිරිසක් ඇතුළත් වූ මෙම කාන්තා ජාලයට, ස්ත්‍රී මධ්‍යස්ථානය, ප්‍රගතිශීලී කාන්තා පෙරමුණ, හැටන් කාන්තා කමිටුව, මාළඹේ ප්‍රජා අධ්‍යාපන මධ්‍යස්ථානය, කාන්තා හඬ, මීගමු කාන්තා කමිටුව, ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ කාන්තා අංශය, කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය (නිල වශයෙන් පිහිටුවීමට පෙර) යනාදී සංවිධාන ගණනාවක් ඇතුලත් විය.

ස්ත්‍රී මධ්‍යස්ථානය දිගින් දිගටම පොලිටෙක්ස් අරගලය සමඟ බද්ධ වෙමින් පොලිටෙක්ස් වෘත්තීය සමිතියට විශාල ශක්තියක් ගෙනදුන් ආයතනයක් බවට පත් වූ අතර විශාල ජන සහයෝගයක් ලබා ගැනීමට මෙම පොලිටෙක්ස් කාන්තා කම්කරු අරගලය සමත් විය. විශේෂයෙන් වර්ජනය ජය ගැනීමෙන් පසුව එය සැමරීම පිණිස නන්දා මාලනීය ගේ "සත්‍යයේ ගීතය ප්‍රසංගය" වැල්ලවත්ත, රාමක්‍රිෂ්ණා ශාලාවේ දී පැවැත්වීම මෙයට එක් උදාහරණයකි.

මේ සියලුම කර්යයන්ට මා සහාය වූයේ, නිවසේ වැඩ කටයුතු සහ දරුවන් හතර දෙනෙකුගේ කටයුතු වෙනුවෙන් ඉතාමත් කාර්ය බහුල ජීවිතයක් ගෙවන අතරතුරය. උදෑසන දරුවන් පාසැල් යැවීමට සූදානම් කිරීම, දරුවන්ට දිවා ආහාරය සකසා රෙදි පෙරෙදි සෝදා නිවසේ කටයුතු කිරීම ඇතුළු නිවසේ සියලු වැඩ කටයුතු සිදු කිරීම මා වෙත පැවරී තිබූ කාර්යයන් විය. දිනපතාම පාහේ අවට ඇති ආයතනවල වැඩකරන වර්ජිත සේවක සහෝදරයින්ට කෑම පාර්සල් සකස්කොට දිය යුතුව තිබුණේ ගෙදර දොර අනේක විද වැඩ කටයුතු මධ්‍යයේයි. ඇතැම්විට ඒ සියලු වැඩවල බර මා හට තනියම දරන්නට සිදු වූයේ මාගේ සැමියා ද කම්කරු අයිතීන් දිනා ගැනීම උදෙසා සිදු කරනු ලබන දැවැන්ත වෘත්තීය සමිති ව්‍යාපාරයට සක්‍රීය දායකත්වයක් ලබාදෙමින් සිටි නිසාවෙනි. ඇතැම් දිනවල රාත්‍රි කාලයේ ඔහු නිවසට පැමිණෙන්නේ පාප්ප බාල්දියක් ද පෝස්ටර් මිටියක් ද රැගෙන ය.





පොලිටෙක්ස් සහ මොන්ටා යන ආයතනවල සේවිකාවන්ට කම්කරු අයිතිවාසිකම් මෙන්ම කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් පුළුල් දැනුමක් ලබාදීම පිණිස, විප්ලවීය මාක්ස්වාදී මතවාදයන් ඔස්සේ යමින් වැඩ කළ කුමුදුනී සැමුවෙල් සහ කුමුදිනී රෝසා සහෝදරියන් විසින් පුරෝගාමී වැඩ කොටසක් ඉටු කරන ලදී. අප නිවස නිරන්තරයෙන්ම, කාන්තා අයිතිවාසිකම් සහ කම්කරු අයිතිවාසිකම් පිළිබඳව මෙන්ම

අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නැඟීමට වෘත්තීය සමිතියක් ගොඩනගා ගන්නේ කෙසේද යන්න පිළිබඳව වන සාකච්ඡා පැවැත් වූ ස්ථානයක් බවට පත් වුණි. මේ ඔස්සේ කම්කරු සහෝදරියෝ ඔවුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුවත් වූහ. එහිදී කම්කරු කාන්තා අයිතිවාසිකම් පිළිබඳව දැනුම ලබා ගැනීමට මා හට ද මහඟු අවස්ථාවක් හිමි විය. කම්කරු කාන්තාවන් මුහුණ දෙන සුවිශේෂී ප්‍රශ්න සහ ඔවුන්ගේ අයිතිවාසිකම් දිනාගැනීම සම්බන්ධයෙන් මා තුළ වූ උනන්දුව වර්ධනය කිරීමට මේ සාකච්ඡා සහ හමුවීම් බොහෝ සේ සමත් විය. කම්කරු කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පූර්ණකාලීනව කැපවීමට මා හට අවස්ථාව සැලසෙතැයි හෝ එසේ කිරීමට හැකිවේයැයි මම කිසිසේත්ම අපේක්ෂා නොකළෙමි. එහෙත් පසුකලෙක ඒ සඳහා කැපවීමට සිදුවීම සහ එවන් අවස්ථාවක් ලැබීම ජීවිතයේ මා ලද සුවිශේෂ භාග්‍යයක් සහ අභියෝගයක් යැයි මට සිතේ.

මන්ද යත්, මා කුඩා කල හැදී වැඩුනේ ඉතා බරපතල ලෙසින් පීතෘ මූලිකත්වය මුල්බැසගත් සමාජ පරිසරයක වීමයි. මාගේ සීයා, ඔහුගේ පුරුෂාධිපත්‍යයික ගතිගුණ පතුරවාගෙන නිවසේ කටයුතු කළ අයුරු මට දැනුදු සිහිපත් වේ. සීයා නිදා සිටින ඇඳ ළඟින් හයියෙන් අඩි තබා යාමටවත් නිවස තුළ හයියෙන් කෑ කෝ ගැසීමටවත් කුඩා අවදියේ දී අපට අවසර නොවීය. රෑ වැඩ ඇරී නිවසට පැමිණෙන තාත්තා වෙනුවෙන් දොර විවෘත කරන්නේ ද සීයාය. එවිට සීයා තාත්තාට ද පවසා සිටින්නේ රෑ බෝවී නිවසට නොපැමිණ වේලාසන එන ලෙසයි. එනම් තාත්තාගේ චර්යාවන් පවා පාලනය කිරීමට සීයාට බලතල තිබුණි.

“උඹ ගෑණු ළමයෙක් නේද ගෙදර වැඩක් බලාගෙන ඉඳපන් ”එකල මා පිරිමි ළමයින් සමඟ සෙල්ලම් කිරීමට යාම ආච්චිටත් සීයාටත් නොරිස්සුවේ පැරණි සාම්ප්‍රදායික සිරිත් විරිත් කියමන් ඔවුන්ගේ සිත් තුළ පැලපදියම් වී තිබූ නිසාවෙනි. අපේ ආච්චිත් සීයාත් රදළ පවුලක වුවත් කොළඹ පදිංචිව සිටි ඔවුන් සීයාගේ රැකියාව නැති වූ විට නැවත පදිංචියට පැමිණියේ කැළණිය ප්‍රදේශයට ය. එකල මෙම ප්‍රදේශයේ එතරම් වර්ගවාදයක් නොවීය. දමිළ, මුස්ලිම්, බර්ගර් යනාදී සියළු ජාතීන් එකට ජීවත් වූ ප්‍රදේශයක් විය. ආච්චි සහ මගේ අම්මා ඔවුන් ආශ්‍රය කළ බැවින් ඔවුන්ගේ දරුවන් සමඟ කුඩා කාලයේ පටන් එකට හැදී වැඩුණු නිසා අප තුළ ජාති භේදයක් පිළිබඳ අදහසක් නොවීය. එහෙත්

දෙමාපියන්ගේ ඇතැම් සාම්ප්‍රදායික ආකල්ප අනුව ජීවත් වූ මා හට විවාහයෙන් පසු ක්‍රම ක්‍රමයෙන් ඒ ආකල්ප වලින් මිදී වැඩ කරන්නට හැකියාව ලැබුණි. ඒ මාගේ සැමියාගේ වාමාංශික අදහස් සහ ඔහු සාම්ප්‍රදායික ආකල්ප ගතානුගතික සිරිත් විරිත් වලින් මිදී ජීවත් වූ අයෙකු බැවිනි.

මෙලෙස පවුලේ වැඩිහිටියන් සමඟ ඔවුන්ගේ සෙවනේ ජීවත් වන අවදියේ මා දැන සිටියේ කාන්තාවන් පිරිමින්ට යටත්ව ජීවත්විය යුතු බවයි. ගෘහයක දී පුරුෂයින් මුල්තැනෙහි ලා කටයුතු කළ යුතුය යන සමාජ මතවාදය මා තුළත් මුල් බැසගෙන තිබුණි. එහෙයින් මා දැන සිටියේ “සැමියා බිරිඳගේ දෙවියාය” යන වග පමණකි. “පිරිමින්ට අත උස්සන්න හොඳ නෑ”, “පිරිමින් ගෙන් වැඩ ගන්න හොඳ නෑ”, යනාදී සාම්ප්‍රදායික අදහස් සහ ආකල්ප පමණක් දැන සිටි මා වසරින් වසර ලද දරුවන් සිව් දෙනාගේ කටයුතු සහ නිවසේ කටයුතු මෙන්ම ආර්ථිකය ශක්තිමත් කරගැනීම සඳහා සිදුකළ ස්වයං රැකියා නිසා නිදහසක් නොමැති ජිවිතයක් ගතකළ ද මෙම වෘත්තීය සමිති ක්‍රියාකාරකම්, ලෝකය දෙස බලන්නට නව මානයක් මා වෙත ලබාදුණි.





# මානව හිමිකම් සුරැකීම සහ ජනවාර්ගික සාමය උදෙසා

80 දශකයේ ආණ්ඩු පාලනය ඉතා බරපතල මර්දනකාරී පිළිවෙතක් ගෙන යාම හේතුවෙන් වෘත්තීය අයිතිවාසිකම් මෙන්ම මානව අයිතිවාසිකම් ද එකින් එක උල්ලංඝණය වෙමින් පැවැති වකවානුවක මානව හිමිකම් ආරක්ෂා කරගැනීම සඳහා විවිධ සමාජ සංවිධානවල බිහිවීම මේ යුගයෙහි තවත් එක් සුවිශේෂී සංසිද්ධියකි. ස්ත්‍රී විමුක්ති ව්‍යාපාරය සේම, 1979 දී “ජාතීන් අතර යුක්තිය සහ සමානාත්මතාවය සඳහා වූ ව්‍යාපාරය (MIRJE- Moument for Inter-Racial Justice and Equality)” නිල වශයෙන් ආරම්භ වීම මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතු වේ. එම ප්‍රදේශයේ කම්හල්වල සේවය කළ දමිළ කම්කරුවන් මුහුණ දෙන සේවක ප්‍රශ්නවලට මෙම ශාඛාව මැදිහත් විය.

# කම්කරු සටන් තුළ ගොඩනැගුණු උතුරු සහ දකුණු කම්කරු සහයෝගීතාවය

### පළමු යාපන ගමන - පරන්තන්හි වැඩවර්ජකයින්ට සහාය ප්‍රකාශ කිරීම

1981 දී පමණ මේ වන විට පොලිටෙක්ස් ගාමන්ට්, මොන්ටා ගාමන්ට් යන ආයතන තුළ සේවය කළ කාන්තාවන් ද වෙනත් කර්මාන්තශාලා වල සේවය කරන කාන්තාවන් ද අප හා සම්බන්ධ වී සිටි අතර මර්ජ් (MIRGE) සංවිධානය හරහා යාපනයේ පරන්තන් හි වීදුරු කම්හලක සිදු වූ වැඩ වර්ජනයට සහාය පළ කිරීමට ගිය පිරිස සමඟ සම්බන්ධ වීමට මට ද අවස්ථාවක් හිමිවුණි. ඒ වන විටත් උතුරේ සටන්කාමී සංවිධානවල ක්‍රියාකාරිත්වයන් ආරම්භ වී තිබුණු බැවින් මාගේ දෙමව්පියන් මා එහි යනවාට අකමැති වූයේ දරුවන් හතරදෙනා ද කැටුව යාමට සැලසුම් කර තිබීම හේතුවෙනි. කෙසේ වෙතත් දරුවන් බලාගැනීම සඳහා මාගේ මව එකඟ කරගෙන මා පමණක් එම ගමනට එකතුවීමට අවසානයේදී තීරණය කළෙමි. එමෙන්ම (CMU) වෘත්තීය සමිති ශාඛාවක් වන යුනියන් කාබයිඩ් ආයතනයේ සහ පොලිටෙක්ස් ගාමන්ට් ආයතනයේ සේවය කරන කම්කරු ස්ත්‍රීන් අප සමඟ පරන්තන් වීදුරු කම්හලේ කම්කරු සේවකයින්ගේ වැඩ වර්ජනයට සහාය දැක්වීම සඳහා යාමට කැමති විය. එහෙයින් සියල්ලෝම යාපනය බලා ධාවනය වන යාල්දේවී දුම්රියෙන් රාත්‍රියේ පරන්තන් බලා පිටත් වූහ.

අප සමඟ මෙම ගමන සඳහා යුනියන් කාබයිඩ් ආයතනයේ සේවය කළ කේ. ආර්. ප්‍රනාන්දු, නෙල්සන්, වික්‍රම් යන සහෝදරවරු මෙන්ම පොලිටෙක්ස් ආයතනයේ සේවය කළ වෘත්තීය සමිති නායිකා බන්දු ශාන්ති, ලීලා ෆර්ඩිනැන්ඩ්ස් සහ පද්මිණී ලියනගේ යන සහෝදරියන් සහභාගි විය. ඔවුන්ට අමතරව මර්ජ් සංවිධානයෙන් පිරිසක් ද ගමනට එකතු වුණි.

වැඩ වර්ජනයට සහාය ප්‍රකාශ කරන ලද කටයුතු අවසන් වීමෙන් පසුව, අප එක්ව යාමට පැමිණි මල්ලිකා සහ පරා (පරරාජසිංහම්) දෙපල සමඟ ඔවුන් පදිංචිව සිටි පේදුරුතුඩුවේ නිවසට යාමට සූදානම්ව සිටි නමුත් යුදමය තත්ත්වය හේතුවෙන් ඇඳිරි නීතිය පැනවීම නිසා අපට එහි යාම අපහසු විය. ඒ වන විටත් කඩසාප්පු වසා දමා තිබූ බැවින් පරරාජසිංහම් සහෝදරයා අසල වූ ඔහු හඳුනන කුඩා කඩයකට තට්ටු කර ඉටිපන්දම් කිහිපයක්, ගිනිපෙට්ටියක්, සැමන් ටින් දෙකක් සහ පාන් රාත්තල් හතරක් ගත්තේය. එකල මෙම පළාත්වල විදුලිය නොමැතිවීම නිසා අප සියලු දෙනා එකිනෙකාගේ අත් අල්ලා ගනිමින් ඝන අන්ධකාරයේ පාර දිගේ ඇවිද ගියේ කොහෙන් වෙඩිපාරක් එල්ලවේද යන බියෙනි. එය කිසි දිනෙක අමතක නොවන සිදුවීමකි. පසුවදා ඇඳිරි නීතිය ලිහිල් කර තිබූ බැවින් අප සියලු දෙනා නාගදීපයේ යාමට සූදානම් විය. එහෙත් පරා කියා සිටියේ කයිට්ස් වල නැවතත් මිනිස් ඝාතන කිහිපයක් සිදුවී ඇති නිසා නාගදීප ගමන නොයා සිටීම සුදුසු බවයි. අප කිසිවෙකු ඊට එකඟ නොවූ අතර සියලු දෙනා නාගදීපයේ ගිය නමුත් දහවල් කාලය වන විට නැවත ඇඳිරි නීතිය පනවා තිබිණි. පසුව අපි යාල්දේවියේ නැග කොළඹට පැමිණියෙමු. යාපනයට ගිය මාගේ පළමු අත්දැකීම මෙය විය.



# 1983 කළු ජූලිය

1983 දමිළ ජනයාට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියා ඇවිළුණු කලහකාරී කළු ජූලිය අප තුළ අමිහිරි මතකයන් ඉතිරිකොට ඇත. මෙය ලාංකීය ඉතිහාසයේ සිදු වූ ඉතාමත් ඛේදනීයම ජාතිවාදී කෝලාහලය ලෙසින් හැඳින්විය හැක. මෙම සිදුවීමට මුහුණ දුන්නේ දකුණේ ජීවත් වූ දමිළ ජනතාවයි. ජාතිවාදී යුදගිනි ඇවිලෙන්නට පටන් ගත්විට මෙම ප්‍රදේශයෙහි ද දමිළ ජනයාට අයත්ව තිබූ කඩසාප්පු ගිනිබත් කරමින් දමිළ ජනයාට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා උග්‍ර විය. අපගේ නිවස අසල ද දමිළ පවුලක් ජීවත්ව සිටි අතර ඔවුන්ගේ නිවෙස ගිනි තැබීමට සැලසුම් කර ඇති බවට අපට දැන ගන්නට ලැබුණි. මේ නිසා වෙනත් ප්‍රදේශයකට යන ලෙස අප ඔවුන්ට කියා සිටිය ද ඔවුන් පැවසුවේ “අපි කොහේ යන්නද? වෙන දෙයක් වුනාදෙන්” යනුවෙනි. සවස් වන විට ඔවුන්ගේ නිවෙස ගම්මුන් විසින් ගිනිබත් කළ අතර ඒ වන විටත් එකී යුවලගේ ජීවිත ආරක්ෂාව අප විසින් සලසා දී තිබුණි. එමෙන්ම ඒ අවට තිබූ දමිළ ව්‍යාපාරිකයින්ට අයත් වෙළඳසැල් කීපයක්ම කඩා කෝලාහලකරුවෝ එහි වූ බඩු මුට්ටු තම නිවෙස් වෙත රැගෙන යමින් සිටියහ. මේ වන විට රට පුරාම පාහේ ජාතිවාදී ප්‍රචණ්ඩ ක්‍රියා ආරම්භ වීම හේතුවෙන් යුද හමුදා ආරක්ෂාව තරකොට ඇඳිරි නීතිය පනවා තිබුණි.

අප නිවස තුළ නිතරම කම්කරුවන් රැස්වෙන නිසාත්, කම්කරුවන්ට සහයෝගය පළකරන නිසාත්, විශේෂයෙන් දමිළ කම්කරුවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින නිසාත්, රාජ්‍ය විරෝධී ක්‍රියාවන් සිදු කරනවා යැයි අදහසක් අසල්වැසියන් තුළ තිබෙන්නට ඇත. හදිසියේම යුද හමුදාව විසින් නිවස සෝදිසි කිරීමට පැමිණෙන බව කුලී නිවාස හිමිකරු අප වෙත දැනුම් දෙන විට මාගේ සැමියා, මෙම හදිසි අවස්ථාව සම්බන්ධයෙන් කුමක් කළයුතු ද යන්න සාකච්ඡා කිරීමේ රැස්වීමකට සහභාගි වී සිටි නිසාවෙන් ඔහු නිවසේ නොසිටියේය.

වී. අයි. ලෙනින්, ට්‍රොස්කිවාදය, මාක්ස්වාදය යනාදී නම්වලින් යුත් පොත් කීපයක් සහ යාපනයට සිදු වූයේ කුමක් ද යන පොත් පිංචක් ද විප්ලවීය මාක්ස්වාදී පක්ෂයෙන් මුද්‍රණය කළ 'ආරම්භය' නමින් වූ පුවත් පතක්, පෝස්ටර් පින්තාරු කිරීමට ගත් රතු තීන්ත සහ පින්සල් කිහිපයක් ද නිවෙස තුළ විය.

සවස දෙක වන විට ට්‍රක් රථයක් අපගේ නිවස ඉදිරිපිට නතර කරනු ලැබීය. රථයෙන් බැස සෙබළ පිරිස නිවස වටලනා අයුරු මැද සාලයේ සිටි මම දුටුවෙමි. දරුවන් මේ දැක බියවන නිසාවෙන් ඔවුන් අසල්වාසී නිවසකට වැටෙන් පන්නා හැර, මම ඉදිරි දොරකඩ පෙනී සිටියෙමි. එක් හමුදා හටයෙකු වැනි වැනී දොරකඩ සිටගෙන සිටියේ ය. කෙළින් සිටගෙන සිටීමටවත් නොහැකි තරමින් ඔහු බීමතින් සිටි අතර "ගෙදර කවුද ඉන්නේ කෝ මහත්තයා" කියමින් තවත් කිහිප දෙනෙකු සමඟ නිවස තුළට ඇතුල් වී නිවසේ සෑම අස්සක් මුල්ලක් නෑරම සෝදිසි කරන්නට විය. එක් සෙබළෙකු මා ළඟට පැමිණ "කෝ තමන්ගේ මහත්තයා" කියා ඇසූ විට මා ඔහුට පැවසුවේ 'මල්ලී පිටරට ඉඳන් ඇවිත් එයාව බලන්න ගියා' යනුවෙනි.

මේ වන විටත් හමුදා සෙබලුන් නිවස සෝදිසි කර පෝස්ටර් සහ තීන්ත ටින් රැගෙන විත් මේවායින් කරන්නේ මොනවාදැයි මාගෙන් ප්‍රශ්න කරන්නට විය. මා පැවසුවේ ඒවා මර්ජ් ආයතනයේ වැඩ සඳහා ගෙන ආ ඒවා බවයි. එවිට ඔවුන් පැවසුවේ එය ගිනි තියා ඇති නිසා තවදුරටත් එවැනි ආයතනයක් නොමැති බවයි. ඔවුන් එය මා වෙත ප්‍රකාශ කරන ලද අසත්‍යයක් බව මාහට දැන ගන්නට ලැබුණේ පසුව ය.

ඔවුහු, අල්මාරිය විවෘත කරන ලෙස අණ කළහ. එය විවෘත කර පෙන්නූ විට අලුතෙන් ගෙනා විදුලි ඉස්තිරික්කය සහ අල්මාරිය අසල තිබූ හාල් සේරු දහයක් උයන්නට හැකි කල්දේරමක් දැක 'මේවා කඩවල් කඩා ගෙන ආ ඒවාදැයි' ඇසීය. එවිට මා ඔවුන්ට පැවසුවේ ඒවා කැළණියේ සිටින මගේ මව මිළ දී ගත් ඒවා බවයි. එවිට ඔවුහු, මාගෙන් ඒවායෙහි රිසිට් පත් ඉල්ලා සිටියහ. ඉන්පසු කාමරයේ තිබූ තේ පෙට්ටියක් දැක මෙයත් කඩ කඩපුවාදැයි ඇසූහ. මගේ සැමියා ඒ කාලයේ තේ වෙළඳාම ද කළේය. ඔහු පුස්සැල්ලාවෙන් තේ කොළ රැගෙන විත් ජා-ඇල අවට වෙළඳසැල් වෙත අලෙවි කරන කුඩා ව්‍යාපාරික කටයුත්තක් කරමින් සිටියේය. මා එය ඔවුන්ට කියා සිටි අතර ඉන්පසු ඔවුන්ට හසු වූයේ 'ගොවියා' නැමති රතු අකුරින් මුද්‍රණය කර තිබූ කුඩා පුවත් පතකි. පසුව ඔවුන් අපගේ මඟුල් ඡායාරූපය දෙස බලා 'මහත්තයා මෙයා ද' කියා අසා යන්නට ගියේ යළි ආපසු එන බව පවසමිනි.

ඔවුන් එන්නට පෙර මා විසින් මාක්ස්වාදී පොත් පත්තර ටික පොළොවෙහි වළලා දමා නොතිබුනා නම් එවෙලේම මා අත් අඩංගුවට පත්වෙන්නට ඉඩකඩ තිබුණි. ඔවුන් ගිය පසු සැමියා ඔහුගේ යහලුවෙක් නිවසට එවා තිබුණේ මා අත් අඩංගුවට පත් වූවාදැයි සොයා බැලීමට ය.

ජූලි මස 23 වන දින සැමියාගේ වැඩිමල් සහෝදරයාගේ, දුවගේ විවාහය කොළඹ තිබූ නිසා එයට සහභාගී වීම සඳහා ඔහුගේ මල්ලිගේ පවුලේ අය සමඟ වාහනයක නැගී අප එහි යන විට කොළඹ එකම ගිනිජාලාවක් වී තිබුණි. දමිළ ව්‍යාපාරිකයින්ට අයත් කඩ සාප්පු කඩා දමා හාල්, පරිප්පු, මිරිස්, බඩු තොග පිටින් පාරට විසි කර තිබූ අයුරු අප නෙත ගැටුණි. අප වාහනයෙන් බසින විට ඇස් දැවිල්ලක් ඇති වූ අතර මගේ පුතා ද ඇස් දනවා යැයි කියා හඬන්නට විය. ඒ කඳුළු ගෑස් නිසා බව අපට තේරුණි. මා ප්‍රථම වරට කඳුළු ගෑස් පිළිබඳව දැන ගත්තේ එදින ය.

මෙදින සවස දෙක වන විට නැවත ඇඳිරි නීතිය පනවා තිබුණි. මේ නිසා මනමාල මහතාට දුර සිට පැමිණීමට අපහසු වූ බැවින් මඟුල් ගෙදර කටයුතු කල් දමන්නට සිදු වුණි. අප නැවත නිවස බලා එන විට මග දෙපස කඩ සාප්පු කුඩු කර බඩු මුට්ටු රැගෙන යන මිනිසුන් දක්නට ලැබුණි. පොලු රැගත් මැර පිරිසක් අපගේ වාහනය නතර කරවා එයට

ගොඩවී "කෝ මේක ඇතුළේ දෙමළ අය ඉන්නවද? බාල්දිය කියන්න" කියා කෑ ගැසූ ආකාරය මට තවමත් මතකය. වාහනය තුළ සිටි අප සියලු දෙනා එක හඬින් බාල්දිය කියා කෑ ගැසුවෝය. ඔවුහු වාහනයෙන් බැස ගියේ ඉන් පසුවය. එහෙත් මග දෙපස පිළිස්සෙන මළ සිරුරු දුටු විට එකම රටක ජීවත් වන අපි ජාති, කුල, ආගම් මත වෙනස්කොට සැලකීම පිළිබඳව සිත තුළ ඇති වූයේ වේදනාත්මක කලකිරීමකි.

ඇඳිරි නීතිය පනවා තිබූ නිසාවෙන් ජන ජීවිතය සම්පූර්ණයෙන්ම අඩාල වී තිබුණි. කඩසාප්පු, චිත්‍රාගාර, සිනමා ශාලා යනාදිය ගිණි තබා විනාශ කර තිබූ නිසාවෙන් ව්‍යාපාර ලෝකය මුළුමනින්ම බිඳ වැටුණි. මුළු කොළඹ නගරයම වැසී තිබුණේ කළු දුමාරයෙනි. පුරවැසියන් ලෙස නිදහසේ තව දුරටත් මේ රට තුළ ජීවත් විය හැකිද යන ප්‍රශ්නය දමිළ ජනතාව තුළ නැවත නැවතත් ඇති කිරීමට මෙම ප්‍රචණ්ඩකාරී තත්වයන් විසින් බල කෙරුණි. එහි අවසාන ප්‍රතිඵලය වූයේ දමිළ ජනතාව දකුණෙන් පිටමං කිරීමයි. තම දෙමව්පියන් සහෝදරයින් මරා දමනවා සියැසින් දුටු දෙමළ මිනිසුන් රට හැර ගියේ නැවත නොපැමිණෙන අදහසිනි. අප දන්නා දමිළ මිතුරන් එදා ඒ නික්මගිය ගමන අදටත් ජීවත් වන්නේ විදේශ ගතවය. ඔවුන් අප සමඟ නිරන්තරයෙන් සබඳතා පැවැත්වූව ද අපෙන් විශාල වරදක් ඔවුන්ට සිදු වූ බවට හිත නිරන්තරයෙන් කනස්සල්ලට පත් වන්නේ එදා ඔවුන් මුහුණ දුන් සිදුවීම් මා ද සියැසින් දුටු නිසාවෙනි. මෙම අවාසනාවන්ත සිදුවීම් වලට මුහුණ දුන් දමිළ ජනයා වෙනුවෙන් සාමයෙන් විසීමට කැමති, සමානාත්මතාවය පිළිගන්නා පිරිස් ලෙසින් අප විසින් කළ යුතු දේ ලෙස එදා මා පසක් කරගත්තේ සාමය, සහජීවනය ඇති කිරීම වෙනුවෙන් එක්ව සාමූහිකව අධිෂ්ඨානශීලීව කටයුතු කිරීමේ ප්‍රබල අවශ්‍යතාවයයි. පසුකලෙක රට තුළ වර්ධනය වූ දරුණු යුද්ධය හේතුවෙන් මෙහි ජීවත්වන සියලු ජනවර්ගවලට අයත් ජාතීන් ලක් මවගේ ධරණී තලය තුළ හෙලූ රුහිරු අපමණය.

අප සියැසින් දුටු, අත්විඳි මෙම සිදුවීම් මා මෙහි ලියා දක්වන්නේ, ජාතිවාදය හේතුවෙන් ඇති වූ විනාශකාරී යුද්ධය සහ මිනිස් සංහාරයන්ට එරෙහිව සාමයෙන් සහජීවනයෙන් ජීවත්වීමේ අවශ්‍යතාවය එදා මෙන්ම අදටත් අවධාරණය කරනු පිණිසය.

# 2002 සටන් විරාම කාලය තුළ යාපනයට ගිය ගමන

සාමය සඳහා කාන්තාවෝ සංවිධානයෙන් ඩාබිඳු සාමූහිකයට වටිනා අවස්ථාවක් ලබා දුන්නාය. ඒ, සටන් විරාමය තුළ වන්නියේ වෙසෙන කාන්තාවන්ගේ ජීවිත පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමටය. ඒ වන විටත් යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන් සමඟ කටයුතු කරමින් සිටි කුඩා කාන්තා එකතුවක් මේ සඳහා අපට සහාය විය. යුද්ධයෙන් අනාථ වූ පවුල් ගණනාවක් මෙයට සම්බන්ධ වී සිටීම නිසා ඔවුන්ගේ ජීවන තත්ත්වය පිළිබඳ තොරතුරු සමීක්ෂණයක් කිරීමට අපට අවස්ථාව ලැබුණි.

A9 පාරට ඇතුල් වීමට පෙර සියලුම වාහන මුහමලේ පිහිටා තිබූ LTTE චෙක් පොයින්ට් එකකින් නවත්වන්නට යෙදුණි. අප ගිය වාහනයේ ඉඩ ප්‍රමාණවත් නොවූ නිසාවෙන් ට්‍රැවලින් බෑග් සහ කෑම වර්ග ගෙන යාම සඳහා ගත් තව පොඩි වාහනයක් ද විය. එය පරීක්ෂා කර බැලූ LTTE සටන්කාමීන් එම වාහනයට අදාළ ලියකියවිලි ප්‍රමාණවත් නොමැති බව පවසා නැවත කොළඹට ගොස් අදාළ ලියකියවිලි රැගෙන එන ලෙසින් පවසා අප ගිය බස් රථය ද එහි නවතා ගනු ලැබුවේය. එම රියදුරා අවශ්‍ය ලියකියවිලි රැගෙන නැවත එනවිට සවස් වූ නමුත් අපි යාපනය බලා පිටත් වීමු. අප ගිය පාර දෙපස නිවෙස් වෙඩි වැදී විනාශ වී තිබුණි. එය දුටු මා හට වෙඩි වැදී මිය ගිය මිනිසුන්ගේ මරණය කොතරම් ඛේදජනක දැයි

සිතෙන්නට වූයේ මහත් කම්පනයක් ඇති කරමිනි. පොල් අතු වලින් ආවරණය කර තිබූ චෙක් පොයින්ට් වල නැවත අපගේ ගමන් මලු, යන අයගේ නම් ලිස්ට්, හැඳුනුම්පත් බලා අවසානයේ අප යාපනයට යන විට සවස් වී තිබුණි. අපට දෙමළ සහෝදර ජනතාවගේ නිවෙස්වල නතර වීමට අවස්ථාව ලැබුණි. එක් නිවෙසක එක් අයකු බැගින් අප සියලු දෙනාට නවාතැන් ලැබුණි.

මට නතර වීමට ලැබුණු නිවසේ අම්මා තාත්තා සහ පුතාලා දෙදෙනෙකු විය. යුද්ධය නිසාවෙන් විනාශ වූ ස්ථාන පෙන්වීමට ඔවුහු ගම්මානය පුරාවට අපව රැගෙන ගිය අවස්ථාවේ තැනින් තැන ඉදිකළ බංකර් සහ විනාශ වූ නිවෙස් දක්නට තිබුණි.



# අප පවුලට තවත් දරුවකු එකතුවීම

විනයාගම් මූර්ති නොහොත් මූර්ති අයියා යාපනයේ පේදුරු තුඩුවේ දුම්රිය දෙපාර්තුමේන්තුවේ සේවය කළ අයෙකි. ඔහු මාගේ බාල නැගණියගේ සැමියා වූ සමරසිංහ මල්ලීගේ හොඳම මිතුරා විය. ඔවුන් සේවය කළේ එකටය. නංගිගේ විවාහයට සාක්ෂිකරුවෙකු ලෙසින් අත්සන් කළේ ද ඔහුය. මෙයට උරණ වූ නැන්දා "ඇයි සිංහල යාළුවෙක් හිටියේ ම නැද්ද දෙමළ කෙනෙකුටම සාක්ෂියට අත්සන් කරන්න දුන්නේ" යි තරහින් අම්මාට දොස් කීවා මට මතකය. මගේ නංගී, ස්වර්ණපාලී මධුසමය ගතකිරීමට තෝරා ගත්තේ මඩකලපුවේ පාසිකුඩා ය. එම මංගල උත්සවයට ගිය අප විනෝද වූ අයුරු මා හට කිසි දිනක අමතක නොවේ.

මූර්ති අයියාගේ පවුලේ දරුවන් වූයේ, දුව මදනි සහ පුතා රාම කමලන් ය. යුද්ධ කාලය නිසාවෙන් මෙම දරුවන් දෙදෙනාගේ අධ්‍යාපන කටයුතුවලට බාධා ඇති විණි. එහෙයින් කමලන් උසස් පෙළ අධ්‍යාපන කටයුතු සඳහා අප නිවසේ නතර කර ගත්තෙමු. සැබැවින්ම ඔහු අපට තවත් දරුවකු විය. ආරක්ෂිතව කමලන් ට සිය අධ්‍යාපන කටයුතු නිමකර ගැනීමට හැකිවීම අපට මහත් සතුටක් ගෙන දුන් කාරණායකි.

# පුරුෂාධිපත්‍යය ස්ත්‍රී මධ්‍යස්ථානයේ විනාශයට හේතු විය

විප්ලවීය මාක්ස්වාදී පක්ෂයේ (RMP) උපාලි කුරේ සහෝදරයා සහ ලංකා වෙළඳ සේවක සංගමයේ (CMU) බාලා තම්පෝ සහෝදරයා කම්කරු අයිතීන් වෙනුවෙන් සටන් කළ අද්විතීය නායකයෝ වූහ. පසුකාලීනව ඔවුන් අතර මත ගැටුමක් ඇති වූ නිසා පක්ෂය සහ වෘත්තීය සමිතිය දෙකඩ විය. ඉන්පසු විප්ලවවාදී මාක්ස්වාදී පක්ෂයේ බලය උපාලි කුරේ සහෝදරයා අතට ගිය අතර වෘත්තීය සමිතියේ නායකත්වය බාලාතම්පෝ සහෝදරයා අතට පත් විය. මේ නිසා, එහි සිටි ඇතැම් ක්‍රියාකාරීහු පක්ෂයේ සහ වෘත්තීය සංගම් වැඩ වෙන් වෙන්ව කරන්නට පටන් ගත්හ. පසුව පක්ෂය විසින් නව වෘත්තීය සමිතියක් කාර්මික ජනපදය තුළ ආරම්භ කරන්නට යෙදුණි. එම නව වෘත්තීය සමිතිය විසින් පොලිටෙක්ස් ආයතනය තුළ සිය ශාඛා සමිතියක් ආරම්භ කරන ලදී. නව වෘත්තීය සමිතියට කාර්යාලයක් එවකට නොතිබීම නිසා ස්ත්‍රී මධ්‍යස්ථානය මෙම වෘත්තීය සමිතියේ සම්බන්ධීකරණ වැඩකටයුතු සඳහා යොදා ගැනුණි. වර්තමානයේ මෙන් නොව එකල තාක්ෂණයේ දියුණුවක් නොතිබූ නිසා බොහෝවිට මුද්‍රණ කටයුතු සිදුවූවේ යතුරු ලියනයෙන් අකුරු ටයිප්කොට හෝ ස්ටෙන්සිල් කපා රෝනියෝ කිරීමෙනි. මුද්‍රණය කළ අත්පත්‍රිකා බෙදාහැරීම, රැස්වීම්වල පෝස්ටර් ඇලීම යනාදී විශාල වැඩ කොටසක් මෙකල කාන්තාවන්ගේ අතින් සිදු විය.

කාලය මෙසේ ගෙවී යද්දී වෘත්තීය සමිතිය සහ ස්ත්‍රී මධ්‍යස්ථානය අතර නිරන්තර ගැටුම් මතු විය. එයට හේතු වූයේ, වෘත්තීය සමිතිය තුළ කටයුතු කළ ඇතැම් පිරිමින් මධ්‍යස්ථානයේ සේවය කළ කාන්තාවන් වෙත සිය පුරුෂාධිපත්‍යයික බලය විවිධාකාරයෙන් මුදාහැරීම නිසා මධ්‍යස්ථානයේ සාමූහික ශක්තිය දුර්වල වන්නට පටන් ගැනීමයි. මෙම තත්වයන්ට එරෙහිව ඉදිරිපත් වූ මා ද ඇතුළුව ස්ත්‍රී මධ්‍යස්ථානයේ ආරම්භක සාමාජිකාවන් සියලු දෙනා බොරු චෝදනාවන් මත සංවිධානයෙන් ඉවත් කිරීමට ඔවුහු ක්‍රියා කළහ. මේ හේතුවෙන් ස්ත්‍රී මධ්‍යස්ථානය සම්පූර්ණයෙන්ම වෘත්තීය සමිතියේ ග්‍රහණයට හසුවිය. ඒ මන්ද යත් එය ඔවුන් එවකට සම්බන්ධ වී සිටි වෘත්තීය සමිතියේ ශාඛාවක් වූ නිසාය.

නීතිමය ප්‍රශ්න මත බන්ධුශාන්ති සහ ලීලා ෆර්ඩිනැන්ඩ්ස් යන සහෝදරියෝ ආයතනයෙන් තම සේවය අතහැර ගිය අතර කුමුදුනී සැමුවෙල් ද පද්මිණී ලියනගේ යන අය ද ඔවුන්ට පැවැති විවිධ මතභේද සහ ගැටළු මුල් කරගෙන ආයතනයෙන් ඉවත් විය. පොලිටෙක්ස්, යුනියන් කාබයිඩ් සටන් මේ වනවිට නිමා වී වෘත්තීය සමිතියේ බලය වැඩි වී තිබුණි. මෙම හේතූන් නිසාවෙන් ස්ත්‍රී මධ්‍යස්ථානයේ සේවය කළ පූර්ණ කාලිකයින් වැඩි පිරිසක් එයින් ඉවත් වුණි. වෘත්තීය සමිතියේ බලය වැඩිවීම හේතුවෙන් ස්ත්‍රී මධ්‍යස්ථාන කමිටුවට වෘත්තීය සමිතිය නියෝජනය කළ ස්ත්‍රීන් වැඩි වැඩියෙන් පත්වීමෙන් පසුව මධ්‍යස්ථානයෙහි සේවය කළ ස්ත්‍රීන් වෙත තිබූ තීන්දු තීරණ ගැනීමේ බලය හීන වන්නට විය. පොලිටෙක්ස් හි සේවය කළ ලීලා ෆර්ඩිනැන්ඩ්ස්, හේමා මාතරගේ, කොන්සී හිල්ඩා, සෝමලතාල කාමල්, මාලා රත්නශීලි ඇතුළු පිරිසක් මධ්‍යස්ථානයේ කමිටුවේ සිටි නමුත් ඔවුන්ගෙන් කිහිප දෙනෙකු අස් වී ගියේ විවිධ ගැටලු මෙන්ම පුරුෂාධිපත්‍යයික පීඩනයන්ට මුහුණ දීමට නොහැකි වූ නිසාවෙනි. වෘත්තීය සමිතිය සහ එහි විධායක කාරක සභා රැස්වීම් පැවැත් වූයේ ස්ත්‍රී මධ්‍යස්ථානය තුළය. එහි කම්කරුවන්ගේ නීතිමය ගැටළුවලට ඉදිරිපත්වීමට නීතිඥවරයෙකු ද විය. මෙකල, ස්ත්‍රී මධ්‍යස්ථානයට මූල්‍ය ආධාර සෙවීම සඳහා කුමුදිනී රෝසා විසින් සහය ලබා දෙන ලදී. වෘත්තීය සමිතිය සහ ස්ත්‍රී මධ්‍යස්ථානය තුළ මුදල් සම්බන්ධ ගැටලු මතු වන්නට විය. ඒ වන විට විදේශීය ආයතනයක් වෙතින් මුදල් ආධාර ලැබී තිබුණත් එය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් විවිධ ගැටලුකාරී තත්ත්වයන් මතු වුණි.

මේ හේතුවෙන් වෘත්තීය සමිතිය සිය මහ සභාව කැඳවා බලය භාවිතාකොට ඔවුන්ගේ වැරදි සහගත ක්‍රියාකාරිත්වය ප්‍රශ්න කළ පිරිස ස්ත්‍රී මධ්‍යස්ථානයෙන් නෙරපා හැරීමට ඔවුහු ඉතා සැලසුම් සහගතව කටයුතු කළහ. ඒ සඳහා ඔවුහු මෙම මහා සභාව අයුතු ලෙසින් පාවිච්චි කළෝය. මේ ආකාරයට ස්ත්‍රී ක්‍රියාකාරීන් පිරිසක් එක්ව ගොඩනඟා ගත් ස්ත්‍රී සංවිධානය, පුරුෂාධිපත්‍යයට යටත් කර ගැනීමට ඉඩ නොදී එය රැකගැනීමේ අරමුණෙන් අප එක්ව කටයුතු කළත් අවසානයේදී ඔවුන්ට ජයග්‍රහණය අත්විය.

# ඩාබිඳු සාමූහිකයේ ආරම්භය




ඩාබිඳු සාමූහිකයේ ආරම්භක සාමාජිකා විවියන් පැවිදි සහෝදරිය ඩාබිඳු කාර්යාලයේ දී

ස්ත්‍රී මධ්‍යස්ථානය තුළ පැවැති විවිධාකාර වූ හැලහැප්පීම් සහ ස්ත්‍රී විරෝධී, පුරුෂ භාවිතාවන් සහ හැසිරීම් හේතුවෙන් කාන්තාවන් විසින්ම පාලනය කරන කාන්තාවන් විසින්ම තීන්දු තීරණ ගතහැකි වන පරිදි සංවිධානයක් ස්ථාපිත කිරීමේ වුවමනාව අප තුළ විය.

එයට මුල් ආරම්භයක් ලෙසින් 1983 දී පමණ ස්ත්‍රී අධ්‍යාපන සහ පුහුණුවීමේ ආයතනය ලෙසින් රත්තනපිටියේ දී කුඩා කාන්තා අධ්‍යයන කවයක් ආරම්භ කළෙමු. (පසුකලෙක, 1992 දී අප ස්ත්‍රී අධ්‍යාපන හා පුහුණුවීමේ ආයතනය ලෙසින් බියගම දී ස්ථාපනය කරන ලද්දේ මෙම ආයතනයයි) එයට මූලික වූවන් අතර කුමුදිනී රෝසා, මල්ලිකා පරරාජසිංහම්, චිත්‍රා හේවගේ, ශාන්තා පෙරේරා සහ එච්.අයි. සමන්මලී වන මා ද විය. ස්ත්‍රී අධ්‍යාපන හා පුහුණුවීමේ ආයතනය විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවීය දැක්මකින් යුතුව ස්ත්‍රීන්ගේ ගැටලු ආමන්ත්‍රණය කරන අත්පත්‍රිකා ගණනාවක් මුද්‍රණය කර දිවයින පුරා බෙදා හැරීමට අපට හැකි විය.

පවතින පීතෘමූලික සමාජ තත්ත්වයන් හමුවේ ස්ත්‍රීන්ට, ස්ත්‍රීන් වීම නිසාම මුහුණ දීමට සිදුවන ප්‍රශ්නවලට මැදිහත් වීම පිණිස ස්ත්‍රීන්ටම තීන්දු තීරණ ගතහැකි කාන්තා සංවිධානයක් බිහි කිරීමේ අරමුණ ඇතිව ඩාබිඳු සාමූහිකය 1984 සැප්තැම්බර් මස 15 දින කටුනායක දී ආරම්භ කළෙමු.



අපගේ කාන්තාවන් නිදහස් වෙළෙඳ කලාපය තුළ සිය ශ්‍රමය වගුරා හෙළන දහදියට ගෞරව කිරීමක් වශයෙන් ඩාබිඳු යන නම එයට තැබුවෙමු. කටුනායක ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමයෙහි විවියන් ප්‍රනාන්දු පැවිදි සොයුරියගේ සහයෝගය මේ සඳහා ලැබුණි. ඩාබිඳු සාමූහිකය ලෙසින් අපගේ මූලික අවධානය යොමු වූයේ කටුනායක සහ බියගම නිදහස් වෙළඳ කලාපයන්හි සේවක අයිතිවාසිකම් වෙතය.

1977 පාර්ලිමේන්තු මැතිවරණයෙන් රටේ පාලන බලය අත්පත් කරගත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය යටතේ, 1978 වසරේ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාප ආරම්භ විය. ගම්බද ප්‍රදේශවල රැකියා විරහිත තරුණ කාන්තාවෝ සිය දහස් ගණනින් නිදහස් වෙළඳ කලාපයේ රැකියා සොයා කටුනායක බලා එන්නට පටන් ගති. මේ හේතුව නිසා කටුනායක කර්මාන්තශාලා අවට පිහිටි නිවෙස් බොහොමයක් මෙම කාන්තාවන්ගේ නේවාසිකාගාර බවට පත් විය. නිසි ප්‍රමිතියක් නොවූවත් අඩි 8-10 කාමර තුළ පස් හය දෙනෙකුට පමණ නේවාසිකව ජීවත් වෙමින් රැකියාවෙහි යෙදීමට මෙම කම්කරු කාන්තාවන්ට සිදු විය. මේ නිසාම විවිධාකාර වූ සමාජ ප්‍රශ්නවලට මුහුණ දීමට ද ඔවුන්ට සිදු විය.

1978 වසරේ මෙම කම්කරු කලාප බිහි වුවද දිනපතා උල්ලංඝණය වන කම්කරු අයිතිවාසිකම් හමුවේ කම්කරු අරගල සහ සටන් මතු වන්නට වූයේ 1983 පමණ වන විටය. රැකියාවේ අනාරක්ෂිත බව, මග තොටේ දී මෙන්ම නේවාසිකාගාර තුළදී ද රැකියා ස්ථානයේදී ද සිදුවන හිංසනයන් සහ ප්‍රචණ්ඩත්වයන්, දූෂණ, මංකොල්ලකෑම් ආදී සොර සතුරු උවදුරුවලට කම්කරු කාන්තාවන්ට නිතර දෙවේලේ මුහුණ දීමට සිදු විය. මේ සියලු ප්‍රශ්න ගැටලු ගලාගෙන ආවේ විවියන් ප්‍රනාන්දු පැවිදි සොයුරිය වෙතටය. මෙම ගැටලු වලට විසඳුම් ලබා දෙන්නේ කෙසේද යන්න නිරන්තරයෙන් අපගේ සාකච්ඡාවට භාජනය වූ මාතෘකාවයි. ඩාබිඳු සාමූහිකයේ ඉදිරි කටයුතු සාර්ථක කරගැනීම සඳහා සාමූහික තීන්දු තීරණ ගැනීම පිණිස කමිටුවක් පත් කර ගන්නා ලදී. කමිටු සාමාජිකයින් වූයේ, ගරු විවියන් ප්‍රනාන්දු පැවිදි සොයුරිය, එච්. අයි. සමන්මලී, ප්‍රෙඩී ගමගේ, විමල් ප්‍රනාන්දු, පිලමිනා ද සිල්වා, චිත්‍රා හේවගේ, මියුරියල් ප්‍රනාන්දු යන සහෝදර සහෝදරියන් ය.

ඒ වනවිට ඩාබිඳු සාමූහිකයට කාර්යාලයක් නොතිබුණු අතර මූල්‍ය ආධාර ද නොතිබුණි. එහෙත් ගමේ ප්‍රභූවරුන්ගෙන් ද කතෝලික ආගම් වලින් ද ඩාබිඳු සාමූහිකය පවත්වා ගෙන යාමට විශාල සහයෝගයක් ලැබුණි. කටුනායක පිහිටි ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය තුළ පුස්තකාලය පිහිටුවා තිබුණේ යෞවන අධ්‍යාපන කවය නමින් ය. කටුනායක වෙළඳ

කලාපයේ සේවය කරන කම්කරු ස්ත්‍රීන් රාශියක් ඔවුන්ට විවේක අවස්ථාවන්හි දී මෙම පුස්තකාලය වෙත පොත් කියවීමට පැමිණි අතර මෙහිදී ඔවුන්ට සිදුවන අසාධාරණයන්, හිංසනයන් පිළිබඳ විවියන් සොයුරිය සමඟ තොරතුරු බෙදා ගන්නට විය. මෙයට විකල්පයක් ලෙස ලැබෙන තොරතුරු අන් අයට ද දැන ගැනීම පිණිස රෝනියෝ පුවත් පතක් වශයෙන් බෙදා හැරියෙමු. නිදහස් වෙළෙඳ කලාපය තුළ සිදුවන කම්කරු ගැටලු ගැන දැනගැනීමට කිසිම සන්නිවේදන මාර්ගයක් නොතිබූ තත්ත්වයන් තුළ මෙම රෝනියෝ පත්‍රිකාව මහඟු පිළිසරණක් විය.





ඩාබිඳු කමිටු රැස්වීමක් අතරතුර



ධාබිඳු සාමූහිකයේ 13 වන සංවත්සර දිනය සමරමින්




සමන්මලී සහෝදරිය පරරාජසිංහම් සහ මල්ලිකා යුවලගේ පවුලත් සමඟ

# නිදහස් වෙළඳ කලාපයේ ප්‍රථම පුවත් පත ඩාබිඳු ආරම්භය සහ විකාශනය




රෝනියෝ මුද්‍රණයෙන් පළ වූ ඩාබිඳු මුල් කලාපයන්

නිදහස් වෙළඳ කලාපයේ කම්කරුවන් මුහුණ දෙන ප්‍රශ්න පිළිබඳ තොරතුරු අප වෙත ගලාගෙන එන්නට පටන් ගත් නිසා ඩාබිඳු නමින් පුවත් පතක් මුද්‍රණය කිරීමට අපි කල්පනා කළෙමු. මෙහි එක් අරමුණක් වූයේ කලාපය තුළ පවතින ප්‍රශ්න, තොරතුරු සම්බන්ධයෙන් කම්කරු ප්‍රජාව දැනුවත් කිරීමයි. එමෙන්ම තවත් අරමුණක් වූයේ කම්කරු ස්ත්‍රීන්ගේ අදහස්, මතවාද, ලිපි නිර්මාණ පළකිරීම සඳහා අවස්ථාවක් ලබාදීමයි. මෙහි දී කම්කරු සහ ස්ත්‍රී අයිතිවාසිකම්, මානව හිමිකම්, ස්ත්‍රී

පුරුෂ සමාජභාවය සහ ප්‍රජනන සෞඛ්‍ය අයිතිවාසිකම්, ජාත්‍යන්තර සන්නාම පිළිබඳ අවබෝධය යනා දී වශයෙන් වූ බොහෝ විෂය කරුණු සරලව පුවත් පත ඔස්සේ සාකච්ඡාවට භාජනය විය.

මසකට වරක් නිකුත් වූ ඩාබිඳු පුවත් පත නිදහස් වෙළඳ කලාපයේ කම්කරුවන් අතර ජනප්‍රිය තොරතුරු මාධ්‍යයක් වූ අතර ඉල්ලුමට සරිලන පරිදි මෙහි පිටපත් දහදාහක් මුද්‍රණය කිරීමට අපට සිදු විය. ඩාබිඳු පුවත් පත සඳහා ලැබෙන නිර්මාණ ලිපි කෙටිකතා සහ ස්ත්‍රීන්ට සිදුවන ප්‍රචණ්ඩත්වය කම්හල් තුළ සිදුවන අසාධාරණකම්, සේවකයින් නෙරපා දැමීම සම්බන්ධ ලිපි අප වෙත ගලා ආවේය. එම කාලයේ ඩාබිඳු මුද්‍රණය වූයේ ලිතෝ ක්‍රමයටය. වර්තමානයේ මෙන් ඡායාරූප දැමීමට එහිදී නොහැක. ඒ සඳහා ඩම් කැපිය යුතුය. ඒ කාලයේ දී එවැනි දේවල් කිරීම මා හට පැවරී තිබූ එක් කාර්යභාර්යක් විය. ලැබෙන ලිපි එකතු කර සංස්කරණය කිරීම රත්තනපිටියේ පිහිටි මුද්‍රණාලය වෙත ගෙනයාම සෝදුපත් බැලීම යනාදී කටයුතු මෙන්ම රත්තනපිටියේ සිට කටුනායකට ඩාබිඳු පුවත්පත රැගෙන ඒම වැනි දුෂ්කර කටයුතු රාශියක් මේ අතර විය. මෙකල මෙන් ප්‍රවාහන පහසුකම් බහුල නොවූ යුගයක මේ සියලු ගමන් බිමන් ආවේ ගියේ ලංගම බස් රථ වලිනි. පත්තර මිටි බස් රථයට පටවා ගැනීම සහ බිමට බාගැනීම ලෙහෙසි පහසු කාර්යයන් නොවීය. මෙසේ රැගෙන එන ඩාබිඳු පුවත්පත් පාර්සලය බස් රථය තුළ විසිරී ගිය අවස්ථා ද ඒවා නැවත එකතු කර බැඳගෙන බසයෙන් බැසගැනීමට සිදු වූ අවස්ථා ද එමටය. ඩාබිඳු පුවත්පත බෙදා හැරීමට සහ කම්කරුවන්ගේ ප්‍රශ්නවලට මැදිහත්වීමට වෘත්තීය සංගම් ක්‍රියාකාරිකයෙකු වූ මාගේ සැමියාගේ, සෝමේගේ දායකත්වය නිතරම අප වෙත ලැබුණි.

නිදහස් වෙළඳ කලාපයේ කම්කරු කාන්තාවන් මුහුණ දුන්, ප්‍රධාන පුවත් පත් ධාරාවෙන් ප්‍රතික්ෂේප වූ ප්‍රවෘත්ති සහ තොරතුරු ලෝකයට ඉදිරිපත් කරන්නට ඔවුන්ට හොඳම මාධ්‍ය වූයේ ඩාබිඳු පුවත් පතයි. මෙලෙස ඩාබිඳු විසින් හෙළිදරව් කළ සහ මැදිහත් වූ ආන්දෝලනාත්මක සිදුවීම් ගණනාවකි. එම සිදුවීම් වලින් කිහිපයක් පහත වේ.


ඩාබිඳු
ඇසට වන්දිය රු. 64/- යි!
ඩාබිඳු
ටී. කේ. ෆ්ලෝරල් ග්‍රීන්ස් ආරවුලට සහයෝගිතා එකතුවක්
ඩාබිඳු
හිඟ වැටුප් සමග මැණිකේ යළි සේවයට

ලිතෝ මුද්‍රණයෙන් පළ වූ ඩාබිඳු කලාප

1985 ඔක්තෝබර් 15 දින වෙළඳ කලාපයේ සේවය නිමා වී නවාතැන්පළ වෙත ගමන් කරමින් සිටියදී සල්ලාලයන් දහතුන් දෙනෙකු අතින් දූෂණය වූ තරුණියකගේ සිදුවීම මෙහිදී සඳහන් කළ හැකිය. මෙම සිදුවීමෙහි දී නීතිමය කටයුතුවලට මැදිහත්වීමට අපට නොහැකි වූයේ, එයට ඇගේ දෙමාපියන්ගේ පාර්ශවයෙන් දැක් වූ බලවත් අකමැත්ත හේතුවෙනි.

1995 දෙසැම්බර් 26 දින තවත් මෙවැනිම සිදුවීමක් වාර්තා විය. කටුනායක එක්තරා අයතනයක සේවය කළ කම්කරු තරුණියක් සිය නිවාඩු අවසන් වී ගමේ සිට නේවාසිකාගාරය වෙත පැමිණෙමින් සිටියදී කටුනායක, කෝවින්න ප්‍රදේශයේ දී පුද්ගලයෙක් විසින් ඇයව අසල පිහිටි කනත්තකට බලහත්කාරයෙන් ඇදගෙන ගොස් දූෂණය කිරීම මෙම සිදුවීමයි. ඇයව දූෂණය කර ගෙලෙහි වූ රන් මාලය ද කඩාගෙන මෙම පාපතරයා පැන ගොස් තිබුණි.

මෙම සිදුවීම පිළිබඳව ඇයගේ පෞද්ගලිකත්වයට හානියක් නොවන පරිදි අපි ඩාබිඳු පුවත් පතෙන් කරුණු අනාවරණය කළෙමු. එය කලාපයේ කාන්තා සේවකයින් මුහුණ දෙන අනාරක්ෂිතභාවය සම්බන්ධයෙන් පාලකයින්ගේ අවධානය යොමු කිරීමට සමත් විය. මෙම ස්ත්‍රී දූෂණ සිදුවීමෙහි දී එම තරුණියට යුක්තිය ඉෂ්ඨ කර ගැනීමට මැදිහත් වූ ඩාබිඳු සාමූහිකය වසර පහක් තිස්සේ එම නඩුව ගෙනයාමට අවශ්‍ය කටයුතුවලට සහාය දුන්නාය. අවසානයෙහි දී මෙම නඩුවෙහි තීන්දුව වූයේ, මෙම ස්ත්‍රී දූෂණයට වරදකරු වීම හේතුවෙන් එම දූෂකයාට වසර 7 ක සිර දඬුවමක්

ද ඔහුගේ පෙර වැරදි වෙනුවෙන් තවත් වසර 30 ක සිර දඬුවමක් ද වශයෙන් වසර 37 ක සිර දඬුවම් නියම වීමෙනි.

මෙම සිදුවීම දැනගත් විගස රෝහලට ගොස් තොරතුරු විමසා ඇයට යුක්තිය ඉටුකර ගැනීම පිණිස මෙන්ම ඇගේ මානසික තත්ත්වය ශක්තිමත් කිරීම සඳහා අපි මැදිහත්වී කටයුතු කළෙමු. දෙමාපියන් නොමැතිව ආච්චි සීයා සමග ජීවත් වූ ඇය වෙනුවෙන් ඉදිරිපත්වීමට වෙනත් කිසිවෙක් සිටියේ ද නැත.

තරුණියකට මහමග දී මුහුණ දීමට සිදු වූ මෙම ලිංගික හිංසනයට මැදිහත් වී ඇයට යුක්තිය සහ සාධාරණය ඉෂ්ඨ කරදීමට සහාය වීම හේතුවෙන් ඩාබිඳු ආයතනයට ද මැර තර්ජන එල්ල විය. ඇගේ පෙම්වතා සහ මා සෑම නඩු දිනයකදීම ඇයත් සමඟ උසාවියට ගිය අතර එහිදී බන්ධනාගාරයේ සිට දූෂණය සිදු කළ තැනැත්තා උසාවියට රැගෙන ආ අවස්ථාවේ ඔහු දුටු ඇය සිහිසුන්ව ඇද වැටුණාය. පසුව ඇය කූඩුවට නංවා ඇගෙන් ඇසූ ප්‍රශ්න තවමත් මාගේ කන අසලම දෝංකාර දෙනවා වැනිය. "තමා ඔහු සමඟ කැමැත්තෙන් සිටියාද? තමනුත් ඇඳුම් ගලවන්න උදව් වුනාද?  දූෂණය සිදු කළේ ඔහුම කියා තමා හඳුනා ගන්නේ කෙසේ ද?" යනාදී වශයෙන් වූ ප්‍රශ්න ගණනාවක් ඇගෙන් අසා සිටි අතර එම අවස්ථාවේ ඇය කියා සිටියේ ඔහු පිහියක් පෙන්වා කෑ ගැහුවොත් මරණ බවට ඇයට තර්ජනය කළ බවයි. ඒ මොහොතේම පිහියක් පෙන්වා "ඔබ මේ පිහිය අඳුනනවාද?" යනුවෙන් ප්‍රශ්න කළ අවස්ථාවේ ඇය නැවත වරක් සිහිසුන්ව ඇද වැටුනාය. ඇගේ පෙම්වතා මේ සියල්ල ඉතාමත් ඉවසිලිවන්තව අසා සිටි නමුත් මවක් ලෙසට එය මට ඉවසා දැරිය නොහැකි කාරණාවක් විය.

එක් වරක් ලිංගිකව දූෂණයට ලක් වූ ඇයට අධිකරණය තුළ සිටින පිරිස ඉදිරියේ උසාවියෙන් අසන ප්‍රශ්න හමුවේ නැවත නැවත දූෂණයට ලක්වන්නට සිදු විය. මෙම සිදුවීම සහ ඒ හා බැඳුණු නීතිමය කටයුතු විසින් අපට කියා දුන්නේ බලවත් අසාධාරණයක් සිදු වූ අවස්ථාවකදී පවා යුක්තිය ඉටුකර ගැනීමට කාන්තාවකට ඇති දුෂ්කර තත්ත්වයයි. කාන්තාවක මුහුණ දෙනු ලබන පීඩාවයි. වසර තුනක අවසානයේ නඩු තීන්දුව ලබා දුණි. ඒ අනුව වැරදිකරුට වසර දහයක කාලයක් සඳහා බරපතල වැඩ සහිත සිර දඬුවම් හිමි විය.



4.30 ට මා උදෑසම පිබිදෙනවා
එඩිතර කමින් මා ලිප ගිණි මොළවනවා
සෝදා ගෙන මුණ තේ උගුරක් බොනවා
උද්‍යානම මා රැකියාවට යනවා

උදේ 7 ට මා සේවය අරඹනවා
මිස් ප්‍රඩක්ෂන් එක ඉල්ලා යනවා
දෙන්නට බැරි මාව මෙලෙස දුක් වෙනවා
මිස් ඇවිත් අප සැමටම බැන යනවා

10.30 ට එක තේ උගුරක් දෙන්නේ
කහටත් නැතුව සීනිත් නැතුවයි දෙන්නේ
බඩගිණි නිසා එය සතුටින් අර ගන්නේ
දුප්පත් නිසා අපි මේවා ඉවසන්නේ

රස්සාවක් නැතුව කටුනායක ආවා
වෙළඳ කලාපයෙ රස්සාවක ආවා
ස්ටාර් ගාමන්ට්ස් එකෙ මා වැඩ කෙරුවා
දැන් නම් රස්සාව පවා මට එපා වුවා

අසනීපයෙන් පෙලුනා මා පසු දිනක
එන්නට දුන්නෙ නැහැ මිස් මට ඒ දිනක
අමාරුවෙන් වැඩ කරනා ඒ දිනක
ස්ටාර් ගාමන්ට් එක තුළ මැරෙනවා දිනක

මුලු මාසෙම මා සේවෙට යනවා
මාසික වැටුප 800ක් මට දෙනවා
ඇටන්ඩන් බෝනස් කියා 72 ක් ගෙවනවා
කිසිම දෙයක් එකතු නොකර අපිට පඩි ගෙවනවා.

උදේ 7 ට මා මැෂිමේ ඉඳ ගන්නේ
8 වන විටදි මිස් මා වෙත එන්නේ
ප්‍රඩක්ෂන් කීයද කියා මාගෙන් අසන්නේ
දෙන්නට හැකි ගාන මා එහි කියන්නේ

පපුවෙ අමාරුව මා හට හැදෙන්නේ
සික්රූම් යන්න කියලා මිස් කියන්නේ
පැය කාලක් පමණ මා එහි රැඳෙන්නේ
නැවතත් ඇවිත් මා මැෂිමේ ඉඳ ගන්නේ

අම්මා නොමැත අප ගේ මේ දුක් දන්නේ
මගේ සිත පමණි මා විදිනා දුක් දන්නේ
උදේ ගොසින් රෑ වෙන කොට මා එන්නේ
ඇඟේ වේදනාවෙන් මා පසු වෙන්නේ

නිවාඩුවක් වත් නැහැ අපහට දෙන්නේ
හදිසි වෙලාවට පමණයි එය දෙන්නේ
බැන බැන ගොසින් ලීව් අත්සන් කර දෙන්නේ
දුප්පත් අපිව මේ විලසින් රිද වන්නේ

ලේ කිරි කර වැඩූ මගේ අම්මාට
දහදුක් විඳ ඇති දැඩි කළ පියාහට
ශිල්ප සතර දුන් මාගේ ගුරුතුමාට
දෝත නගා වඳිනව මම හැම දෙනට

**මැණිකේ මෙනෙවිය**
අම්පාර

උපුටා ගැනීම - 1987 ජූලි - අගෝස්තු 'ඩාබිඳු' පුවත්පතෙනි.

මැණිකේ සහෝදරියගේ
'ජීවිතය' නැමති කවි පන්තිය

අම්පාරේ සිට වෙළඳ කලාපයට සේවයට පැමිණි ජයසුන්දර මැණිකේ සහෝදරිය කටුනායක ප්‍රදේශයේ වැඩ කළේ ස්ටාර් ගාමන්ට් ආයතනයේයි. ඇය නේවාසිකව සිටියේ කටුනායක ප්‍රදේශයේ යි. විවියන් ප්‍රනාන්දු පැවිදි සොයුරිය විසින් ඇයට දැනුම් දී තිබුණේ ඩාබිඳු පත්තරයට ලිපි හෝ කවි ලියන ලෙසයි. ඇය 'ජීවිතය' නැමැති කවි පන්තිය ඩාබිඳු වෙත ලියා එවූ අතර එය 1987 ජූලි කලාපයේ පල කෙරුණි. එහි අඩංගු වී තිබුණේ සිය වැඩපල තුළ සිදුවන අසාධාරණකම් සහ ඇගේ දින චර්යාවයි. මෙම කවි පෙළ ලියූ වරදට ඇය කාර්යාලයට කැඳවා එම ලියූ කවි පෙළ අසත්‍යයක් බවට ඇගෙන් ලිපියක් ඉල්ලා ඇත. ඇයව පොලිසියට ගෙන යන බව පවසා බලෙන් ලිපියක් ලියවාගෙන ඇය වැඩ තහනමට ලක් කෙරුණි. ඇය සිය වැටුපෙන් පවුල නඩත්තු කළ නිසා ජීවිතය පවා නැති කර ගැනීමට සිතූ බව ඇය අපට පසුව පැවසුවාය. ඇයගේ බෝඩිම් ගාස්තු හා මාසිකව නිවසට යවන වියදම් ද ඇය වෙනුවෙන් යැවීමට ඩාබිඳු හරහා සැලසුම් කළෙමු. ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය තුළින් මේ සිදුවීම පිළිබඳව මාධ්‍ය ප්‍රචාර ලබා දෙන්නට විය. අවසානයෙහි දී මේ සිදුවීම පාර්ලිමේන්තු සභාවාරයක දී පවා සාකච්ඡාවට භාජනය වූ අතර හැන්සාඩ් වාර්තාවට ද එය ඇතුළත් විය. ඩාබිඳු සහ අනෙකුත් සංවිධාන ඒකරාශී වූ උද්ඝෝෂණ සහ ජර්මනියේ ස්ටාර් ගාමන්ට් පාලකයින් වෙත බලපෑම් ලිපි යැවීමෙන් නැවත රැකියාව ලබා ගැනීමට සමත් විය. මෙය ඩාබිඳු පුවත්පත ලැබූ විශිෂ්ට ජයග්‍රහණයකි.

1987 ස්මාර්ට් ෂර්ට් ආයතනයේ සේවය කළ කාන්තාවක් වන කේ. ඩබ්ලිව්. ජී. කේ. මැණිකේ සොයුරිය මසමින් සිටින විට මැෂිමේ ඉඳිකටුව කැඩී ඇගේ ඇසේ ඇනීම නිසා නිලධාරීන් ඇයව රෝහලට ගෙන ගොස් ඇත. එහිදී ඇයගේ ඇස ඇතුළේ ඉඳිකටු කැබලි තිබෙන බව පැවසූ

වෛද්‍යවරුන් විසින් ඇයව ශල්‍යකර්මයකට භාජනය කළ නමුත් පසුව ඔවුන් පවසා ඇත්තේ එවැනි ඉඳිකටු කැබලි ඇස තුළ නොමැති බවත් උපතින් ඇගේ ඇස් පෙනීම දුර්වලව තිබෙන බවත් ය. මේ සඳහා රුපියල් 64 ක වන්දි මුදලක් ආයතනය විසින් ඇයට ලබා දී තිබුණි. ඩාබිඳු පුවත් පතෙහි පළ වූ මෙම සිදුවීම උපුටා ගෙන ඉරිදා දිවයින සංග්‍රහයේ ද පළකොට තිබූ අතර මෙයින් උරණ වූ පාලකයින් පවසා තිබුනේ අප බොරු වාර්තා සැපයූ බවයි. මැණිකේ පුස්සැල්ලාවේ සිට කටුනායක වෙළඳ කලාපයට පැමිණි තරුණියෙකි. ඇයට උපතින්ම ඇස් නොපෙනෙන ආබාධයක් තිබුණේ නම් ඇය රැකියාවට බඳවා ගනු ලබන අවස්ථාවේ දී කරන පරීක්ෂණවල දී එය නොපෙනුනේ මන්ද යැයි තවදුරටත් අපට ඉතිරි කළ ප්‍රශ්නයයි. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඇගේ පියා ගෙන්වා ඔහුට අවශ්‍ය උපදෙස් සහ නීති ආධාර ලබාදීමට අපට හැකි විය. පසුව ඇයගේ පියාට ආයතනය විසින් රුපියල් 4,500ක මුදලක් වන්දි ලෙසින් ලබා දී ඇත.

නෝර්ත් සෙයිල් ආයතනයේ සේවය කරන සේවිකාවන් හට සිදුවන විවිධ අසාධාරණකම් පිළිබඳව ඩාබිඳු පුවත්පත මඟින් කරුණු හෙළිදරව් කළෙමු. එහිදී කළමනාකරු යන වචනයට ගැහැණිය කියා ලියා තිබීම හේතුවෙන් එම ලිපිය ඇතුළත් ඩාබිඳු පුවත් පත රැගෙන අප කාර්යාලයට ඇය පැමිණියේ මා හට නඩු පවරන බව පවසමිනි. ඔවුන් BOI මණ්ඩලයට ද මේ පිළිබඳ පැමිණිල්ලක් කර තිබුණි. අප කාර්යාලයට හදිසියේම පැමිණි ඇය අපෙන් ඉල්ලා සිටියේ, එම තොරතුරු ඇතුලත් ලිපිය ඇය වෙත ලබාදෙන ලෙසයි. ඇයට අවශ්‍ය වූයේ අත් අකුරු නිරීක්ෂණය කිරීම මඟින් ලිපිය ලියූ සේවිකාව හඳුනාගෙන ඇයට දඩුවම් කිරීමටයි. එසේ නොදුනහොත් ඩාබිඳු පුවත් පතට එරෙහිව කටයුතු කරන බව ඇය විසින් දන්වා සිටින ලදී. පුවත් පත් වෘත්තියේ ආචාර ධර්මවලට අනුව අදාළ මූලාශ්‍ර ආරක්ෂා කිරීමට අප බැඳීසිටි බැවින් එම ලිපිය ඔවුන් අතට ලබා දීම අප විසින් ප්‍රතික්ෂේප කරන ලදී. ඩාබිඳු පුවත් පත සඳහා ලැබෙන ලිපි තොරතුරු නැවත ටයිප් කර මුද්‍රණාලයට යැවීමට අප කටයුතු කරන ලද්දේ සැබැවින්ම ඒවා ලබාදෙන කම්කරුවන්ගේ ආරක්ෂාව සහතික කිරීම පිණිස ය.

BOI අප ආයතනයට පැමිණ වෙළඳ කලාපයේ තොරතුරු අප වෙත ලැබෙන බැවින් එම තොරතුරු ඔවුන් විසින් නිකුත් කිරීමට නියමිත

සඟරාවට ද ලබාදෙන ලෙස ඉල්ලා සිටියේ ඉහත සිදුවීම්වලට පසුවයි. එසේම ඕනෑම අවස්ථාවක BOI ආයතනය වෙත ඇතුල්වීමට අවසර සහිත කාඩ් පතක් අප වෙත ලබාදීමට ද ඔවුන් කටයුතු කරන ලදී. එහෙත් ඩාබිඳු සාමූහිකයේ තීරණය වූයේ BOI හි සැඟවුණු අරමුණු ඉෂ්ඨ කර ගැනීමට අප ඔවුන්ට අවස්ථාව ලබා නොදිය යුතු බවටයි.

ඇතැම් සහෝදරියන් තම කර්මාන්තශාලා තුළ සේවය කරන විට මුහුණ දීමට සිදුවන අසාධාරණකම් ඩාබිඳු පුවත්පතට ලියා එය පළ වූ පසු එම පත්තර පිටුවේ කෑම ඔතාගෙන ගොස් එය පාලකයින්ගේ නෙත් ගැටෙන තැන් වල දමා යාමට ඔවුහු පටන් ගති. මෙම තොරතුරු දුටු පාලකයින් එම කරුණු සම්බන්ධයෙන් සොයා බැලීමට පවා නැඹුරු වී තිබුණි. වෘත්තීය සමිති අයිතිවාසිකම් නොමැති තත්ත්වයක් තුළ තම ප්‍රශ්න පාලකයින් වෙත ඉදිරිපත් කිරීමේ මාර්ගයක් ලෙසින් කම්කරු සහෝදරියන් විසින් මෙවැනි උපක්‍රම භාවිතා කරන ලදී.









කම්කරුවන් දැනුවත් කිරීම පිණිස මුද්‍රණය වූ පොත් පිංචයන්

විවිධ වූ ප්‍රකාශන, ලිපි ලේඛන ඔස්සේ කම්කරුවන්ට තම අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුම ලබා දීමට ඩාබිඳු කණ්ඩායම හෙලූ දා බිඳු අපමණය.

මේ සමයෙහි නිදහස් වෙළඳ කලාපය ඇතුළත ඩාබිඳු පුවත්පත හෝ කිසිම පත්‍රිකාවක් බෙදාහැරීම තහනම්ව තිබුණි. ඩාබිඳු පුවත්පත කටුනායක ප්‍රදේශයේ අතුරුපාරවල බෙදා හැරීමේ දී පොලිසිය පැමිණ පුවත්පත සමඟ අපව පොලිසියට රැගෙන ගිය අවස්ථා බොහොමයක් විය. සැබැවින්ම පොලීසියට අවශ්‍ය වූයේ කර්මාන්තශාලා හිමිකරුවන්ගේ

අරමුණු ඉටු කරමින් කම්කරුවන් සංවිධාන ගතවීම වළක්වාලීමයි. එසේ රැගෙන ගිය අවස්ථාවන් වලදී ඩාබිඳු පුවත් පත රජයේ ලියාපදිංචි වූ නීත්‍යානුකූල පුවත් පතක් බවට අනන්‍යතාවය ඔප්පු කිරීමෙන් පසුව ඔවුන් අපව නිදහස් කරනු ලබයි.

මේ කාලය තුළ කම්කරුවන්ට සිය අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීමට මාර්ගයක් නොමැතිව මහ මගට ඇද වැටීමට සිදු වූ නමුත් පාලකයින් කිසි දිනක නොසැලුනේ BOI කාර්යාලය අසල රැකියා සඳහා දහස් ගණනක් රැකියා පෝළිමේ සිටි බැවිනි. බොහෝ හැල හැප්පීම් මැද නිදහස් වෙළඳ කලාපය තුළ සේවය කළ ශ්‍රමිකයින් හට විවිධ සංවිධානවලින් කෙරුණු දැනුවත් කිරීම් මෙන්ම ඩාබිඳු සාමුහිකය විසින් කරන ලද දැනුවත් කිරීම් ඔස්සේ ද ඔවුන්ට සිදුවන අසාධාරණයන් ලොවට හෙළි කිරීමට උත්සාහ ගැනුණි. පුවත් පත පවත්වාගෙන යාමේ අභියෝගයට මුහුණ දෙමින්ම කම්කරු සහෝදරියන්ගේ නිර්මාණ හැකියාවන් ඒ ඔස්සේ පෝෂණය කරමින් ඔවුන්ගේ සහජ කුසලතාවයන් ඔප් නංවා ගැනීමට ඩාබිඳු පත්තරය හරහා අපට හැකි විය.



සහයෝගිතා කමිටුව

එමෙන්ම ඩාබිඳු විකිණීම සඳහා කඩ සාප්පුවලට දැමූ පසුව කර්මාන්තශාලා හාම්පුතුන් පැමිණ ඩාබිඳු පුවත්පත නොගන්නා ලෙස පවසා වෙළඳ ආයතන හිමිකරුවන්ට තර්ජනය කරන තත්ත්වයක් ද උද්ගත විය. කලාපය තුළ පැවතියේ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ මුද්‍රණය කළ පත්‍රිකාවක් බෙදා හැරීම පවා තහනම් වූ තත්ත්වයකි. එමෙන්ම මැරවරයින් යොදවා ඒවා උදුරාගෙන ගිය අවස්ථා ද බොහෝය. ස්ත්‍රී දූෂණ, ලිංගික හිංසන, මංකොල්ලකෑම් යනාදිය පිළිබඳව ඩාබිඳු පුවත්පතට වාර්තා ලිවීම හෝ පළකිරීමට එරෙහිව ඔවුන් ගත් විවිධ ක්‍රියාමාර්ග විය. එම කම්කරුවන්ට කවියක්, කෙටි කතාවක්, නිසඳැසක් වත් ලිවීමට නිදහසක් නොතිබුණි. ඩාබිඳු හා ඒ අවට ක්‍රියාත්මකව පැවැති සංවිධාන එකතු වී සහයෝගීතා කමිටුවක් පිහිටුවා ඒ මඟින් කලාපය තුළ තිබූ දරදඬු පාලනය වෙනස් කිරීමට උත්සාහ ගැනීමට පෙළඹුනේ මෙම දරදඬු නීති රීති හේතුවෙනි.

මෙහි මුල් ආරම්භයක් ලෙසින් නිදහස් වෙළඳ කලාපයේ කම්කරු අයිතීන් වෙනුවෙන් වැඩකළ සංවිධාන, වෘත්තීය සමිති සහ ආයතන එක්ව සහයෝගීතා කමිටුව පිහිටුවා ගතිමු. මෙහි පළමු උද්ඝෝෂණය 1992 නොවැම්බර් 7 වන දින කටුනායක දී පැවැත් වූ අතර එයට සංවිධාන හතලිස් තුනක සහභාගිත්වය ලැබී තිබුණි. එම උද්ඝෝෂණ ව්‍යාපාරය කඩාකප්පල් කිරීමට මැර ප්‍රහාර ද එල්ල වූ අතර කඳුළු ගෑස් සහ රබර් උණ්ඩ වලින් වෙඩි තබන්නට ද විය. ඒ අවස්ථාවේ දී මා හා වයලා අබේගුණවර්ධන ද මැර ප්‍රහාරයන්ගෙන් බේරුනේ බෝඩිං වත්තකට පැන ගැනීමෙනි. ඔවුන් අත තිබුණේ උදළු මිටි තරම් පොලුය. එම පොලු පාරවල් අපේ හිසට වැදුනානම් අප අද ජීවතුන් අතර නැති වන්නටත් ඉඩ තිබුණි. උද්ඝෝෂකයින් සියලු දෙනාටම පාහේ මෙම මැර ප්‍රහාර වලින් මිදීමට ඉමහත් පරිශ්‍රමයක් දරන්නට සිදු විය. මාධ්‍ය ආවරණයට පැමිණ සිටි මාධ්‍යවේදීන්ගේ කැමරා උදුරා ගත් අතර උද්ඝෝෂණයට සහභාගි වීමට පැමිණි බස් රථ වලට ද ඔවුහු පහර දුන්හ. මෙම උද්ඝෝෂණය සංවිධානය කළ බ්‍රිටෝ ප්‍රනාන්දු සහ ඔහුගේ බිරිඳ ද, ජයන්ති දංදෙණිය සහෝදරිය ද මෙහි දී සිර භාරයට ගනු ලැබීය. මේ දිනයේ එනම් නොවැම්බර් 7 වනදා කලාපය එකම යුද පිටියක් බවට පත් විය. මෙය නිදහස් වෙළඳ කලාප සටන් ඉතිහාසයේ නොමැකෙන දිනයක් ලෙසින් සැලකිය හැකිය.

# නිදහස් වෙළඳ කලාපය තුළ රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරීත්වය

ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප, කටුනායකින් ආරම්භ කර දැනට වසර 50 කට ආසන්නය. දශක භාගයක් ගෙවී ගිය ද තවමත් මෙහි කම්කරු අයිතිවාසිකම් තහවුරු වී නොමැත. වෘත්තීය සමිතියක් පිහිටුවා ගැනීම සඳහා පවතින නීති ප්‍රතිපත්ති වෙනස් වීමේ ක්‍රියාවලිය පවතින්නේ මන්දගාමී තත්ත්වයක ය. අපි අද තවමත් මේ සඳහා අරගල කරමින් සිටිමු. විවිධ ආණ්ඩු විසින් වරින් වර කම්කරු නීති ප්‍රතිසංශෝධනයට ලක් කරන බැවින් වෘත්තීය සමිති පිහිටුවාගෙන ඉදිරියට යාමට බොහොමයක් කම්කරුවන්ගේ එතරම් උනන්දුවක් දක්නට නැතිවීම කණගාටුදායක තත්ත්වයකි. මෙයට තවත් එක් හේතුවක් වන්නේ කම්කරුවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් පිටුදැකීමේ උපාය උපක්‍රම, ආයෝජන මණ්ඩලය, හාම්පුතුන් සහ රාජ්‍ය පාලකයින් එක්ව සැලසුම් සහගතව සකස් කරනු ලැබීමයි. නායකත්වය ගොඩනැගීමට අවස්ථා නොදීම, ඔවුන්ගේ ප්‍රශ්න සාකච්ඡා කිරීමට අවකාශයක් නොතිබීම යනාදිය මෙයට බලපාන හේතූන් වේ. එම කාලය තුළ කම්හල් ගණනාවක වැඩ වර්ජන දිගු කාලයක් පැවතුණ ද එහිදී කම්කරුවන් වෘත්තීය සමිති වටා ගොනුවීමක් දක්නට නොතිබුණු අතර ඔවුන්ට නායකත්වය දරමින් වැඩ කිරීමට අවශ්‍ය කාලය කැපකිරීමට ඇති අපහසුතාවය ද බහුතර කම්කරුවන් සමාජ සංවිධාන සමඟ සම්බන්ධයක් නොතිබීම ද මෙයට හේතු ලෙසින් දැක්විය හැක. එසේම නායකත්වය දැරූ කම්කරුවන් ආයතනයෙන් නෙරපා හැරීම ද ඇතැම් කම්කරුවන් අතුරුදහන් කිරීම ද හේතුවෙන් ඔවුහු වෘත්තීය සමිති වටා එකතුවීමට බියක් දැක්වූහ.





**සිරිමල් පීරිස් සහෝදරයා සහ බ්‍රිටෝ සහෝදරයා සම්පත්දායකත්වය ලබා දෙමින් සිදු කරන ලද වැඩසටහන්**



වේවැල්දෙණිය නේවාසිකාගාරයක් තුළ සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහනක් අතරතුර

එහෙත් රාජ්‍ය නොවන සංවිධාන කීපයක් ලෙසින් අපි, ඩාබිඳු සාමූහිකය, කම්කරු නීති උපදෙස් මධ්‍යස්ථානය, කම්කරු සෙවන, කලාපයේ අපි, නිදහස් වෙළඳ කලාපයේ සේවකයින්ගේ ඒකාබද්ධ කමිටුව යනාදී සංවිධාන ගණනාවක් එක්ව මේ වනවිට කම්කරුවන්ගේ වැඩ වර්ජනවලට සහ උද්ඝෝෂණවලට පූර්ණ සහයෝගය ලබා දෙමින් සිටියෙමු. කටුනායක වෙළඳ කලාපය තුළ රජයේ රෝහලක් නොතිබීම, සාධාරණ මිලට බඩුභාණ්ඩ මිලදී ගැනීමට වෙළඳපලක් නොතිබීම යනාදී හේතු නිසා රෝහලක් සහ සතොස වෙළඳ මධ්‍යස්ථානයක් රජයෙන් ලබා ගැනීමේ රාජ්‍ය නොවන සංවිධාන විසින් විශාල උත්සාහයක් දරනු ලැබුවේය. මෙහි ප්‍රතිඵලයක් ලෙසින් සතොස වෙළඳ මධ්‍යස්ථානයක් ඇවරිවත්ත ප්‍රදේශයේ ස්ථාපනය වුවද රෝහලක් ලබාගැනීමේ සිහිනය තවමත් එලෙසම පවතී. එහෙත් තරමක් හෝ සෑහීමට පත්වන්නට හැකි වී තිබෙන්නේ මෙම උද්දේශන ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් ලෙසින් අවට රෝහල්වල (මීගමුව සහ සීදූව) නේවාසික ප්‍රතිකාර ලබා ගැනීමේ දී වෙළඳ කලාපයේ සේවකයින්ට ප්‍රමුඛතාවයක් ලබා දීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මකව තිබීම හේතුවෙනි.









බියගම විවිධ වැඩවර්ජන අවස්ථා

# රාජ්‍ය මර්දනය ක්‍රියාත්මක වීම
# ලයනල් සහ රංජිත් අතුරුදහන් කරවීම




1989 ඔක්තෝබර් 27 යනු කිසි දිනෙක අමතක කළ නොහැකි දිනයක් බවට පත්වූවේ රංජිත් සහ ලයනල් සහෝදරවරුන් අතුරුදහන් කොට ඝාතනය කළ ශෝචනීය දිනය එදින වීම හේතුවෙනි. එය භීෂණය හතර

අතින් රජකළ වකවානුවෙහි එක් දිනයකි. මේ දවසේ මමත් මගේ සැමියාත් පුස්සැල්ලාවේ දමිළ වත්තක පැවැති දීපවාලී උත්සවයකට සහභාගී වී පසුදින නිවස වෙත ආපසු පැමිණෙමින් සිටියෙමු. පුතා දුවගෙන අප ළඟට පැමිණ "තාත්තේ ලයනල් මාමයි රංජිත් මාමයි මරා දාලා රද්දොළු හන්දියේ පුච්චලා, රුවන් ඇන්ටි කීවා" යි පැවසුවේය. සිදුවීම අසා තිගැස්සුන අප දෙදෙනා වහා රද්දොළුගමට සහ කටුනායකට ගියද, ඔවුන් දෙදෙනා පිළිබඳ තොරතුරු කිසිවක් දැන ගැනීමට නොලැබුණි. ඒ මොහොතේ ඇසින් දුටු සාක්ෂි කිසිවක් දැන ගැනීමට නොතිබිණි. කෙසේ හෝ ඔවුන් දෙදෙනා ද අතුරුදහන් වූවන්ගේ ලැයිස්තුවට එක් වුණි.

රංජිත් සහ ලයනල් යන සහෝදරවරු කිසිම රාජද්‍රෝහී කටයුත්තක නිරත නොවූවන් බව පැහැදිලිවම දනිමු. ඔවුන් දෙදෙනා කම්කරුවන්ට සිදුවන අසාධාරණයන්ට එරෙහිව කැපවීමෙන් කටයුතු කළ සහෝදරයින් දෙදෙනෙකි. රංජිත් සහෝදරයා මා සමඟ සමීපව කටයුතු කළ අතර ලයනල් සහෝදරයා සෝමේ සමඟ කම්කරු නීති උපදේශන මධ්‍යස්ථානයේ නීති උපදේශකවරයෙකු වශයෙන් කටයුතු කළේය. රංජිත් සහෝදරයා කටුනායක නිදහස් වෙළඳ කලාපය තුළ පිහිටි ෆ්ලෝරල් ග්‍රීන්ස් ආයතනයේ සේවය කෙරුවෙකි. මෙය ඉටිමල් නිෂ්පාදනය කරනු ලබන ආයතනයකි. එහි වැඩ කිරීමට සපයා තිබූ මැෂින් අබලන් තත්ත්වයෙන් යුතු ඒවා විය. මේ හේතුවෙන් කම්කරුවන්ගේ ඇඟිලි මැෂින්වලට හසුවීම සහ ඉටි ද්‍රාවණය ඇස්වලට විසිවීමෙන් අනතුරු වලට ලක් වීම නිරන්තරයෙන් සිදු වෙමින් තිබුණි. මෙම ආයතනයට සම්බන්ධව වෘත්තීය සමිතියක් නොතිබූ අතර නිතර සිදුවන කාර්මික අනතුරුවලට මැදිහත් වූයේ රංජිත් සහෝදරයා යි. මෙම අනතුරු සම්බන්ධයෙන් ඩාබිඳු පුවත්පතට නිතරම තොරතුරු ලැබුණි. පාලකයින් රංජිත් පිළිබඳව සැකයෙන් බැලීම ආරම්භ කර තිබුණේ, ඔහු කම්කරුවන් අනතුරුවලට මුහුණ දීමේදී ඒ වෙනුවෙන් ඉදිරිපත්ව කටයුතු කළ බැවිනි.

රංජිත් හා එහි වැඩ පරීක්ෂකයෙකු අතර ආරවුලක් පැන නැගී තිබුණේ මෙම කම්කරු අනතුරු හේතුවෙනි. මෙම ආරවුල පදනම් කරගෙන රංජිත් සහෝදරයා වැඩ තහනමට ලක්ව සිටි අතර ඒ සම්බන්ධයෙන් ගෘහස්ථ පරීක්ෂණයක් ෆ්ලෝරල් ග්‍රීන්ස් ආයතනය තුළ පැවැත්වීමට පාලකයින් විසින් කටයුතු සූදානම්කර තිබුණි. එහෙත් පැවැති

නීතිය වූයේ මෙවැනි ගෘහස්ථ පරීක්ෂණ ආයෝජන මණ්ඩල (BOI) භූමිය තුළම පැවැත්වීමයි. එහෙත් මෙම පරීක්ෂණය ෆ්ලෝරල් ග්‍රීන්ස් ආයතනය තුළ පැවැත්වීම සම්බන්ධයෙන් සැකයක් මතුව තිබුණි. පරීක්ෂණයේ දී රංජිත් සහෝදරයාගේ පාර්ශවය වෙනුවෙන් නීති උපදෙස් සඳහා ලයනල් සහෝදරයා පෙනී සිටි අතර ආයතනය වෙනුවෙන් පෙනී සිටියේ ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ නීතිඥ මහතා ය. පරීක්ෂණය පැවැත්වීමට වේලාව දී තිබුණේ සවස 4 ට වුවද අවසානයේ දී එය පවත්වා තිබුණේ එදින රාත්‍රී හතට පමණය. වුවමනාවෙන්ම මෙය කල්දැමුණු බවක් දකින්නට තිබූ බව පසුව මේ සම්බන්ධයෙන් නීතිඥ ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මහතා විසින් ලබාදුන් කට උත්තරයෙහි සඳහන්ව තිබුණි. මෙම ගෘහස්ථ පරීක්ෂණයේ දී තීරණය වී තිබුණේ හිඟ වැටුප් සමඟ නැවත ඔහු සේවයෙහි පිහිටුවන ලෙසයි. පරීක්ෂණය අවසන්ව ලයනල් සහ රංජිත් සහෝදරවරු නිවෙස් වෙත පැමිණ තිබුණේ ලයනල් සහෝදරයාගේ පාපැදියෙනි. ප්‍රදේශවාසීන් විසින් ඉදිරිපත් කළ තොරතුරු වලට අනුව කියවුනේ, රංජිත් සහෝදරයා වී මෝල පාරේ පිහිටි ඔහුගේ නේවාසිකාගාරය වෙතට ඇරලීමට යන අවස්ථාවේදී සුදු වෑන් රථයක් ඔවුන් පැමිණි මග අවුරමින් ඔවුන් දෙදෙනා පැහැරගෙන ගිය බවයි. පසුව දැනගන්නට ලැබුණේ ඔවුන් දෙදෙනාගේ සිරුරු රද්දොළුගම පල්ලිය ඉදිරිපිට පිළිස්සෙමින් තිබුණු බවයි.

මෙම සිදුවීම ඩාබිඳු සාමූහිකයට ඉතා බරපතල ලෙසින් බලපාන්නට විය. එයට හේතු වූයේ, කලාපය තුළ වූ විවිධ වෘත්තීය අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ කටයුතුවල දී අප එකට එක්ව කටයුතු කළ බැවිනි. රංජිත් සහ ලයනල් එදින සිය නිවෙස් වෙත ආපසු නොයන විට පවා එම පවුල්වල අය තීරණය කර තිබුණේ රාත්‍රියේ මහ මග ගමන් කිරීමේ අපහසුව නිසා අදාළ පරීක්ෂණය නිමවීමෙන් පසුව ඔවුන් දෙදෙනා එදින රාත්‍රියේ අප නිවසේ නතර වන්නට ඇත කියාය. පසුදින උදේ ඔවුන් නිවෙස් වෙත නොයන කල ඔවුන් දෙදෙනාගේ භාර්යාවන් ඔවුන් සොයාගෙන පැමිණ තිබුනේ අප නිවෙස වෙතය.

ලයනල් සහ රංජිත් සහෝදරයින් දෙදෙනාගේ අතුරුදහන් වීමෙන් පසුව රට තුළ පැවැති භීෂණය හමුවේ, අපට මුහුණ දෙන්නට සිදුවූයේ ද අවදානම් සහගත තත්ත්වයකට ය. ඩාබිඳු කාර්යාලය අපගේ නිවසේ කොටසක පවත්වාගෙන යමින් තිබීම විසින් මෙම තත්ත්වයන් තව දුරටත්

සංකීර්ණ විය. එමෙන්ම තරුණ වයසේ පසු වූ දරුවන් හතර දෙනෙකු ආරක්ෂා කර ගැනීමේ අභියෝගය අප හමුවේ විය. අතුරුදහන් කළ ලයනල් සහ රංජිත් ගෙන් කුමන ප්‍රශ්න අසන්නට ඇති ද? අපගේ වැඩ සම්බන්ධයෙන් වන තොරතුරු ලබා ගැනීමේ ප්‍රශ්න මොනවා හෝ ඒ අතර තිබුණේද? අප දෙදෙනාටත් මේ ඉරණමටම ගොදුරු වීමට සිදු වේද? වයස අවුරුදු විස්සක් වූ වැඩිමහල් පුතුවත් රැගෙන යාවී ද? ගැහැණු ළමුන් දෙදෙනාට කිසියම් හෝ කරදරයකට මුහුණ දෙන්නට සිදුවේ ද? යනාදී වශයෙන් වූ විවිධාකාර සිතිවිලි කන්දරාවකින් අපේ හදවත් ගැහෙන්නට විය. මෙකල සෑම අතින්ම ඝාතන සහ අතුරුදහන්වීම් සිදුවෙමින් තිබුණු අතර මිනිසුන් මහමග දැවෙමින් තිබුණු කාලයක් විය. රාත්‍රී කළුවර වැඩීගෙන එන විට, රාත්‍රියේ බල්ලන් බුරන විට, හමුදා පොලිස් රථ වාහන පාරේ එහා මෙහා යන විට, වෙඩි ශබ්ද ඇසෙන විට, අපේ හදවත් තුළ නැගුණු භීතිය කොතරම් දැයි කියා නිමකළ නොහැකි විය. අඳුර වැටෙන්නේ නැත්නම් කොතරම් හොඳ දැයි කියා අප සැවොම සිතන්නට විය. කම්කරු අයිතිවාසිකම්, මානව අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම් සහ පොදු සමාජ සුභ සාධනය සඳහා අප වැඩ කළා මිස කිසිඳු දේශපාලන පක්ෂයකට සම්බන්ධව කටයුතු නොකළ නමුත් කොයි මොහොතේ අතුරුදහන් වීමකට ගොදුරුවීමට සිදුවේදැයි යන බියෙන් ජීවත් වීමට අපට සිදුවුණි.

අප සමඟ සහයෝගීතාවයෙන් වැඩ කළ පිරිස් සහ හිතවතුන් අපට කියා සිටියේ ටික කලකට හෝ නිවස අතහැර යන ලෙසයි. එහෙත් අප නිතරම ඔවුන්ගෙන් පෙරලා අසා සිටියේ, කිසිම වරදක් නොකොට අප එලෙස සැඟ වී සිටින්නේ ඇයිද යන්නයි. ලෝකය හමුවේ අප එලෙස කියා සිටිය ද මහ මග මරා පුළුස්සන තරුණයින් ගැන කතා අසන විට තරුණ වයසේ වූ ලොකු පුතාට කොයි මොහොතක හෝ පීඩාවක් වෙතැයි යන බියෙන් ජීවත් වීමට අපට සිදු විය. ගෝනි බිල්ලන්, කහ බළලුන් යනාදී විවිධ නම්වලින් ඝාතන කණ්ඩායම් ක්‍රියාත්මක වෙමින් සිටි අතර රාත්‍රී කාලයෙහි නිවෙස්වල විදුලි පහන් දැල්වීම තහනම් විය.



රද්දොළුගම හන්දියේ දී ලයනල් රංජිත් සොයුරන් සමරන අවස්ථාවක්

# භීෂණ සමය සහ පවුලේ ආරක්ෂාව

නිවෙස් ඇතුළේ විදුලි පහන් දල්වන්නට තහනම් වීම, හැඳුනුම්පත් එකතු කිරීම වැනි ක්‍රියාකාරකම් බහුලව සිදු වූ අවධියකට මුහුණ දීමට සිදුවීමත් සමඟ බොහෝ රාත්‍රීන් ගෙවා දැමීමට අපට සිදු වූයේ බියෙනි. හදිසියේ නැදෑයෙකු වාහනයකින් පැමිණිය ද දොර අරින්නට බිය වීමු. වැසිකිළි කැසිකිළි සඳහා හෝ රාත්‍රියේ දොර ඇරගෙන එළියට යන්නට අප බියවිය. බොහෝ දිනවල අපි හය දෙනා රාත්‍රිය ගත කරන්නේ හය පොලකය. විශේෂයෙන් දරුවන්ගේ ආරක්ෂාව පිණිස අපි ඔවුන් වෙනත් නිවෙස්වල නිදි කරවීමු. එහෙත් ඔවුන්ට පසුදා උදේ පාසල් යන්නට අවශ්‍ය නිසා පාන්දරම යළි නිවසට පැමිණේ. ඒ පැමිණෙන විටත් ජීප් රථයක හෝ මොනයම්ම හෝ වාහනයක ටයර් සලකුණු මිදුලේ වේදැ යි සොයා බලා පැමිණීමට අපි සියළු දෙනා වගබලා ගතිමු. ඇතැම් දිනවල මේ පිළිවෙත දිගින් දිගටම පවත්වාගෙන යාම පීඩාවක් වූ කළ වෙන දෙයක් වුනාදෙන් කියා අප හය දෙනා එකට වැටී නිදා ගත් අවස්ථාවන් ද විය. මෙය ඉතා කටුක, මානසිකව බොහෝ පීඩාවෙන් දිවි ගෙවූ කාලයක් විය.

මේ අතර හදිසියේම පොලිසිය ඩාබිඳු කාර්යාලයට පැන සියළු දේ අවුස්සමින් අප කරන්නේ කුමක්දැයි අසමින් ඩාබිඳු විසින් මුද්‍රණය කරන කාන්තා අයිතිවාසිකම් පිළිබඳ කළ පත්‍රිකා සහ බෙදා හැරීමට තිබූ ඩාබිඳු පුවත්පත් රැගෙන මේවා බෙදා හරින්නේ කිනම් සංවිධානවලට දැයි විමසා

ඒවායෙහි ලිපිනයන් ද ඉල්ලා සිටීය. මේවා රැගෙන යාමට හෙට උදේ පොලිසියට පැමිණෙන ලෙස පවසා පත්‍රිකා මිටි සියල්ල ජීප් රථයට පටවා ගත්හ. ඉන්පසු මාගේ සැමියාගෙන් ප්‍රශ්න කරන්නට විය. ලයනල් සහෝදරයා සමඟ තියෙන සම්බන්ධය ගැන සහ ඔවුන් සම්බන්ධ සංවිධාන ගැන ද ප්‍රශ්න කරන්නට විය. පසුව ඔවුහු මාගේ පුතාගෙන් ද ප්‍රශ්න කරන්නට පටන් ගත්හ.

පසුදින මා පොලීසියට ගිය පසුව ස්ථානාධිපති විසින් ඔහුගේ කාමරයට මා කැඳවා ඩාබිඳු වලට මුදල් ලැබෙන්නේ කොහෙන් ද ආරම්භ කළේ කවුද යනාදී වශයෙන් වූ ප්‍රශ්න ගණනාවක් මගෙන් ඇසුවේය. මට වසන් කරන්නට කිසිවක් නොවීය. සියළු තොරතුරු ඔහු සමඟ පැවසීය. ඩාබිඳු විසින් නිකුත් කරන ලද ප්‍රකාශන රජයට සහ කම්කරු දෙපාර්තමේන්තුවට හා සංවිධාන වලට යවන බවත් කම්කරු ස්ත්‍රීන් වෙනුවෙන් අපි සේවය කරන බවත් පොලිස් ස්ථානාධිපතිතුමාට මා පැවසූ පැහැදිලි කිරීමෙන් සෑහීමකට පත්වුණි. ඉන්පසුව, ලිපි කටයුතු කරන පොලිස් නිලධාරියෙක්ට මා භාර කළ ස්ථානාධිපතිවරයා මාගෙන් වැඩිදුරටත් ප්‍රශ්න කරමින් ඒ සියල්ල ටයිප් කර ගන්නා ලෙසින් ඔහුට දැනුම් දෙමින් නික්ම ගියේය. එහෙත් ඔහු නැවත පොලිසියට එනවිටත් අදාළ නිලධාරියා මාගේ කටඋත්තර යතුරු ලියනය කරමින් සිටියේය. පොලිස් ස්ථානාධිපති පැමිණ "තවමත් ටයිප් කර ඉවර නැද් ද? මෙයාගේ පුතා තාම ගේට්ටුව ළඟ බලා ඉන්නවා යැයි කියමින්, "ඇයි අපි කොහේ හරි අරන් යයි කියලා හිතල ද?" කියමින් ඉක්මනින් මා පිටත් කර එවන ගමන් ඔහුගේ නිල කාඩ් පත මට දී එම සිද්ධියට සම්බන්ධව අත්අඩංගුවට ගැනීමක් හෝ යම් කරදරයක් සිදු වුවහොත් මේ අංකයට කතා කරන්නැයි කියා සිටියේය.

ලයනල් සහ රංජිත් සහෝදරවරුන්ගේ අතුරුදහන් වීමේ සිද්ධිය සම්බන්ධයෙන් කිසියම් ක්‍රියාමාර්ග එම අවස්ථාව වන විට ගනිමින් තිබුණි. බ්‍රිටෝ ප්‍රනාන්දු සහෝදරයාගේ සහයෝගය මේ සඳහා ලැබෙන බවක් ද මේ දෙදෙනාගේ විතරක් නොව තවත් අතුරුදහන් වූවන්ගේ තොරතුරු සොයමින් පවතින නමුත් ඇසින් දුටු සාක්ෂි නොමැති බැවින් එම සිද්ධීන් යටපත් වෙමින් පැවැති තත්ත්වයක් දකින්නට විය. එහෙත් ජයන්ති දංදෙණිය සොයුරිය ඇගේ පෙම්වතා වූ රංජිත් සහෝදරයා සොයමින් සිටියාය. එකල ලයනල් සහෝදරයා විප්ලවීය මාක්ස්වාදී පක්ෂයේ

සාමාජිකයෙක් වූ අතර ඔහුගේ නායකයා වූ උපාලි කුරේ සහෝදරයා එංගලන්තයේ සිටි බැවින් මෙම සිදුවීම ජාත්‍යන්තරය දක්වා ගොස් තිබුණි. ලයනල් සහෝදරයා අතුරුදහන් වන විට කුඩා ගැහැණු දරුවන් දෙදෙනෙකුගේ පියෙකි. උපාලි සහෝදරයා මේ පවුල නඩත්තු කරන්න සෑහෙන උදව් කළ අතර මගේ සැමියා ද ඔවුන්ව රැකබලා ගත්තේ ලයනල් ඔහුගේ හොඳම මිත්‍රයා වූ බැවිනි.

රංජිත් සහ ජයන්ති ආදර වන්තයින් වූ අතර ඒ දෙදෙනා පෙම්වතුන් ලෙසින් එකට ජීවත් විය. ජයන්ති වැඩ කළේ ස්මාර්ට් ෂර්ට් ආයතනයේය. රංජිත් ෆ්ලෝරල් ග්‍රීන්ස් ආයතනයේය. සමහර අවස්ථාවලදී 6-2 , 2-10 වැඩමුර වලට යන නිසා දෙදෙනාට එකට හමු වී කතා කිරීමට අවස්ථාවක් නොවීය. එහෙයින් ඔවුන් එකිනෙකාට ලිපි ලියා මේසය මත තබා යනවා මා දැක තිබුණි. දිනක් එවැනි ලිපියක් දුටු මා රංජිත්ට විහිළු කළේ තවමත් ලියුම් ලියනවා දැයි අසමිනි. එවිට ඔහු පැවසුවේ, අපි දෙන්නා වැඩමුර ක්‍රමයට වැඩ කරන නිසා කතා කරන්න, හමුවෙන්න වෙලාවක් නැහැ කියායි. ඩාබිඳු වලට කම්කරු වාර්තා ලබා ගැනීම සඳහා සතියකට සැරයක් මා ඔවුන්ගේ බෝඩිමට යන බැවින් රංජිත් සහ ජයන්ති දෙදෙනාම ළඟින් ආශ්‍රය කරන්නට මට අවස්ථාව ලැබුණි.

රංජිත් සහ ලයනල්ගේ අතුරුදහන් වීමෙන් පසු ජයන්තිගේ සහ ලයනල්ගේ බිරිඳ වූ රුවන්ගේ පවුලේ පිරිස ආරක්ෂා කිරීමට, පරීක්ෂණ කටයුතු සඳහා පෙනී සිටීමට මටත් මගේ සැමියා වන සෝමපාලට මෙන්ම බ්‍රිටෝ සහෝදරයාටත් භාර විය. ජයන්ති ඩාබිඳු සාමූහිකය තුළ සේවය කිරීමට පටන්ගත් පසු ඇය නිදහස් වෙළෙඳ කලාපයේ කම්කරුවන්ගේ අයිතීන් වෙනුවෙන් ක්‍රියාකාරී වූවාය. අදටත් ඇය අතුරුදහන් වූවන් සම්බන්ධයෙන් වූ සංවිධාන සමඟ සම්බන්ධ වී තම සැමියා සොයමින් සිටී. එම කාලයේදීම නිදහස් වෙළඳ කලාපයේ සේවය කළ තරුණයන් කීප දෙනෙකු අතුරුදහන් කර තිබුණි. අපේ පවුලේ සියලු දෙනා බේරුණේ අනු නවයෙනි. එසේ නොවූවානම් අපත් අතුරුදහන් ලැයිස්තුවට එකතු වනු ඇත.

එවකට රංජිත්ගේ වැඩිමහල් සහෝදරයා ලිපිකරුවකු ලෙස අගමැති කාර්යාලයේ සේවය කර ඇත. රංජිත් සහෝදරයා ෆ්ලෝරල් ග්‍රීන්ස් ආයතනය තුළ සිදු වන අසාධාරණයන්ට විරුද්ධව සටන් කළේය. මේවා

නොරිස්සු පාලකයින් සුපවයිසර් ලවා බොරු රණ්ඩුවක් පටලවා රංජිත් සහෝදරයාට පහර දී තිබුණි. රංජිත් මීගමු රෝහලට ඇතුළත් කර තිබුණි. ඔහු රෝහලෙන් සුව වී පැමිණි පසු ඔහුට විරුද්ධව ගෘහස්ථ පරීක්ෂණයක් ආයතනය තුළ පැවැත්වීමට පාලකයින් සැලසුම් කර තිබුණි. වැඩ තහනමට ලක් වී සිටි නිසා මා ඔහුගේ බෝඩිමට ගොස් වියදමට මුදලක් ඔහු අතට දී ආවේ ප්‍රවේශමෙන් ඉන්නා ලෙස අවවාද කරමිනි.

මෙම සමයෙහි දී අප පවුල සදාකාලික දුක් ගින්නකට ඇද දැමූ සිදුවීමක් වූයේ අපගේ ලොකු පුතා හදිසි අනතුරකට ලක්ව අප අතරින් සමුගැනීමය. ඒ අවාසනාවන්ත සිදුවීම සිදු වූයේ 1990 වසරේ නොවැම්බර් 16 දිනයි. මාගේ ජීවිතය දුකින් දුකට ඇද දැමූ ඔහුගේ මේ හදිසි වියෝව අප එතැනම නතර කරන්නට හේතු විය. සියළු සමාජ සේවා වැඩකටයුතු තාවකාලිකව නැවැත් වූ මා කාලය ගතකළේ හැඬූ කඳුළිනි. ඔහු ඉතාමත් අඩු වයසක දී වුව ද පවුලේ බර කරටගෙන කටයුතු කළ ආදරණීය දරුවෙකි. අද තවමත් ඔහු නැති අඩුව අපට දැනේ. උස් මහත් වූ තරුණ දරුවෙකුගේ වියෝව, ඔහුගේ ආදරය අහිමි වීම අප සියළු දෙනාගේම ජීවිත දශක ගණනාවකින් පසුපසට තල්ලු කිරීමට සමත් වීය. පසු කලෙක ඔහුගේ වියෝව මා දරා ගත්තේ වැඩි වැඩියෙන් සංවිධානයේ වැඩ කටයුතුවලට යොමු වීමෙනි.

# බියගම ඩාබිඳු ශාඛාව ආරම්භ කිරීම

බියගම නිදහස් වෙළඳ කලාපය තුළ සේවය කිරීමට පැමිණි ශ්‍රමිකයින්ට ගැටළු බොහොමයකට මුහුණ දීමට සිදු විය. මෙහි ශ්‍රමිකයන් හට යටිතල පහසුකම් කිසිවක් නොවුණි. නවාතැන් පහසුකම් ගැටළු, ප්‍රවාහන පහසුකම් නොමැති වීම, මග තොටේ දී අනාරක්ෂිත වීම, සෞඛ්‍ය සම්බන්ධයෙන් මුහුණ දීමට සිදුවන ගැටළු යනාදී වශයෙන් වූ ප්‍රශ්න ගණනාවකට ඔවුහු මුහුණ දෙමින් සිටියහ. මෙසේ බියගම නිදහස් වෙළඳ කලාපය තුළ ශ්‍රමිකයින් මුහුණ දෙන ගැටළු මෙන්ම ඔවුන්ට සිදුවන අක්‍රමිකතා මැඩලීම සඳහා 1991 දෙසැම්බර් 05 වන දින ස්ත්‍රී අධ්‍යාපන හා පුහුණුවීමේ ආයතනය නමින් ඩාබිඳු හි ශාඛාවක් එහි ආරම්භ කරන ලදී.

ග්‍රාමීය කෘෂි පවුල්වල ප්‍රජාව කෘෂි ආර්ථිකය කඩා වැටීමත් සමඟ දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දෙන්නට විය. මෙම දැඩි ආර්ථික කඩා වැටීම හේතුවෙන් ඇතැම් දෙනා සිය දිවි නසා ගැනීමේ තත්ත්වයන්ට පත් වෙමින් සිටියහ. මෙවැනි තත්ත්වයන් හමුවේ එම පවුල්වල තරුණ දරුවන් තම පවුලේ ආර්ථිකය නංවාලීම සඳහා කටයුතු කරන්නට පටන් ගෙන තිබුණි. ඒ අනුව බොහොමයක් තරුණ තරුණියෝ යුද හමුදා සේවයට එක් වීම හෝ නිදහස් වෙළඳ කලාප ආශ්‍රිත සේවය සඳහා සංක්‍රමණය වන්නට පටන් ගත්හ. බියගම නිදහස් වෙළඳ කලාපයට එක් වූයේ ද එවැනිම තරුණ තරුණියන් පිරිසකි.

මෙම කාරණා ද මූලික කර ගනිමින් කාන්තා කම්කරුවන්ගේ වෘත්තිය අයිතීන් සුරක්ෂිත කිරීමටත් මූලික සෞඛ්‍යය අයිතීන් සහ කම්කරු අයිතිවාසිකම් පිළිබඳව දැනුවත්භාවය ලබා දීම සඳහාත් බියගම ආරම්භ කරන ලද ඩාබිඳු සාමූහිකය කටයුතු කරන්නට විය. මෙම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා  මාගේ නැගණියගේ මිතුරියක වන ආර්.පී.පී. පෙරේරා මහත්මිය අප වෙත උපකාර කරන්නට ඉදිරිපත් වූවාය. ඇය ටෙරි ලංකා ආයතනයේ සේවය කළ නිසාවෙන් ඩාබිඳු බෙදා හැරීමේ කටයුතු වලට සහ නේවාසිකාගාර වලට ගොස් තොරතුරු රැස් කිරීමට ක්‍රියාකාරීව සම්බන්ධ විය. මෙහි දී පෙරේරා මහත්මිය මෙන්ම මාගේ සහෝදරිය වන සුනිලා රංජනී ද මූලිකත්වය ගෙන කටයුතු කරන්නට පටන් ගති. බියගම කලාපය තුළ සිදුවන අසාධාරණකම්, කම්කරු ප්‍රශ්න, මග තොටේ දී සිදුවන කාන්තා හිංසනයන් පිළිබඳ තොරතුරු මෙම ප්‍රදේශයේ ආරම්භ කරන ලද පළමු කාන්තා සංවිධානය වූ ස්ත්‍රී අධ්‍යාපන හා පුහුණු වීමේ ආයතනය ඔස්සේ අප වෙත ගලා ආවේය. එසේම කම්කරු කාන්තාවෝ ඩාබිඳු පුවත්පතට නිසදැස් කවි සහ කෙටි කතා නිර්මාණය කළහ.

පුස්තකාල සේවා, මැහුම් පන්ති, වීදි නාට්‍ය පුහුණු කුසලතා ආදී විවිධ වැඩසටහන් ගණනාවක් මෙහි දියත් කළ අතර කටුනායක සහ බියගම යන ආයතන දෙකෙහිම කටයුතු කිරීමට කුඩා කාර්ය මණ්ඩලයක් සතුව තිබූ අපහට එය තරමක දුෂ්කර කාර්යයක් විය. එහෙයින් බියගම ශාඛාවේ සේවය සඳහා සුනිලා රංජනී, ආර්.පී.පී. පෙරේරා , කුසුම් පෙරේරා, ගයනි දිල්රුක්ෂි, ඉන්ද්‍රානි සමරසිංහ යන අය එහි සේවයට බඳවා ගැනුණි.




මුල් කාලයේ බියගම කාර්ය මණ්ඩලය



බියගම දී සිදු කරන ලද කුසලතා පුහුණු වැඩසටහන්

මෙම සමයේ බියගම ආශ්‍රිතව පැවැති විවිධ වැඩසටහන් අද ද සිහිපත් කරන්නේ ආශ්වාදයෙනි. අප බොහෝ සුහද හමුවලදී එක්වීමු. කතා කළෙමු. දුක මෙන්ම සැප ද බෙදා ගත්තෙමු. මාර්තු 08 ජාත්‍යාන්තර කාන්තා දිනය අති උත්කර්ෂවත් ලෙසින් සැමරුවෙමු. වීදි බැස්සෙමු. සටන් පාඨ කියමින් හඬ නැගුවෙමු. මෙම බොහෝ වැඩසටහන් වලදී අපට නිරන්තරයෙන්ම සහාය ලබා දුන් පුද්ගලයින් රාශියකි. ඒ අතරින් එක් සුවිශේෂ පුද්ගලයෙක් වූවේ, සුනිලා අබේසේකර සහෝදරියයි. මාගේ මේ මතක සැමරුම් අතරට සුනිලා අබේසේකර සහෝදරිය පිළිබඳව වන මතක එකතු කරනු ලබන්නේ ඇය කෙරෙහි වන අතිමහත් ගෞරවය සහ ආදරය සිහිපත් කරමිනි. මෙලෙස අප පිටුපසින්ම සිටි තවත් බොහෝ පිරිස් පිළිබඳ සිහිපත් වේ. ඇනීටා ප්‍රනාන්දු සහෝදරිය මේ අතරින් තවත් එක් ප්‍රබල චරිතයකි. ඇය, ඉදිරියට යන අපගේ සංවිධාන ශක්තිය දෙස බලා සතුටු වූ අයෙකි. අපට ධෛර්යය දුන් අයෙකි.



විහාරමහාදේවි උද්‍යානයේ නිරාවරණ වැඩසටහනකට සම්බන්ධ වූ ඩාබිඳු සාමාජිකාවන්



බියගම පළමු මැයි දින සැමරුම



බියගම කාන්තා දින සැමරුම් අවස්ථාවක්





නිදහස් වෙළඳ කලාප කාන්තාවන් දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශනයක් පැවැත් වූ අවස්ථාවක්

# ඇන්සල් ලංකා කම්කරු සටනේ ජයග්‍රහණයට කැප වූ බියගම ඩාබිඳු

බියගම ඩාබිඳු මධ්‍යස්ථානයේ ප්‍රබලතම මැදිහත් වීමක් සනිටුහන් කරනු ලැබුවේ, 1994 පැවැති බියගම ඇන්සල් ලංකා සේවක වැඩ වර්ජනයයි. 50% කින් වැටුප් වැඩි කිරීම, වාර්ෂික නිවාඩු විසි එකේ සිට තිස්පහ දක්වා වැඩි කිරීම, වෘත්තීය සමිති පිළිගැනීම සඳහා ඉඩකඩ සකසා දීම, වෛද්‍ය ආධාර රුපියල් 1,000 සිට 2,000 දක්වා වැඩි කිරීම, සේවකයින් මාස හයකින් පසු, පුහුණු සේවකයින් ලෙසින් පත්කිරීම යනාදිය ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීම් අතර විය.

මෙම ඉල්ලීම්වලට ඇහුම්කන් නොදුන් පාලකයින් නිර්ලජ්ජිත ලෙස පොරොන්දු කඩ කරමින් සේවක දඩයමේ යෙදෙන්නට විය. මෙම තත්ත්වයන්ට එරෙහිව සිය අයිතිවාසිකම් වෙනුවෙන් 1993 වසරේ සිට ඇන්සල් සේවකයින් වරින් වර විවිධ වෘත්තීය ක්‍රියාකාරකම්වල යෙදුණි. මේ අතර ඇන්සල් සේවකයින් වෘත්තීය සමිතියක් ආරම්භ කිරීම සඳහා සිය කර්මාන්තශාලා පාලකයින්ගෙන් ඉල්ලීමක් කොට පාලකයින් එයට අවසර ලබා නොදීම හේතුවෙන් ඔවුන් සාමකාමී පා ගමනක් ආරම්භ කරන ලද්දේ 1994 සැප්තැම්බර් 5 වැනි දිනයි. එයට පොලිසිය යොදවා කඳුළු ගෑස් ප්‍රහාර සහ වෙඩි ප්‍රහාර එල්ලකොට ඉතා අමානුෂික අයුරින් මර්දනය කරනු ලැබීය. අවසානයේ දී සේවකයෝ 46 ක් අත්අඩංගුවට ගනු ලැබූහ.



ඇන්සල් ලංකා කම්කරු සටනේ දී වෙඩි වැදුණු සහෝදරිය

කම්කරුවන් නව දෙනෙකුට රෝහල්ගත වන්නට සිදු වූ අතර පොලිසියේ වෙඩිතැබීම හේතුවෙන් අසාධ්‍ය තත්ත්වයේ සිටි පී. ඒ. ප්‍රේමරතන සහෝදරයාගේ තත්ත්වය බරපතල වීමෙන් ඔහු මරණයට පත් වූවේය. එමෙන්ම වෙඩි වැදුණු පිරිස අතර එක් සේවිකාවක් ද විය. මෙහි සේවය කළ සේවකයින් ගෙන් වැඩි පිරිස පිරිමින් වේ. ඉතිහාසය දෙස ආපසු හැරී බලන කල ඇන්සල් ලංකා වර්ජනය බොහෝ අර්බුදවලට තුඩු දුන්නකි. කෙසේ නමුත් එම කම්කරුවන්ගේ ශක්තිය කඳුළු ගෑස්වලට වෙඩි උණ්ඩවලට නවත්වාලිය නොහැකි තරම් ශක්තිමත් එකක් විය.

ඇන්සල් ලංකා කම්කරු සටන වෙනුවෙන් කැප වී කටයුතු කිරීමට බියගම ඩාබිඳු ශාඛාවේ ඉදිරිපත් වීම එම සටන තව තවත් ශක්තිමත් කරන්නට බලපෑ හේතුවක් වූ බව සඳහන් කළ හැකිය.

මේ සඳහා අනෙකුත් සමාජ සංවිධානවල සහාය ගොඩනගමින් මෙම සටන පිළිබඳව ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් ප්‍රචාරයක් ලබා දීමට ඩාබිඳු සාමූහිකය කටයුතු කරන ලදී. එමෙන්ම වැඩ වර්ජනය හේතුවෙන්

අත් අඩංගුවට පත් වූ කම්කරුවන්ට ඇප ලබා දී නිදහස් කර ගැනීම සඳහා නීති ආධාර සහ ඒ සඳහා  මූල්‍ය අධාර ද ලබා දෙමින් උපරිම අයුරින් මැදිහත්වීමට ඩාබිඳු සාමූහිකය සමත් විය. නීතිමය කටයුතු සඳහා මූල්‍ය දුෂ්කරතා මතුවන විට කැට ව්‍යාපාර ඔස්සේ මුදල් උපයා දීම ද ඩාබිඳු ඉතා කැපවීමෙන් යුතුව සිදු කළ කාර්යයන් අතර විය.

එවකට පැවැති මර්දනකාරී ආණ්ඩුව පරාජය කරමින් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග බලයට පත්වීමත් සමඟම සිදු වූ මෙම සේවක මර්දනය, ඇය බලයට ගෙන ඒමට සිය ඡන්දය භාවිතා කළ බහුතරයක් කම්කරු ජනයා ඇගේ ආණ්ඩුවෙන් කිසි දිනෙක අපේක්ෂා නොකළ තත්ත්වයක් විය. මෙම මර්දනය හමුවේ වෘත්තීය අයිතිවාසිකම් දිනා ගැනීමට ඉදිරිපත් වීමට බොහොමයක් කම්කරුවෝ පසුබා සිටියහ. එමෙන්ම මෙකල චන්ද්‍රිකා බණ්ඩාරනායක ආණ්ඩුවේ කම්කරු ඇමතිව සිටි (1994 - 1997) මහින්ද රාජපක්ෂ කම්කරු ප්‍රඥප්තියක් ගෙන එන බවට ප්‍රතිඥා දී ඒ සඳහා කටයුතු කිරීම ආරම්භ කළ ද මේ අතර තුර ඔහුට කම්කරු ඇමති ධූරය වෙනුවට, ධීවර ඇමති ධූරය බාරගන්නට සිදු විය.

# බියගම කලාපය උණුසුම් කළ තවත් කම්කරු සටන්

බියගම නිදහස් වෙළඳ කලාපයේ පිහිටි ලලාන්, ඕෂන් ලංකා, සී. එන්. එච්. සෙරමික් ලංකා වර්ල්ඩ් ආයතන වල කම්කරු අයිතීන් නොලැබීම නිසාවෙන් කම්කරු වැඩ වර්ජන, උද්ඝෝෂණ නිතර නිතර ඇති වන්නට විය. බියගම සේවය කළ කම්කරුවන් මුහුණ දුන් ප්‍රශ්න බරපතල වූ බැවින් ඔවුන්ට සිය අයිතීන් ඉල්ලා සිටිමින් පාලක පක්ෂය සමඟ ගැටෙන්නට සිදු විය. එවැනි එක් අවස්ථාවක දී කාන්තා කම්කරුවෝ ද තම ආයතනයේ වහල මත නැගී තම අයිතීන් ලබා දෙන ලෙස උපවාස කළෝය. මෙම කම්කරු සටන් සාර්ථක කර ගැනීමට ඩාබිඳු සාමූහිකයට දිවා රෑ නොබලා වෙහෙස වීමට සිදු විය.







වැටුප් වැඩිකර ගැනීමට සිදුකරන ලද උද්ඝෝෂණ අවස්ථාවක් - කටුනායක

# සේවක සභා පිහිටුවීම

වෘත්තීය සමිතියක් පිහිටුවා ගැනීම කම්කරුවන්ට හිමි අයිතියකි. නමුත් එවැනි අයිතියක් ආයෝජන කලාපය තුළ තහනම් බවට ප්‍රචාරයක් තිබීම හේතුවෙන් අසාධාරණයට විරුද්ධව පවා වෘත්තීය සමිති ගොඩනගා ගැනීමට උත්සාහයක්වත් දරන්නට කම්කරු සේවක සේවිකාවන් උත්සුක වූවේ නැත. ඒ වෙනුවට රජය විසින් හඳුන්වා දෙනු ලැබූවේ සේවක සභා (Join Council) පිහිටුවීමයි. මෙය කම්කරු අයිතීන් තහවුරු කර ගැනීමේ සැබෑ ව්‍යුහයක් බවට පත් නොවීය. මෙම සේවක සභා සඳහා බොහෝ කොටම පත්කර ගනු ලැබුවේ පාලක හිතවාදී පිරිස් වීම මෙයට බලපෑ එක් හේතුවකි. විශේෂයෙන් මෙම සේවක සභා තුළ කම්කරු වැටුප් සහ සේවා කොන්දේසි සම්බන්ධයෙන් කිසිඳු කතා බහක් සිදු නොවූයෙන් කම්කරුවන් සිය වෘත්තීය අයිතිවාසිකම් දිනා ගැනීම පිළිබඳව අපේක්ෂා භංගත්වයට පත් විය.

මෙහි ප්‍රතිඵලයක් ලෙසින් ඔවුහු සිය ඉල්ලීම් ලබා ගැනීම උදෙසා උද්ඝෝෂණ වැඩ වර්ජන පටන් ගත්හ. පාලකයින් එම උද්ඝෝෂණ, වැඩ වර්ජන මර්දනය සඳහා මැර ප්‍රහාර සහ පොලිස් ප්‍රහාර එල්ල කර ඒවා විසුරුවා හරින්නට විය.






# අප ගොඩනැගූ ගොවි, කම්කරු, ධීවර, කාන්තා සහ ප්‍රජා සහයෝගීතාවය

ඩාබිඳු සාමූහිකය නිරන්තරයෙන්ම විවිධ ක්ෂේත්‍රයන්හි සංවිධාන සමඟ ඒකාබද්ධව, සාමූහිකව වැඩකළ සංවිධානයකි. මෙයට විවිධ කාන්තා සංවිධාන, මානව හිමිකම් සංවිධාන, ගොවි ධීවර සහ ප්‍රජා සංවිධාන ඇතුලත් විය. මෙම ක්‍රියාකාරකම් ඔස්සේ ගොඩනැගුණු සාමූහික සම්බන්ධතා නිසාම මර්දනයට සහ අභියෝගවලට එක්ව මුහුණ දීමටත් එකිනෙකාට සහාය වීමටත් අප වෙත අවස්ථාව උදා වුණි.

මෙහි දී ජාතික මට්ටමින් සහ ප්‍රාදේශීය මට්ටමින් කටයුතු කරන කාන්තා සංවිධාන සමඟ එක් වී ජාලගත වීමට ඩාබිඳු සාමූහිකයට ද අවස්ථාව ලැබුණි. ලක්බිමේ මව්වරු සහ දියණියෝ කාන්තා සංවිධාන එකතුවක් වශයෙන් යුද්ධයට සහ භීෂණයට එරෙහිව සාමය උදෙසා විශාල මෙහෙවරක් ජාතික මට්ටමෙන් සිදු කළ සංවිධාන ජාලයකි. ඔවුන් සමඟ එක් වූ ඩාබිඳු සාමූහිකයට ද එහි කොටස්කරුවෝ වීමට හැකි වීම භාග්‍යයකි. 1991-1992 කාල පරිච්ඡේදය තුළ මෙම සංවිධානයේ සම්බන්ධීකරණ කටයුතු කරන්නට අප හට අවස්ථාව ලැබුණි. එම වකවානුව තුළ උතුරු නැගෙනහිර සරණාගත කඳවුරුවල දුෂ්කරතාවයන් මැද කල් ගෙවූ දෙමළ, මුස්ලිම් ජනතාව උදෙසා විශාල කර්තව්‍යක් ඉටු කිරීමට මේ මඟින් අප වෙත අවස්ථාව උදා වුණි.




ලක්බිමේ මව්වරු සහ දියණියෝ සංවිධානයත් සමඟ විවිධ උස්සෝෂණ අවස්ථාවලට සම්බන්ධ වෙමින්

මගේ මතකයෙන් ගිලිහී නොයන කවියක් මෙහි දී සිහිපත් කරමි. එය මාගේ උපන් දිනයක් වෙනුවෙන් මා කළ සේවය අගයමින් ඇන්ජලා පැව්දි සොයුරිය සහ ස්කොලොස්ටිකා සහෝදරිය මා වෙත ලබාදුන් ත්‍යාගය සමඟ තිබුණි.

*"මිනිසත් ගුණයෙන් හරවත් ඔබට උපරිම දිවිය*
*ස්ත්‍රී ශක්තියෙන් පිරිපුන් වූ ඔබේ විශිෂ්ඨ සේවාව*
*සොයුරු පෙමින් වෙළුණු*
*අපේ දිරිදෙන මිතුදම් අගයමු."*

ඇන්ජලා සොයුරිය අද අප අතර නොවූවත් ඇය ජීවතුන් අතර සිටිය දී අප වෙත ආදරය, කරුණාව බෙදා දුන් සමාජය වෙනුවෙන් කැප වූ පැව්දි සොයුරියක වූවාය.

1994 - 1997 කාලය තුළ සවිස්ත්‍රී සංවිධානය සමඟ එකතුව ඩාබිඳු සාමූහිකය ගොවි, වතු, කම්කරු, ධීවර සහ වෙළඳ කලාප තුළ සේවය කරන කාන්තාවන් බලගන්වමින් ඔවුන්ගේ හඬ ගොඩනැගීමට මුල පුරන්නට විය. ඒ සඳහා හේතු වූයේ, නිදහස් වෙළඳ කලාපය තුළ සේවය කරන ප්‍රජාවගෙන් 90%ක්ම කාන්තාවන් වීමත් ඔවුන් සමබල ආහාර වේලක් නොගන්නා නිසාවෙන් මන්දපෝෂණ තත්ත්වයට මුහුණ දී තිබීමත් ය. එහි දී අප මෙම ක්ෂේත්‍රය තුළ නියැලී සිටින කාන්තාවන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ සමීක්ෂණයක් සිදු කළ අතර එයින් රැස් කරගත් දත්ත වලින් හෙළිදරව් වූයේ වසර පහක් එක දිගට සේවයේ නිරත වන කම්කරු කාන්තාවන් දැඩි ලෙස සෞඛ්‍ය පිරිහීමේ අවදානම් තත්ත්වයකට මුහුණ දෙමින් සිටින බවයි. එමෙන්ම දිනකට වැඩි පැය ප්‍රමාණයක් සිටගෙන සිටීම හේතුවෙන් දණහිස් අමාරුද, වායු සමීකරණ කරන ලද කර්මාන්තශාලා තුළ පැය ගණනක් වැඩ කිරීම නිසාවෙන් පීනස වැනි රෝග තත්ත්වයන්ට ගොදුරුවන බව ද හඳුනාගන්නට අපහට හැකි වීමු. සවිස්ත්‍රී සංවිධානයේ මැදිහත්වීමට අනුව කළ මෙම සමීක්ෂණය මුල් කරගනිමින්, අපි කලාපයේ කම්කරු කාන්තාවන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ පොතක් ද මුද්‍රණය කළෙමු. මෙම කාර්යය හරහා අප සංවිධානය සමඟ නව කණ්ඩායම් එකතු කරගත් නිසා අපගේ ක්‍රියාකාරීත්වය පුළුල් පරාසයක් කරා විහිදෙන්නට වීය. විශේෂයෙන් වතුකම්කරු, ධීවර, ගොවි, සෞඛ්‍ය යන ක්ෂේත්‍රයන්හි සබඳතා ගොඩ නගා ගනිමින් කටයුතු කරන්නට විය. මුලතිව්, මඩකලපු සහ යාපනය යන දිස්ත්‍රික්කවල සංවිධාන, දකුණේ පිහිටුවා තිබුණු කාන්තා සංවිධාන සමඟ වෙළඳ කලාපයේ කාන්තාවන් එක්වී සිය අදහස් සහ අත්දැකීම් බෙදා හදාගන්නට විය.

ඇන්ජලා පැවිදි සොයුරියගේ සහාය ඇතිව 2012 වසරේ දී මුලතිව් ප්‍රදේශයේ පිහිටුවා තිබූ 'යහපත් එඬේරා සංක්‍රමණික සංවිධානය' සමඟ එක් වී යෝගට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය කරන යන්ත්‍ර දෙකක් කාන්තා කණ්ඩායම්වලට ලබා දීමට අප මුල් වූයේ මෙම රට පුරා විහි දී ගිය අපගේ පුළුල් ක්‍රියාකාරීත්වයේ එක් කොටසක් ලෙසිනි. මෙම වැඩසටහන ඔස්සේ යුද්ධයෙන් අවතැන් වී සිටි ප්‍රජාවට ස්වයං රැකියා අවස්ථාවන් විවෘත කළ අතර ඔවුන්ට දෛනික ආදායමක් උපයා ගැනීමට ඒ මඟින් හැකියාව ලැබුණි. එම ප්‍රදේශයේ කිරි එළදෙනුන් ඇතිකරන නිසා ඔවුන්ට මෙම යෝගට් නිෂ්පාදනය කිරීමේ වැඩසටහන පහසුවෙන් පවත්වාගෙන යාමට හැකි විය.



මුලතිව්හි දී සරස්වතී අම්මාට යෝගට් මැෂිම භාර දීම

කටුනායක, බියගම වෙළඳ කලාප තුළ සේවය කරන කම්කරු ස්ත්‍රීන්ගේ ජීවන රටාව පිළිබඳව Alarm (Apperal Industry Labour Rights Movement) සංවිධාන ජාලය හරහා ජීවත්වීමට සරිලන වැටුපක් මූලික කරගෙන සමීක්ෂණයක් සිදු කරන්නට අපට අවස්ථාව ලැබුණි. එහි අරමුණ වූයේ, කම්කරු කාන්තාවන්ගේ අයිතීන් කඩවීම් සොයා බැලීමයි. ජීවත්වීමට සරිලන වැටුපක් මුල් කරගෙන පවත්වනු ලැබූ මෙම සමීක්ෂණ ක්‍රියාවලියේ දත්ත රැස් කිරීම මෙන්ම ජාත්‍යන්තරය තුළ සන්නාමකරුවන් ඇතුළු අනෙකුත් පාර්ශවකරුවන් ඉලක්කකොට ගෙන උද්දේශන ව්‍යාපාර පැවැත්වීමට අවස්ථාව උදා විය. මෙලෙස දත්ත රැස් කිරීම හේතුවෙන් ආසියාවේ අනෙකුත් රටවල් සමඟ එම දත්ත සංසන්දනය කරමින් කලාපීය වශයෙන් ජීවන වැටුප් (Living Wage) සංකල්පය හඳුනා ගැනීමට අවස්ථාව ලැබුණි.

යුධ ගැටුම් නිමා වීමත් සමඟ උතුරු නැගෙනහිර පළාත්වල ජීවත් වූ තරුණ පිරිස් නිදහස් වෙළඳ කලාපයෙහි රැකියා සොයාගෙන පැමිණීමට පටන් ගෙන තිබුණි. අපි මෙම කම්කරු ප්‍රජාව සොයා ගොස් ඔවුන් සමඟ සබඳතා ගොඩනගා ගනිමින් විවිධ වැඩමුළු පවත්වමින් කම්කරු සහ සෞඛ්‍ය අයිතිවාසිකම් මෙන්ම බහුතරයක් වූ සිංහල කම්කරු ප්‍රජාව සමඟ මිශ්‍රවීමට ඔවුන්ට අවස්ථාවන් නිර්මාණය කළෙමු. එහි දී ජනවාර්ගික සාමය සහ සංහිඳියාව පිළිබඳව ඔවුන් සමඟ නිරන්තරයෙන් කතා බහ කළෙමු. ඔවුන්ට හරවත් ලෙස විවේකය භුක්ති විඳීමට තරුණ කඳවුරු

පවත්වමින් ඔවුන්ගේ හැකියාවන් ඔප් නැංවා ගැනීමට ඉඩ හැරියෙමු. කම්කරුවන් දැනුවත් කිරීම සම්බන්ධයෙන් කළ මෙම විවිධ ක්‍රියාකාරකම් අතර වීදි නාට්‍ය රඟදැක්වීම්, සාහිත්‍ය රසාස්වාදය, පුස්තකාල සේවා, "සාදු ජනරාවය" වැනි සංස්කෘතික වැඩසටහන් ද විය. මෙවැනි වැඩසටහන්, කටුක රැකියා පරිසරයක සේවය කරන කම්කරුවන්ගේ මානසික විවේකයට මෙන්ම ඔවුන්ගේ හැකියාවන් ඔප්නංවා ගැනීමට මහඟු අස්වැසිල්ලක් විය. මේ ක්‍රියාකරකම් ඇගැයීමට ලක් කරමින් දමිළ තරුණියන් පවසා සිටියේ, "අපේ ජීවිතේටම අද තමයි සිංහල අය සමඟ අපි එකතු වුණේ. අපි හරියට විනෝද වුණා, සතුටු වුණා" යනුවෙනි.


තරුණ කඳවුරු අවස්ථාවක ආරාධිත අමුත්තන් සමඟ පොල් තෙල් පහන දල්වමින්

මෙවැනි සාමූහික ක්‍රියාකාරකම් වලට අමතරව කලාපය තුළ සේවය කරන, තම මව් භාෂාවෙන් කටයුතු කර ගැනීමට නොහැකි වූ, භාෂා ප්‍රශ්නවලට මුහුණ දුන් දමිළ ශ්‍රමික ප්‍රජාවට ඔවුන්ගේ බැංකු කටයුතුවල දී සහාය වීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීමට ද අපි සමත් වීමු.

මේ වනවිට කලාපය තුළ නිරන්තරයෙන් උද්ඝෝෂණ සහ වැඩ වර්ජන ඇතිවීම හේතුවෙන් තනි සංවිධානයක් ලෙසින් කටයුතු කිරීම තවදුරටත් අපහසු බව අපි වටහා ගතිමු. ජාලගතව කටයුතු කිරීමේ අවශ්‍යතාවය වෙනදාටත් වඩා තදින් මතු වූ බැවින් අනෙකුත් සංවිධාන සමඟ සාමූහිකත්වය ගොඩනගා ගැනීමට අපට හැකි වුණි. ඒ අනුව 1990 දී එවකට පිහිටි නීති උපදෙස් මධ්‍යස්ථානය, කම්කරු සෙවන වැනි සංවිධාන සහ වෘත්තීය සමිති සමඟ එක්ව කලාපයේ සේවය කරන කම්කරු

ප්‍රජාවගේ ප්‍රශ්නවලට මැදිහත් වීමට අපි සමත්වීමු. කලාපය තුළ යටිතල පහසුකම් ප්‍රමිතියකට සැලසුම් කරන්නට නගර සභාවට බලපෑම් කළෙමු. එහි ප්‍රතිඵලයක් ලෙසින් කම්කරුවන්ගේ නේවාසික පහසුකම් වැඩිදියුණු විය. කලාපය තුළ වාණිජ බැංකු ශාඛා පිහිටුවීම සඳහා පාලකයන්ට මෙන්ම අපනයන මණ්ඩලයට ද බලපෑම් කළෙමු.

මෙම ක්‍රියාකාරිත්වයන්ට අමතරව කම්කරු ශ්‍රමිකයන්ගේ උග්‍ර වන ප්‍රශ්න හමුවේ තනිව සංවිධානයක් ලෙස කටයුතු කිරීමට වඩා කලාපය තුළ වැඩ කරන සංවිධාන සියල්ලම එක්ව සහයෝගිතා සංවිධාන එකතුවක් පිහිටුවා ගන්නට අපි යුහුසුළු වීමු. මෙම සංවිධාන එකතුවේ අරමුණ වූයේ සාමූහිකත්වය මඟින් වෙළඳ කලාපයේ ප්‍රශ්නවලට මැදිහත් වීමයි.

රජය විසින් 1992 අගෝස්තු 22 වන දින 1992 අංක එක දරණ හදිසි අවස්ථා නියෝග යටතේ ගැසට් නිවේදනයක් මඟින් මහජන ආරක්ෂක ආඥා පනත නිකුත් කරන ලදී. එම පනත අනුව කලාපයේ කම්කරුවන්ට කිසිඳු අයිතිවාසිකමක් ඉල්ලීමට අවස්ථාවක් නොමැති පරිද්දෙන් මෙම හදිසි අවස්ථා නියෝග සකසා තිබුණි. මෙම වකවානුව තුළ සහයෝගීතා කමිටුව කලාපීය ඉල්ලීම් රාශියක් පදනම් කර ගනිමින් ඒවා ලබා ගැනීමට උත්සාහ දරමින් සිටි කාලයකි. කෙසේ නමුත් රටේ ආණ්ඩු විරෝධී සියලු දේශපාලන සංවිධාන වෘත්තීය සමිති ඇතුළු සියලු දෙනා විසින් ජනතා ද්‍රෝහී පනත ඉල්ලා අස්කර ගන්නා මෙන් විරෝධතාවල යෙදුණි. එම අවස්ථාවේ ඩාබිඳු සාමූහිකය ද විරෝධතා ව්‍යාපාරයන්හි යෙදුණි. එම සියලු විරෝධතාවන්හි ප්‍රතිඵලයක් ලෙසත් රජය විසින් 1992 සැප්තැම්බර් මස 29 වන දා රාත්‍රී දොළහේ සිට වහාම ක්‍රියාත්මක වන පරිදි එම ගැසට් නිවේදනය අහෝසි කරන ලදී. එය අප සියලු දෙනාගේ සාමූහික ක්‍රියාකාරිත්වය හේතුවෙන් ලද ජයග්‍රහණයකි. එසේම තවත් ජයග්‍රහණ ගණනාවක් කරා යාමට මෙම සහයෝගීතා කමිටුව සමත් වුවද ඇතැම් සාමාජික සංවිධානවල මන්දගාමීත්වය හේතුවෙන් පසුකලෙක දී මෙම සංවිධාන එකතුව ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යාමේ අපහසුතා පැන නැගුණි.

ඉහත ගැසට් නිවේදනයට අනුව 'බලධාරියා විසින් කපා හරින ලදී' යන වගන්තියට යටත්වන නිසා 'ඩාබිඳු පුවත්පත' යම් අවස්ථාවන් වලදී මුද්‍රණය කිරීම නවත්වා දමන්නට පවා අපට සිදු විය. මෙවැනි විවිධ

අණාපනත් සහ මර්දනකාරී ක්‍රියාවන් මඟින් ඩාබිඳු අකර්මන්‍යය කිරීමට උත්සාහ කළ ද අප කිසිවිටෙකත් ඒවායින් පසුබට නොවුණි. ජාතික මෙන්ම ජාත්‍යන්තර ඇඟලුම් කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරන සංවිධාන සහ ව්‍යාපාර, ජාතික වශයෙන් බහුජන සංවිධාන, වෘත්තීය සමිති, විවිධ සමාජ සංවිධාන සමඟ සම්බන්ධතා ගොඩනගා ගනිමින් අපගේ ගමන් මග සාර්ථකත්වය කරා ගෙනයාමට අපි උපරිමයෙන් කැප වී කටයුතු කරන්නට වීමු.

# ජාත්‍යන්තර සබඳතා

1991 වසරේ දී කම්කරු කාන්තාවන් නියෝජනය කරමින් ආසියානු කාන්තා සමුළුවට (Comittee for Asian Women - CAW) සහභාගි වීමට මා හට අවස්ථාව හිමි විය. මෙය මාගේ පළමු ජාත්‍යන්තර අත්දැකීමයි. කම්කරු කාන්තාවන්ගේ අයිතීන් සුරැකීම උදෙසා ගොඩනැගුණු CAW හි අවධානය වැඩි වශයෙන් යොමු වූයේ විධිමත් හා අවිධිමත් කම්කරු කාන්තාවන් සංවිධානය කිරීම පිණිසය. CAW හි කමිටු සමාජිකාවක ලෙසින් පත්වීමට අවස්ථාව ලද මම, එහි කටයුතු සඳහා නේපාලය, බංගලාදේශය, ඉන්දියාව, හොංකොං, පිලිපීනය, දකුණු කොරියාව, චීනය, මැලේසියාව, තායිලන්තය සහ නිකරගුවාව වැනි රටවල වැඩසටහන් රාශියකට සහභාගී වීමට අවස්ථා ලද්දෙමි. මෙම වැඩසටහන් ඔස්සේ ජාත්‍යන්තර කම්කරු නීති, කාන්තා අයිතිවාසිකම් සහ ප්‍රඥප්තීන් සම්බන්ධයෙන් පුළුල් දැනුමක් ලබාගැනීමට මා හට හැකිවිය. මා ලද මෙම දැනුම වෘත්තීය සමිති ක්ෂේත්‍රයේ වැඩවල දී මහඟු ප්‍රයෝජනයක් අත්පත් කර දුණි. විශේෂයෙන් අවිධිමත් ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් වැඩ කළ මාළඹේ ප්‍රජා අධ්‍යාපන මධ්‍යස්ථානයේ නිර්මාතෘවරියක වන ඇනීටා ප්‍රනාන්දු සහෝදරිය සමඟ එක්ව වැඩකරන්නට මෙහි දී මා හට අවස්ථාව ලැබුණි. එය බොහෝ ප්‍රශ්න දෙස සංවේදීව බැලීමට මෙන්ම සාමූහිකව විසඳුම් සොයන්නට මග පෙන් වූ

ඉතාමත් සොඳුරු සම්බන්ධතාවයක් විය. මෙම මතක ආවර්ජනය කරන අවස්ථාවේ දී ඇනීටා ප්‍රනාන්දු සහෝදරිය සහ පෝල් ප්‍රනාන්දු සහෝදරයා සිහිපත් කරන්නේ හදපිරි භක්තියෙනි.



ඇමරිකාවේ නිකරගුවාවේ දී පවත්වන ලද සමුළුවක් අමතමින්

ලෝකයේ වැඩ කරන කාන්තාවෝ (Women Working Worldwide -WWW) සංවිධානය නියෝජනය කරමින් ඇන්ජලා හේල් සොයුරිය 1991 දී ඩාබිඳු සංවිධානය තුළ සමරන ලද පළමු ජාත්‍යන්තර කාන්තා දින සැමරුම සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස සහභාගී වූවාය. එහි දී ඇය විසින් අපගේ ක්‍රියාකාරකම් සහ වැඩසටහන් අගය කරන්නට විය. WWW හි පරමාර්ථය වූයේ නිදහස් වෙළඳ කලාපයේ කාන්තා කම්කරුවන්ගේ කටුක අත්දැකීම් බෙදා ගැනීමයි. ඇගේ මෙම පැමිණීමෙන් පසුව උපකොන්ත්‍රාත් (Sub Contract) දාමය පිළිබඳව තොරතුරු සහ දත්ත සමීක්ෂණයක් කිරීමට ද ඩාබිඳු සාමූහිකයට හැකි විය.

ඩාබිඳු පුවත් පතෙහි ඉංග්‍රීසි පරිවර්තනය විදේශ රටවලට යැවීමෙන් කර්මාන්තශාලාවල පවතින ගැටලු වලට මැදිහත් වී ගැනුම්කරුවන්ට බලපෑම් කිරීමට අප ආයතනය විසින් ලබා දුන් තොරතුරු අදාළ කරගනිමින්, පිරිසිදු ඇඟළුම් ව්‍යාපාරය (Clean Cloth Campaign - CCC) සමඟ කළ කටයුතුවලට විශාල වශයෙන් දායක වීමට අපට හැකි විය.




ඉංග්‍රීසියෙන් මුද්‍රණය කරන ලද ඩාබිඳු පුවත්පත්



Clean Cloth Campaign – 1998













ජාත්‍යන්තර සමුළුවලට සහභාගී වෙමින්

# 4 වැනි ජාත්‍යන්තර කාන්තා සමුළුව




බීජිං සමුළුවලට සම්බන්ධ වෙමින්

1995 වසරේ සැප්තැම්බර් මාසයේ දී චීනයේ බීජිං නුවර පැවැති 4 වැනි ජාත්‍යන්තර කාන්තා සමුළුව (Fourth World Conferance on Women) සහභාගිවීමට ලැබීම මා ලද තවත් භාග්‍යයකි. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් කාන්තාවන් 60 දෙනෙකු පමණ සහභාගි වූ මෙම සමුළුවට සහභාගි වීමේ කටයුතු  ලංකාව තුළ සංවිධානය කරනු ලැබුවේ, ශ්‍රී ලංකා රාජ්‍ය නොවන සංවිධාන එකතුව මඟිනි. මෙහි සම්බන්ධීකරණ කටයුතු මෙහෙයවනු ලැබුවේ ආචාර්ය සේපාලි කෝට්ටේගොඩ විසිනි. මෙම සමුළුවට ලෝකයේ රටවල් 189 ක නියෝජිතයින් සහ සිවිල් සමාජ සංවිධාන සාමාජිකයින් අතිවිශාල (තිස් දහසක් පමණ) ප්‍රමාණයක් සහභාගි වී සිටියහ. මෙහි ප්‍රධාන අරමුණ වූයේ ලෝකය පුරා කාන්තා අයිතිවාසිකම් ව්‍යාප්ත කිරීම, සමානාත්මතාවය ගොඩනැගීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්මත කර ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමයි. මෙහි දී ලබාගත් ප්‍රධාන ප්‍රතිඵලය වූයේ, බීජිං ක්‍රියාකාරී සැලැස්ම (Beijing Platform for Action) සම්මත කර ගැනීමයි. ලොව පුරා වෙසෙන කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ ඔවුන්ගේ පූර්ණ සාමාජික සහ ආර්ථික සහභාගීත්වය වර්ධනය කිරීම, අයිතිවාසිකම් තහවුරු කිරීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග 12 ක් වටා නිර්දේශ ඉදිරිපත් කෙරුණි.

ජාති, කුල, ආගම් භේද කිසිත් නොතැකූ ලෝකවාසී කාන්තාවන් තම අයිතිවාසිකම් වෙනුවෙන් බීජිං නගරයේ හුවයිරෝ නුවර දී නැංවූ හඬ තවමත් දෝංකාර දෙන්නාක් මෙනි.

බීජිං සමුළුවෙන් වසර 30 කට පසුව එම ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ආපසු හැරී බැලීමේ අවශ්‍යතාවය අද වනවිට මතුව තිබේ.

# ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂාවීමේ පනත සම්මත වීම

2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයෙන් ආරක්ෂා වීමේ (Prevention of Domestic Violance Act) පනත පාර්ලිමේන්තු පනතක් ලෙසින් සම්මත වීම ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ව්‍යාපාරය විසින් ලබාගත් තවත් ජයග්‍රහණයකි. මෙය රිදී බන්දේසියක තබා පිළිගැන්වූවක් නොව මෙරට කාන්තා සංවිධාන, විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළු සමාජ ක්‍රියාකාරීන් පිරිසකගේ ප්‍රබල උත්සාහයක ප්‍රතිඵලයක් ලෙසින් දිනා ගත්තකි. මෙම පනත සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කරමින් එය සම්මත කරගැනීමට මෙන්ම ක්‍රියාත්මක කිරීම අරභයා විවිධ මට්ටමේ දැනුවත් කිරීම් සිදුකරමින් එයට මූලිකත්වය ගත් කාන්තා නායිකාවන්ට සහාය වීමට ලැබීම ඩාබිඳු සාමුහිකය සිහිපත් කරන්නේ සතුටිනි. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වන්නන් අතර වැඩි ප්‍රතිශතය කාන්තාවන් වීම නිසාම මෙවැනි ආරක්ෂක පනතක් ප්‍රයෝජනවත් අයුරින් ප්‍රායෝගිකව භාවිතා කිරීමේ ඉඩ හසර නිර්මාණය කිරීමේ වගකීම රජයට මෙන්ම සමාජයට ද ඇත.

# මාගේ ගමනට දිරිදුන් සහායකයින්

මා පැමිණි ගමන් මගෙහි දශක හතරකට වැඩි කාලයක් තුළ මා ළඟින්ම සිට මට දිරිදුන් අද වනවිට අප අතර නැති සියළු දෙනා මේ මොහොතේ ඉතා ආදරයෙන් සහ ගෞරවයෙන් සිහිපත් කරමි. මේ පිරිස අතර විශේෂයෙන් මාගේ මතකය තුළ, ඇන්ජලා පැට්දි සොයුරිය, සුනිලා අබේසේකර, ඇනීටා ප්‍රනාන්දු, පෝල් ප්‍රනාන්දු, ටයිටස් ප්‍රනාන්දු, ඕඩ්රි රිබේරා, ඩල්සි ද සිල්වා, රෝස් ප්‍රනාන්දු, සීතා රංජනී, සහ අමරාංගනී යන සොයුරු සොයුරියන් වේ.

# පහන් ටැඹ දැල්වූවෙමි...

මා පැමිණියේ බාධක, අභියෝග මැදින් දුෂ්කර කටුක ගමනකි. කොතෙක් දුෂ්කරතා තිබුන ද එය ආශ්වාදයෙන් පිරි ගමනකි. මේ ගමනේ දී මට හමුවූවන් බොහෝය. එමෙන්ම හැරගිය අය ද බොහෝය. මා අතැර යාමට සිදු වූ ආදරණීයයන් අතුරින් මාගේ දයාබර සැමියා සෝමේ, මා සිහිපත් කරන්නේ හදපිරි ස්නේහයෙනි. ඔහු මාගේ ජීවිතය වෙනස්ම මගකට හැර වූ මගේ ජීවන ගමනේ සහකරුවා විය. මාගේ හොඳම මිතුරා විය. එමෙන්ම අයිතිවාසිකම් දිනාගැනීමේ සටනේ සටන් සගයා විය. හදිසියේ ඇති වූ අසනීප තත්ත්වයක් හේතුවෙන් සෝමේ අප හැර ගියේ 2008 වසරේදීයි. ඒ හරියටම මීට වසර 15 කට පෙරාතුවයි. සොමේගේ වියෝව මා දරා ගත්තේ දරුවන් තුන් දෙනාගේ සමාගමයේ සහ ආදරයේ පිහිටෙනි. දෙමාපියන් අතින් ගිලිහුණු වගකීම් දෙස කුඩාකළ සිටම උපේක්ෂාවෙන් බැලීමට හුරු පුරුදු වූ අපගේ දරුවන් හතර දෙනා මෙහි දී සිහිපත් කරන්නේ ආදරයෙනි.



ලලිත් හේමන්ත ලොකු පුතා

අප සමඟ ජිවත් වීමට වරම් නොලැබ අකාලයේ සැඟව ගිය අපගේ ලොකු පුතා ලලිත් යළි යළිත් සිහිපත් කරන්නේ නෙතපිරි කඳුළිනි. සෝමේ මෙන්ම ඔහු මගේ ජීවිතය තුළ තබා ගිය හිඩැස තවමත් එලෙසම පවතී.

සෝමේත්, මමත් බොහෝ වෙර වීරියෙන් අත නොහැර අරගල මාවතේ දශක ගණනාවක් පෙරට රැගෙන ආ ගිනි සිළුවෙන් නව පහන් ටැඹක් දැල්වූවෙමු. ඒ එළියෙන් නව නායිකාවන්ට නිවැරදි මගක යාමට ආලෝකය දුන්නෙමු. සෝමේ මෙන්ම මා ද යම් දිනෙක මෙලොවින් සමුගන්නේ වුවද අප දැල්වූ පහන් ටැඹෙහි ආලෝකය ඔස්සේ ඔවුන් ඉදිරියටම යනු ඇත. ඔවුන් කෙදිනක හෝ මේ ලෝකය සාමය, සමානාත්මතාවය, දයාව, ආදරය සහ කරුණාව පිරුණු තැනක් බවට පත් කරනු ඇත. මාගේ ඒකායන ප්‍රාර්ථනය ද එයම ය.

**එච්.අයි. සමන්මලී**



සමන්මලී සහෝදරිය, ඇගේ සහෝදරියන් සමඟ






35 වන ඩාබිඳු සාමූහික සංවත්සරය දින සැමරුම




සමන්මලී සහෝදරිය 75 වන ජන්ම දිනය සමරමින්



ජයනි ප්‍රනාන්දු

# ඕනෑම සාමාන්‍යය ගැහැණියකට ලෝකයේ විශිෂ්ඨ හෝ අති විශිෂ්ඨ ගැහැණියක් විය හැකිය

ඇත්තටම ලෝකේ විශේෂ ගැහැණු කියලා වර්ගයක් ඉන්නවද? නැත්නම් තමන් ජීවිතයේ ගන්නා තීරණ, මුහුණ දෙන අත්දැකීම්, ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය සාමාන්‍ය ගැහැණුන් විශේෂ ගැහැණුන් බවට පත්කරනවාද? මම විශ්වාස කරන්නේ ඕනෑම සාමාන්‍ය ගැහැණියකට මේ ලෝකයේ විශිෂ්ට හෝ අති විශිෂ්ට ගැහැණියක් විය හැකි බවයි. එය ඇගේ තීරණයක්. එච්. අයි. සමන්මලී නොහොත් මට අනුව ආදරණීය සමන්මලී ඇන්ටි එවන් චරිතයක්. ඇය දියණියක්, සොයුරියක්, බිරිඳක්, මවක්. ඒ වගේම ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ව්‍යාපාරයේ පුරෝගාමී සලකුණක්. තමන්ගේ ජීවිතය සාමාන්‍ය බිරිඳක්, මවක් ලෙස ගත කරන ඇය, යම් මොහොතක තමන් ඇතුලුව අනෙකුත් කාන්තාවන්ගේ මෙන්ම කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් ද හඬ නගන්නට ඉදිරිපත් වෙනවා. එදා පොලිටෙක්ස් අරගලයේ සහ අනෙකුත් අරගලයන් හි ක්‍රියාකාරී සාමාජිකාවක් වන ඇය 1984 සැප්තැම්බර් මස කුමුදුනි රෝසා සහ විවියන් කන්‍යා සොයුරිය සමඟින් ඩාබිදු පුවත්පත ආරම්භ කරනවා. එදා ඔවුන් රෝපණය කළ ඩාබිදු බීජය, අද කටුනායක, බියගම, කිළිනොච්චි සහ වව්නියා ප්‍රදේශවල වැඩසටහන් ක්‍රියාකාරීත්වයන් සහ ජාතික හා කලාපීය වශයෙන් උද්දේශන ව්‍යාපාර හා සම්බන්ධ වන මහා වෘක්ෂයක් බවට පත්වෙලා.

සමන්මලී ඇන්ටි මට මුලින්ම හමුවන්නේ 2013 අවුරුද්දෙදී. මම කැම්පස් අවුට් වුන ගමන් එවකට රයිට්ස් නව් වැඩ කරපු ප්‍රබෝධ අයියා මාර්ගයෙන් තමයි මම ඩාබිඳු ගැන දැනගන්නේ. ඒ වෙනකොට ස්ත්‍රී සංවිධාන සම්බන්ධයෙන් මට ඉතා හොඳ ආකල්පයක් හෝ දැනුමක් නොතිබුණ බව කිව යුතුමයි. ඉතිං මේ අවස්ථාව ගැන ටිකක් අදිමදි කළත් අවසානයේ දී මම ගිහින් බලන්න තීරණය කළා. ඩාබිඳුවට පය තියපු ඒ පළවෙනි දවසම මගේ හිතේ ස්ත්‍රී සංවිධාන ගැන තිබුණු ආකල්පය වෙනස් කරන්න හේතු වුණා. පුංචි කාමර දෙකක පොත් පත්තර අටෝරාසියක් පුරෝගෙන බොහොම සරළ සාමාන්‍ය ගැහැණු දෙන්නෙක් මට මුණ ගැහැණා. හැබැයි ඒ සරල කමට එහා ගිය මහා ධෛර්යයක්, කැපවීමක් ඔවුන් තුළ තිබුණා. ඒ තමයි සමන්මලී ඇන්ටි සහ චමිලා අක්කා. ඩාබිඳු සමඟ එදා පටන් ගත්ත මගේ ගමන අදටත් නිමා වෙලා නැහැ.

80 දශකය කියන්නේ 83 කළු ජූලිය, 88,89 භීෂණ සමය වගේ ලංකා ඉතිහාසයේ මිලේච්ඡ සිදුවීම් පිරුණු අඳුරු යුගයක්. එවන් යුගයක ඇරඹුනු ඩාබිඳු හරහා ඇඟලුම් කම්හල් වල සේවක සේවිකාවන්ට සිදුවුන අසාධාරණකම් පළ කරන විට ඔවුන් පාලකයන්ගේ දෝෂ දර්ශනයට, තර්ජන ගර්ජනයන්ට ලක් වෙනවා. විශේෂයෙන්ම තමන් සමඟ කම්කරු අයිතිවාසිකම වෙනුවෙන් එකට හඬ නැගූ ලයනල්, රංජිත් සහෝදරයන් අතුරුදහන් කළ ඒ භීෂණකාරී යුගය ඔවුන් ගත කළේ කොයි තරම් බියකින්, පීඩනයකින් ද යන්න වරෙක සමන්මලී ඇන්ටි සිහිපත් කරනවා. ඒ ඇය ක්‍රියාකාරිනියක් විතරක් නොවෙයි, මවක්, බිරිඳක් නිසයි. කෙටි කලකට නිහඬව ගත කළත් ඇගේ ඒ සටන්කාමී ධෛර්යය මරන්නට කිසිඳු ජගතෙක් සිටියේ නැහැ. ඒ නිසාම තමයි අනෙකුත් ක්‍රියාකාරීන් සමඟ එකතුව ඔවුන් නැවතත් කම්කරු අයිතීන් මර්දනයට එරෙහිව නැගී සිටින්නේ.

ක්‍රම ක්‍රමයෙන් ඇගේ ක්‍රියාකාරිත්වය අනෙකුත් ක්ෂේත්‍රයන් කරා විහිඳුවමින් ශ්‍රී ලංකාවේ සාමය හා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් දියත් වන ව්‍යාපාර හා සමඟින් ද එකතුවනවා. ඇගේ ක්‍රියාකාරිත්වය මේ පුංචි දූපතෙන් එහාට විහිදෙමින් ඇය CAW, CCC, WWW, AFW වගේ කලාපීය සහ ජාත්‍යන්තර ජාලයන් තුළ ශ්‍රී ලංකාවේ ඇඟලුම් ශ්‍රමික කාන්තාවන්ගේ හඬ නියෝජනය කරනවා. ඇගේ මේ නොසැලෙන කැපවීම හා ක්‍රියාකාරිත්වය වෙනුවෙන් වරින්වර ඇගයුමට පාත්‍ර වෙනවා. ජර්මනියේ සෙනෙට් බර්මර් සම්මානය එවැන්නක්. ඒ ලැබුණු තෑගි මුදල පවා ඩාබිඳු උන්නතිය වෙනුවෙන් වැය කරමින් ඇය ඇගේ නිහතමානි ගමන ඉදිරියට ගෙන යනවා.

සමන්මලී ඇන්ටි සමඟ ඩාබිඳු සමඟ ගත කළ ඒ කාලය තුළ මා උකහා ගත් දැනුම මගේ විශ්ව විද්‍යාල අධ්‍යාපනයන්ට එහා ගිය මහා පොළොවේ යතාර්ථය සමඟ බැඳුණු අපරිමිත වූවක්. ඒ අත්දැකීම් වලින් බිඳක් හෝ තමන්ගේ පර්යේෂණයන්ට දායක කරගන්නට ඇය සොයා ආ විශ්වවිද්‍යාල සිසුන්, පර්යේෂකයන් අති විශාලයි. ඇගේ ප්‍රතිපත්ති ගරුක බව, මූල්‍යමය වගවීම, අභියෝග හමුවේ නොසැලෙන ශක්තිය අනේක බාධක මැද වුවත් ඩාබිඳු ගමන මේ දක්වා ගෙන ඒමට විශාල පිටුවහලක් වෙනවා. කම්කරු කාන්තාවන් වෙනුවෙන් වූ ඇගේ මැදිහත් වීම ප්‍රදාන, ආධාරක ආයතන මත යැපුණක් නොවෙයි. මූල්‍යමය ආධාර ව්‍යාපෘති අවසන් වූ කාලවල පවා ඩාබිඳු කාර්යාලය කම්කරු කාන්තාවන්ට විවෘත වුණා. පොදු උද්දේශන වැඩසටහන් වල ඇය ඉදිරියෙන්ම සිටියා. ඇතැම් විටෙක ප්‍රධාන ආයතනයන්ට පවා මහා පොළොවේ යථාර්ථය පෙනවා දෙමින් ඔවුන්ගේ ක්‍රමවේදය, වැඩපිළිවෙළහි යම් යම් වෙනස්කම් කරන්නට ඇගේ ක්‍රියාකාරිත්වය දායක වුණා.



ඩාබිඳු පුවත් පත සඳහා ලිපි ලියූ සමන්මලී සහෝදරියගේ අත් අකුර

පනස් වසරකට ආසන්න ඇගේ ක්‍රියාකාරී දිවිය තුළ ඇය ලැබූ දෑ මෙන්ම ඇයට අහිමි වූ දේවල් ද බොහෝමයි. ඇගේ ආදරණීය පුතුගේ හදිසි වියෝව, සැමියාගේ නික්මයාම, රෝගාබාධයන්ට ගොදුරුවෙමින් ශරීර සෞඛ්‍යය පිරිහී යාම වැනි අනේක වූ අභියෝග මැද වුවත් ඇය සිය සටන්කාමිත්වය කිසි දිනෙක අතහැරියේ නැහැ. මා ඩාබිඳුවලින් නික්ම යන තුරුත් ඇය සතියට වතාවක් දෙවතාවක්වත් ඉතාම අසීරුවෙන්, අතින් අතට වාරු වෙමින් හෝ ඩාබිඳු කාර්යාලයට එන්නට අමතක කළේ නැහැ. ඇගේ අත වෙවුලමින් වුවත් ඩාබිඳු පුවත්පතට ලිපි ලිවීම නතර කළේ නැහැ. අදටත් මා ඇගෙන් දකින නොවෙනස් ගුණය එයයි. අවසන් හුස්ම පොද දක්වාම ඇති ඒ සටන්කාමිත්වයයි. ඒ ධෛර්යය ඇය ඉදිරි පරපුරට ලබා දී අවසන්. ඇගේ දියණියක ලෙස ආදරණීය චමිලා අක්කා ඉදිරියට ගෙන යන්නේ ඇගේ මවගෙන් ලද ඒ පන්නරයයි. කුඩා කල පටන් අනෙකා වෙනුවෙන් උනුවෙන හිතක්, වැඩ කරන දෑතක් ඇතිව ඇය අද ක්ෂේත්‍රය තුළ නොමැකෙන සලකුණක් වී හමාරයි. තමන්ගේ දියණියට සේම ඇය තවත් බොහෝ දියණිවරුන්ට නන් අයුරින් මවක් වුණා. ඔවුන්ට තමන්ගේ දුක් ගැනවිලි ඉදිරිපත් කරන්නට සෙවණක් සදා දුන්නා. ඉතිං ආදරණීය සමන්මලී ඇන්ටි ඔබගේ ඒ අමිල සේවයට මේ කුඩා මතක සටහන උපහාරයක්ම වේවා. ඔබට නිරෝගී සුව! සතුට!







මෑත කාලයේ ධාබිඳු සාමූහිකය තුළ සමන්මලී සහෝදරියගේ ක්‍රියාකාරීත්වය



බ්‍රිටෝ ප්‍රනාන්දු

# භීෂණය සහ මර්දනය හමුවේ අරගලය අත්නොහළ සමන්මලී...

සමන්මලී ගැන යමක් ලියන්න කියලා ඉල්ලීමක් ආවම, අවුරුදු 40ක පමණ වූ ඉතිහාසය දිග ඇරගන්න එක ලේසි වුනේ නැහැ. ඒත් අමතක කරන්න බැරි අමතක නොවෙන සිදුවීම් ගණනාවක් ඒ ඉතිහාසයේ තිබුණා.

බොහෝ දේවල් ඒ කාලයේ බිය ඉපැද්දුවත් ආපහු හැරිලා බලද්දි ජීවිතේ බේරුණ එකත් පුදුමයක්, දැන් ඒවා හිනාවෙවී මතක් කළ හැකියි. සමන්මලී මුහුණට මුහුණ හමුවුණු දවස නම් මතක නැහැ. ඒත් අපි කවුරුත් කලාපෙට පය ගහන්න කලියෙන් සමන්මලී එහි ඇතුළෙ වැඩ. මම නිවැරදි නම්, කටුනායක මඩමේ බැහැලා හිටපු සිස්ටර් කෙනෙක් එක්ක. ප්‍රෙඩීලත් හිටියා වගේ මතකයි. ඩාබිඳුත් පළවුණා මතකයි.

කටුනායක පල්ලිය වත්තේ ආධුනික ගීත තරඟයක් වගේ කලාපය ඉලක්ක කරලා පවත්වපු උත්සවයට කලාපෙන් ලොකු සහභාගීත්වයක් තිබුණා. මම ඒ උත්සවයේ නරඹන්නෙක් පමණක් වුණා. කොහොම හරි කලාපේ කම්කරුවන් සංවිධානය කරන්න සමන්මලී ලා මූලික වුනා කීවොත් ඒක සත්‍යයක්. කාලය මතක නැති වුනත් ජා-ඇළ පොලිටෙක්ස් සටන කාටත් අමතක නොවන සටනක්. සමන්මලී ඒකෙත් හිටියා. සමන්මලීලාගේ තමා ඒ අරගලය. මූලික වැඩ කොටසේ නායකත්වය ගත්තේ සමන්මලී ඇතුළු කණ්ඩායම.

අපි කලාපයට ඇඟිලි ගහන්න පටන් ගත්තේ 83- 85 වගේ කාලේ. එතකොට තමයි සමන්මලීවයි ඇගේ සැමියා වුන සෝමෙවයි කිට්ටුවෙන් ඇසුරු කරන්න පටන් ගත්තේ.

1989 භීෂණය කලාපෙටත් ඒ වැඩ වලට සම්බන්ධ වුණු පිටස්තර අයටත් අමාරුම කාලයක් වුණා. කටුනායක කොරියා සිලෝන් එකේ වැඩකළ සුරවීරව එළියට දැමීමට විරුද්ධව ආරම්භ කරපු උද්ඝෝෂණය හේතුවෙන් යම් පමණකට භීෂණයේ ඇස අප වෙතට යොමු වුණා. සුරවීර බේරුණේ බොහොම අමාරුවෙන්. මතකය නිවැරදි නම් ඒ උද්ඝෝෂණයේ මූලිකත්වය ගත් කොරියා සිලෝන් දෙන්නෙක් හෝ තුන්දෙනෙක් ඝාතනය කෙරුණා.

1989 කලාපයේ රංජිත් සහ නීති උපදේශක ලයනල් මරා දැමීමෙන් පසුව 1991 දී සංවිධානය කළ පළමු සිහි කිරීමට අපි සහභාගී වුණේ බයෙන් බයෙන්. සමන්මලී සහ සෝමේ ඒ සහභාගි වුණු 16 දෙනා අතරේ හිටියා. 89 ඔක්තෝබර් 27 ඒක තිබුණේ. රංජිත් සහ ලයනල් අතින් ලොකු වැඩ කොටසක් මේ කාලේ සිද්ධ වුණා. මුළු රටම භීෂණයෙන් වෙලා ගත්තා. ආයතනික ගැටලු ආමන්ත්‍රණය කරන්න ගිහින් රංජිත් සහෝදරයා ෆ්ලෝරල් ග්‍රීන්ස් ආයතනයේ වැඩ තහනමකට ලක්ව තිබුණා. ගෘහස්ථ පරීක්ෂණය පැවැත්වුණේ ආයතනය ඇතුලේ. එයට නීති උපදේශක වශයෙන් සහභාගී වුණේ නීති උපදේශක මධ්‍යස්ථානයේ ලයනල් සහෝදරයා. ආයතනය වෙනුවෙන් පෙනී හිටියේ නීතිඥ ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ. රටේ පැවති භීෂණය අවස්ථාවක් කොට ගෙන හිඟ වැටුප් සමඟ නැවත රැකියාව ලැබුණු රංජිත් සහෝදරයා සහ ලයනල් සහෝදරයා, වී මෝල පාර රංජිත්ගේ බෝඩිම අසල දී අතුරුදහන් වෙනවා. ඊට පසු දින අපට ආරංචි වෙනවා දෙදෙනාගේම සිරුරු රද්දොළුව පල්ලිය අසල පිළිස්සෙනවා කියලා.

ජයන්ති හා ලයනල්ගේ පවුල ආරක්ෂා කිරීම සහ ඔවුන් යුක්තිය සොයා යාමේ දී ඔවුන් සඳහා අපට බරපතල ලෙස මැදිහත්වීමට සිදු වුණා. මේ තත්ත්වයන් හමුවේ අපට නිරන්තරයෙන් පොලිස් විමර්ශනවලට මුහුණ පෑමට සිදු වෙනවා. අනෙකුත් සියලු සංවිධාන හා එකතු වෙමින් අපි ලයනල් සහ රංජිත් සිහි කිරීමට විවිධ තර්ජන, බාධක මැද්දේ එකතු වෙනවා. අදටත් එය නිමිත්තක් කොටගෙන අතුරුදහන් වූ සියලු දෙනා සිහිගන්වමින් ඒ සැමරුම රද්දොළුවේ දී සිදු කරනවා.

භිෂණය දස අතම පැතිරුණු මේ කාලේ සමන්මලී සහ සෝමේ රෑට රෑට තැනින් තැන දරුවොත් එක්ක හැංගිලා තමයි ජීවිත බේරා ගත්තෙ. 1992 හෝ 1993 කලාපයේ වැඩවර්ජන රැල්ලක් ආවා. මෙහිදී දොට්ට දැමූ සේවක එකතුව හැටියට කලාපයේ පත්‍රිකා බෙදීමේ තහනම කඩන්න, බලහත්කාරයෙන් පත්‍රිකා බෙදන්න ගත්තු උත්සාහයේ දී UNP ආණ්ඩුව, පොලීසිය දාලා අපට පහර දීලා, කඳුළු ගෑස් ගහලා ඒක කඩාකප්පල් කළා. සමන්මලී සහ සෝමේ තමා ඒ පත්‍රිකා බෙදීම සංවිධානය කරන්න මූලිකත්වය ගත්තේ. ඒ වගේම ඔවුන් මේකෙදි ඇතිවෙන්න ගුටිත් කෑවා. මේ කාලය තුළම තමයි ස්මාර්ට් ෂර්ට් වැඩ වර්ජනය සිදු වන්නේ. එහි දී මා ඇතුළුව තවත් 12ක් පමණ පිරිසක් අත් අඩංගුවට ගන්නවා. ඒ නත්තල් දින ආසන්නයේ. සමන්මලී ලා විවිධ තැන්වල කැට ව්‍යාපාර කරලා එකතු කරගත් මුදල් වලින් තමයි අපිට ඇප තියලා බේරගත්තේ.

1994 චන්ද්‍රිකාගේ ජයග්‍රහණයත් එක්ක ආරම්භ වුන කොරියා සිලෝන් සටනේ දීත් සමන්මලී ලා තමයි ඒකේ මූලිකත්වය ගත්තේ. එහෙම බලද්දී ඒ කාලේ කොහේ හෝ කම්කරු අරගලයක්, වර්ජනයක් පටන් ගත්තොත් එතන පදිංචි වෙලාවගේ වැඩකරන සංස්කෘතියක් අපට තිබුණා. ""ඩාබිඳු සාමූහිකය" සහ "කලාපේ අපි" සහ ප්‍රෙඩීලා ඒ සංස්කෘතිය ඇති කරන්න මූලික වුණා.

සමන්මලී ආපසු හැරිලා ඇගේ ජීවිතය ගැන බැලුවොත්, ඇය පැමිණි මේ ගමනේ දී ජීවිත තර්ජන ඇතුළු විවිධ දුක්කරදර කම්කටොළුවලට ඇයත් සෝමෙත් දරුවොත් මුහුණ දුන්නා.

ඒත් මොන කරදර ආවත් උන්ගේ පවුලම ඒ අරගලය අත්හැරියේ නැහැ. උන් උන්ගේ අරමුණු කොහොම හරි අල්ලගෙන හිටියා. අසීරුවෙන් බාධක කම්කටොලු මැද්දෙන් ලොකු ගමනක් ආවා.

සමන්මලීගේ දුව හැටියට චමිලාත් සමන්මලීගේ පාරෙම ගමන් කිරීම සතුටක්. සමන්මලී හොඳ ලේඛිකාවක්. එහෙම නැතුව "ඩාබිඳු" වගේ පත්තරයක් කරන්න බැහැ. ඇය හොඳ සටන්කාමියෙක්. උන්ගේ පවුලේ හැම එකාගෙම ලේ වල ඒ සටන්කාමීත්වය තියෙනවා.

ඉතින් සමන්මලී සියලු මැදිහත්වීම් වලට ස්තුතියි. අරගල ඉතිහාසයට ඔබගේ දායකත්වය කිසිදාක මකන්න බැහැ.



**වයලා අබේගුණවර්ධන**

# මුතු බවට පෙරළුණු 'ඩාබිඳු'

දකුණු ලකේ සොඳුරු ගමකැ, 87-89 බිහිසුණු දුමාරයට හසු වූ අවිචාර සමයෙකැ, බටහිරට පැමිණීමට ලද වරම සුළු පටු නොවේ. සමන්මලී සහෝදරියගේ පූර්ව දැන හැඳුනුම්කම් මත එම ගමනට අඩිතාලම වැටුණු බව කිව යුතුය.

ප්‍රේමදාස ආණ්ඩුවේ දෘඩ පාලනය මත මෙ සමයේ කිසිඳු සංවිධානයකට වැඩ කිරීමේ නිදහසක් නොතිබූ අතර, හා පුරා කියා ගමෙන්-නගරයට ආ තරුණියක ලෙස මුල දී මට ද බිය මුසු හැඟීමෙන් කටයුතු කිරීමට සිදු වූ බව කිව යුතු ය.

දැන් "ඩාබිඳු" වෙත අවධානය යොමමි.

"ඩහබිඳුවේ" අගය කිහිප ආකාරයකින් ඉස්මතු කිරීමට සාමූහිකයේ අපි කටයුතු කළෙමු.

ඉන් පළමුවැන්න, "ඩාබිඳු" ප්‍රකාශය යි. එය මුළුමනින්ම වෙළඳ කලාපයේ කම්කරු අයිතීන් රැකීමට ප්‍රමුඛතාවය දුන් ප්‍රකාශනයක් විය. එහි කම්කරු පුවත්වලට අමතරව ඔවුන්ගේ නිර්මාණවලට ද ඉඩ කඩක් ලබා දී තිබුණි.

1987 සැප්: 25 දා මා එහි සේවයට බැඳෙන කල, ඩාබිඳු නිකුත් වූයේ ලිතෝ මුද්‍රණාලයෙනි. එකල පැවැති ලාභදායී මුද්‍රණ පහසුකම එය විය. පසු කලෙක offset මුද්‍රණ ක්‍රමය සුලභ වන විට, ලිතෝ මුද්‍රණ ක්‍රමය අභාවයට ගියේ ය. ඉතා සුළු අරමුදලකින්, අරපිරිමැසුම් සහගත කර්තව්‍යක නියැළුණු අපි 'ඩාබිඳු' හරහා වැටුපක් නොලැබ, සුළු දීමනාවකින් යැපීම් කටයුතු කරගෙන ගියෙමු.

ඒ වෙනුවට මා දැනුම, අත්දැකීම්, මානව සබඳතා, විකල්ප ධාරාවේ අදහස්, නැවුම් සිතුවිලි හා ආකල්ප, ශක්‍යතා වර්ධනය, මේ ආදී බොහෝ දෙයින් ලද පෝෂණය භෞතික සම්පත් ඉක්මවා ගිය බව කිව යුතුය.

ඩාබිඳු ප්‍රකාශනයේ ලා මගේ පරිකල්පනය අවදි කරමින් විවිධ විශේෂාංග ඇරඹීමේ ලද ඉඩකඩින් මම උපරිම ප්‍රයෝජන ගතිමි. කලාපේ මතක පොත, පොඩි එකීගේ කතාව, හෑල්ල, හතර පදය, ලිය පියස, පත් ඉරුව, .... ආදී විශේෂාංග ඒ අතුරින් මා මතකයට එබෙයි. කාර්යාලීය දුරකතන පහසුකමක්වත් නොමැතිව ඉතා සරලව වැඩ කරගෙන ගිය 'ඩාබිඳු' සහෝදරියෝ ඒ සියල්ල විඳ දරා ගත් පිරිසක් වූහ. මේ නිසා ඩාබිඳු සියලුම සන්නිවේදන කටයුතු පවත්වාගෙන ගියේ ලියුම් මාර්ගයෙනි. දිනපතා ලැබෙන ලියුම් මිටියේ 'ඩාබිඳු' පුවත්පතට එවන නිර්මාණ, අදහස්, විවේචන ද විය. ඒවා කියවීම ද සුන්දර වින්දනයකි.

ඩාබිඳුවේ අගය හුවා දැක්වීමට ගෙන ගිය, ඊළඟ වැදගත් ක්‍රියාමාර්ගය වූයේ වැඩකරන්නන්ට සිදුවන අසාධාරණය වෙනුවෙන් සාමූහිකය මැදිහත් වී ක්‍රියා කිරීමයි. ඔවුන් සේවයෙන් පහ කිරීම, අතිකාල සේවා ගැටළු, ආයතන තුළ සිදුවන කාන්තා අතවර, වාර්ෂික වැටුප් වැඩි කිරීම් පිළිබඳ ගැටළු, ආයතනයේ දී සිදුවන හදිසි අනතුරු මේ ආදිය පෙන්වා දිය හැකිය.

ඩාබිඳුවේ අගය මතු කළ තෙවැනි පියවර වූයේ, පොදු අරගලය යි. උද්ඝෝෂණ, පෙළපාලි, නිහඬ විරෝධතා, .... මීට අයත් විය. මෙවන් කටයුතු හුදකලා අරගල නොවූ අතර, සන්ධානගත ව ඊට මුහුණ දුනිමු.

මීට අමතරව පොදුවේ අනෙකුත් බාහිර සංවිධාන රාශියක් සමඟ අගනුවර පමණක් නොව, ඉන් පරිබාහිර ප්‍රදේශවල ක්‍රියාකාරිත්වයන් සඳහා ද 'ඩාබිඳු' නොපැකිල උර දුන්හ. වතුකරය, පරිසරය, කෘෂිකර්මය, කාන්තා හා ළමා හිංසන, වැනි ක්ෂේත්‍ර නියෝජනය කෙරිණි. මා ඩාබිඳු සාමූහිකයේ සේවය කරන කාලය තුළ අමතරව කිහිප දෙනෙක් සිටියත්,

දීමනා ලැබුවෝ අප තිදෙනෙකු පමණක් බව කිව යුතුය. විවේකය, නිවාඩු, පෑ අටේ සේවය, අමතර වියදම්, තේ වියදම්, ටැක්සි වියදම්, .... ආදිය නොපතා අපි වැඩ කළෙමු. සීදූව, අමන්දොළුව, ආඬිඅම්බලම, ජයවර්ධනපුරය ආදි ප්‍රදේශවල අතුරු පාරවල අපි ඇවිදගෙන ගියේ 'ඩාබිඳු' ද මිටි බැඳ ගෙනය. විශේෂයෙන් ඉරු දිනය. බෝඩින් වලට යෑමටත්, නීති උපදෙස් මධ්‍යස්ථානයේ ගත කරමින් කලාපේ සහෝදර, සහෝදරියන් හමු වීමටත් අපි උත්සාහ ගතිමු.

1987 සිට 90 දක්වා 'ඩාබිඳු' හි ගත කළ සේවා කාලය කොහෙත්ම සුමට නොවීය. ගමෙන් නගරයට පැමිණි මුල් වකවානුවේ 'කාකි ඇඳුම්' පවා මා හට ගෙන ආවේ බිය මුසු හැඟීම් ය. මේ යුගයේ ක්‍රියාකාරීව පැවති රාජ්‍ය නොවන සංවිධානවලට ද කණ කොකා හැඬුවේ ය. ස්වාධීන මතවාදයකට හෝ ස්වාධීන ක්‍රියාකාරිත්වයකට ඉඩක් නොලැබීම 'ඩාබිඳු' ට ද බලපෑවේය. පුවත්පතේ රතු අකුරින් මුද්‍රිත ඩාබිඳු ලේබලයේ වර්ණය පවා වෙනස් කිරීමට පොලිස් අණ ලැබුණි. එය දුඹුරු පාට ගැනුණේ ඉනික්බිතිව ය.

එහෙත් 'ඩාබිඳු'ට ඉතා සමීපව ක්‍රියා කළ සහෝදරයින් දෙදෙනෙකුගේ සිරුරු රද්දොළුව මංසන්ධියේ ටයර් සෑ මත දැවී ගියේ ඉන් අනතුරුවය. Floral Greens හි සේවය කළ රංජිත් සොයුරා සමඟ නීති උපදෙස් මධ්‍යස්ථානයේ ලයනල් සහෝදරයා සිය සේවා ආයතනයේ විනය පරීක්ෂණයකට ගොස්, ආපසු එමින් සිටි අතරතුර මෙකී සහගහන අපරාධයට ගොදුරු විය.

කිසිඳු රහසිගත දේශපාලන ව්‍යාපාරයකට අයත් නොවූ ඔවුන් දෙදෙනාම අමානුෂික අපරාධයකට ගොදුරු විය. එම වියෝගය, කම්පනය නිසාම ඩාබිඳු ද යම්තාක් දුරට පසු බැස්සේ ය. මෙ සමයේ ඩාබිඳු කාර්යාලය පවත්වාගෙන ගිය කඳානේ සමන්මලී සහෝදරියගේ නිවසට කිහිප වරක්ම පොලිසිය සුවඳුක් බැලීමට පැමිණියේ ය. එසේම පෙරළා අපටද පොලිස් ස්ථානය වෙත කිහිප වරක්ම යෑමට සිදු විය.

වැලිසර කිතුනු නිවසක මෙ කල මම නවාතැන් ගෙන සිටියෙමි. සමාජ අත්දැකීමෙන් තොරව නිවස තුළම දිවි ගෙවූ ගෙහිමි කත මගේ කාමරයේ තිබූ රතු පොත් කට්ටල (රුසියානු ග්‍රන්ථ) දැක බියට පත් වූවා ය. පොතක් පතක් තබා අකුරක්වත් නොකියවන ඇය, කිසිඳු පැකිළීමකින් තොරව පොත් ගිනිලෑමට හෝ නොහැකි නම් වෙනත් නවාතැනක් සොයා ගන්නා

ලෙස හිතවත්කම පෙරදැරිව ඉල්ලා සිටියා ය. කවදත් පොත් මට මහඟු ධනයකි. තවත් නවාතැනකට ගියත්, මම මාතර වීමත්, පොත් ගොන්නත්, සංවිධානෙක වැඩ කිරීමත් හරස් වීමට ඉඩ ඇති බැවින්, කොතරම් දුර වුවත්, ඒ වන විට ජයවඩනගම විසූ මගේ සහෝදරියගේ කුලී නිවසේ නවාතැන් ගතිමි.

එතැන් සිට බස් තුනක හෝ හතරක වෙහෙස නොබලා කළානට පැමිණියෙමි. වැලිසර සිටි සමයේ නම්, තුණ්ඩුවට පොදු ගමනාගමනය ඇන හිටින විට, මම පයින් ගෑටුවෙමි. සමන්මලී සහෝදරිය එය අනුමත නොකළත්, කාර්යාලයට පමණක් සීමිත වූ ලිපි ගොනුවක කටයුතු කිරීමට මැළි නොවුනෙමි. රටේ තත්ත්වය මත නිවාඩු හා විවේකය ලද හැකි වුවත්, අනිසි පල නෙලීමට රිසි නොවූයෙමි.

සමන්මලී සහෘදියගේ අහඹු හමුව මා විකල්ප මඟකට රැගෙන ආ හැරවුම් ලක්ෂ්‍යය විය. වරෙක සහෝදරියක ලෙසත්, තවත් වරෙක මවක් ලෙසත්, එසේම මිතුරියක ලෙසත් මා දිවි මඟට සමීප වූවා ය. 87 දී ඇරඹී ඒ මිතුදම අද දක්වා ම අඛණ්ඩ ව පවත්වා ගෙන යමින්, කෘතවේදීත්වය තහවුරු කරමි. ගමෙන් නගරයට පැමිණෙන බොහෝ දෙනාට මුල අමතක වීමට ඒ හැටි කාලයක් ගත නොවේ. එබැවින් අක්-මුල් සහිතව දිවි මඟ ගෙවමි.

සමන්මලී සහෝදරිය කාර්යශූර තැනැත්තියකි. ඇයගේ සැමියා (සෝමේ අයියා) ඇයට පෙරාතුව දේශපාලන ක්ෂේත්‍රයට අවතීර්ණව සිටියත්, දරුවන් සිව් දෙනාම (ඇතැම් විට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු පසෙක දමා) සංවිධානයේ විවිධ වැඩවලට සහභාගී කර ගැනීමට තරම් දක්ෂ වූවා ය. අද ඔවුන් වෙනත් රැකියාවල නියුතු වුවත්, විකල්ප මතවාදයෙන් ඉවත් වී නැත.

එහෙත් සතුටට කාරණය නම් චමිලා තුෂාරි දියණියක වශයෙන් මවගේ මඟ යමින් 'ඩාබිඳු' ඉහළ ස්ථානයක රඳවාගෙන සිටීමයි.

ඊකල 'යූනියන් කාබයිට්' වර්ජකයින් සඳහා දරුවන් අතින් කටින් එල්ලාගෙන බත් තැම්බූ සමන්මලී සහෘදිය ගෘහයටම සින්න වූ ලැජ්ජාශීලී කතක් වූවා ය. එහෙව් ඇය පසුකලෙක සටන් බිමේ පෙරමුණ ගත්තීය.

කාලය මැවූ වෙනසක අරුමේ !
ඇයටත්, ඩාබිඳුටත් චිර ජීවනය වේවා !



මාලා රත්නශීලී

# වෘත්තීය සමිති ව්‍යාපාරයේ පුරුෂ මූලිකත්වයට එරෙහි ස්ත්‍රීන්ගේ ආගමනය

1980 දශකයේ පැවැති වැඩ වර්ජනවල දී බොහෝවිට ඒවායේ මූලිකත්වය ගනු ලැබුවේ පිරිමි පාර්ශවය විසින් වුවත් බොහෝ ගැටළු වලට මුහුණ දුන් අති බහුතරය කම්කරු කාන්තාවන් විය. එකල වෘත්තීය සමිති නායකයින් කාන්තාවන්ගේ ගැටළු වෙනුවෙන් පෙනී සිටියද මේ වෘත්තීය සමිති නායකයින් විසින් වැඩවර්ජිත කාන්තාවන් හිංසනයට පත් කරන ලදී. වෘත්තීය සටන් ඉතිහාසය ගැන කියවෙන විට එවැනි කරුණු කිසිඳු තැනක සඳහන් නොවී තිබීම කණගාටුවට කරුණකි.

මෙම කාල වකවානුවේ දී ගම්වලින් නගරය කරා සංක්‍රමණය වූවන් අරගලය සඳහා ශක්තිමත් කොඳු නාරටියක් බඳු විය. කර්මාන්තශාලා සේවකයින් මුළුමනින්ම පිටතට පැමිණ වැඩවර්ජනය කළ ද ඔවුනට උදව් කිරීමට, ඔවුන් සමඟ ශක්තිමත් ලෙස දෑත් බැඳගන්නට වෘත්තීය සමිති වලට ශක්තියක් නොතිබිණි. එම හිඩැස පුරවන ලද්දේ කාන්තා සංවිධාන විසිනි. එම අරගලකරුවන්ට කාන්තා සංවිධානවල මග පෙන්වීම විශාල ශක්තියක් විය. ඒ තුළින් මෙම වෘත්තීය සමිති පෙරමුණ ගෙන අරගලය ජයග්‍රහණය කරා ගෙන යාමට කටයුතු කරන ලදී. මෙම වැඩ වර්ජන මුලින් ඇති වන්නේ නිදහස් වෙළඳ කලාප වලින් පිටත ප්‍රදේශවල ය. ඒකල කාර්මික ජනපදය තුළ ඇති වූ වැඩ වර්ජනය එහිදී විශේෂත්වයක් ගනු ලබයි. කාර්මික ජනපදය පිළිබඳව මතක ආවර්ජනය කළහොත් එය

ආරම්භ වන්නේ 1964 වර්ෂයේ දී යි. මෙහි වැඩ වර්ජන වලදී බහුතර කාන්තාවන් පිරිසක් අලුත් අවුරුදු දීමනා, නත්තල් දීමනා මෙන්ම වැටුප් වැඩිකිරීම්, හිඟ වැටුප් ලබා ගැනීම් ආදී ගැටලු කිහිපයක්ම මූලික කරගෙන ඇත. මෙම අවස්ථාවන්වල දී කාන්තා සංවිධාන වැඩ වර්ජන සඳහා උපකාර කරන්නට විය. විවිධ අවස්ථා වලදී දේශපාලන බලපෑම්, වෘත්තීය සමිති බලපෑම් ආදී විවිධ අභියෝගයන්ට මුහුණ දීමට ඔවුන්ට සිදු විය.

මෙම වැඩ වර්ජනවල දී පුරුෂ පාර්ශවය විසින් වැඩවර්ජිත කාන්තාවන් සිය පෞද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා යොදා ගන්නා ලදී. කාන්තාවන් මෙලෙස රැවටීමට ලක් කරමින් ඔවුන්ව ලිංගික සූරාකෑමට ගොදුරු කර ගැනීමට එරෙහිව කාන්තා සංවිධානයක් ලෙසින් කටයුතු කරන්නට ස්ත්‍රී මධ්‍යස්ථානය මේ අවස්ථාවෙහි දී ඉදිරිපත් විය. ඒ හේතුවෙන්, ස්ත්‍රී මධ්‍යස්ථානයෙන් මා ඇතුළු පිරිසක් පිටුවහල් කිරීමට මෙයට මුල් වූ වෘත්තීය සමිතියක පුරුෂ පාර්ශවය එක්ව සංවිධානාත්මකව කටයුතු කළේය. එපමණකුත් නොව, අපව සංවිධානයෙන් එළියට පන්නා දමමින් ස්ත්‍රී මධ්‍යස්ථානයෙහි පාලන බලය ද ඉතාම උපායශීලීව එම වෘත්තීය සමිතිය විසින් අත්පත් කරගන්නා ලදී. පසුව ඔවුන් එම මධ්‍යස්ථානයේ සාමාජික කාන්තාවන් පෙන්වමින්, පුරුෂාධිපත්‍ය පතුරවමින් මෙම කාන්තාවන් සිය අවශ්‍යතා වෙනුවෙන් පරිහරණය කරන්නට විය. මෙම පුරුෂයින්ගේ නායකත්වයට රැවටී ඔවුන්ට පක්ෂපාතී වූ ඇතැම් සාමාජිකාවන්ගේ පෞද්ගලික අවශ්‍යතා මුල් කර ගනිමින් සංවිධාන කටයුතු සිදු කරන්නට පටන් ගත් අතර එය ස්ත්‍රී මධ්‍යස්ථානයෙහි අභිමතාර්ථයන්ට මහත් කැළලක් ඇති කරන්නට සමත් වූ කාරණාවක් විය.

ස්ත්‍රී මධ්‍යස්ථානය වැනි කාන්තා සංවිධානයක් පිහිටුවා ගනු ලැබුයේ නිදහස් වෙළඳ කළාපය තුළ කාන්තා සේවිකාවන් මුහුණ දුන් පීඩාවන් ආමන්ත්‍රණය කිරීම පිණිසය. වෘත්තීය අයිතිවාසිකම් කිසිවක් භුක්ති විඳීමට පාලකයින් අවස්ථාවක් නොදුන් පසුබිමක් තුළය. එහෙත් වෘත්තීය සමිති නායකයින් පිරිසක් විසින් අප කණ්ඩායමක් සැලසුම් සහගතව එම මධ්‍යස්ථානයෙන් පිටමං කර සිය බලය යොදවා එම සංවිධානය තමන්ට අවශ්‍ය ආකාරයට මෙහෙයවා ගත හැකි පරිදි අත්පත් කරගැනීමෙන් පසුව කලාපය තුළ වැඩකරන දහස් ගණනක් කාන්තා සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම උදෙසා සමන්මලී සහෝදරිය ප්‍රමුඛ

කාන්තා ක්‍රියාකාරීන් පිරිසක් සමඟ 'ඩාබිඳු සාමූහිකය' පිහිටුවා ගැනීමට අපට හැකිවිය. පැවැති සාම්ප්‍රදායික පුරුෂ මූලික වෘත්තීය සමිතිවල කාන්තා විරෝධී ක්‍රියාකාරීත්වයට මෙය කදිම පිළිතුරක් විය. කාන්තා සේවිකාවන් වැඩි වැඩියෙන් ඩාබිඳු සාමූහිකය වටා ගොනුවීමට කැමැත්තක් දැක්වූයේ සිය සේවා ස්ථානයන් තුළ දී සිදුවන විවිධ හිංසනයන් විඳ දරා ගනිමින් සේවය කිරීමට පුරුදු පුහුණු වී සිටි ඔවුන්ට සිය අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නැගීමට ඩාබිඳු සාමූහිකයේ ආරම්භය මහත් අස්වැසිල්ලක්ම වූ බැවිනි.

මෙලෙස පැවැති පුරුෂාධිපත්‍යයික වෘත්තීය සමිතිවලට අභියෝග කරමින් කාන්තා ක්‍රියාකාරීන් පිරිසක් විසින් ඩාබිඳු සාමූහිකය ආරම්භ කොට නිදහස් වෙළඳ කලාපය තුළ වසර හතලිහක් මුළුල්ලේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටිමින් කටයුතු කිරීමට ලැබීමත් එවැනි හැකියාවක් සහිත සංවිධානයක ආරම්භයට උරුමකම් කීමට ලැබීමත් මා ලද භාග්‍යයක් ලෙසින් සලකමි.

හතලිස් වසරක ගමනේ දී විවිධ අභියෝග වලට මුහුණ දීමට සංවිධානයට සිදු විය. එහෙත් එම අභියෝග ජය ගනිමින් කාන්තා නායකත්වයත් යටතේ සංවිධානය පවත්වාගෙන යාමට සමන්මලී සහෝදරිය දැරූ උත්සාහය පැසසුම් ලැබිය යුතුමය. පුරුෂාධිපත්‍යය රජකරවන වෘත්තීය සමිති ක්ෂේත්‍රයේ කාන්තා නායකත්වය තහවුරු කරන්නට සමත් වූ ඇය විසින් සිදුකරන ලද්දේ ඓතිහාසික කාර්යභාර්යකි.

තවද පවතින වෘත්තීය සමිති තුළ ද දක්නට ලැබෙන්නේ පුරුෂ නායකත්වයකි. ඔවුන් කාන්තාවන්ගේ අවශ්‍යතාවයන් සලකා බලන්නේ නැත. ශ්‍රී ලංකාව තුළ පිහිටි බොහොමයක් වෘත්තීය සමිති දේශපාලන පක්ෂ හා සම්බන්ධ වූ ඒවා වන බැවින් මැයි දිනය දාත් දක්නට ලැබෙන්නේ විවිධ පාටින් යුතු ධජ පතාක සහ විවේචන සහිත සටන් පාඨය.

කම්කරු දිනයටත් ඇතැම් ආයතන නිවාඩු නොදීම නිසා නිදහස් වෙළඳ කලාපයේ කාන්තාවන්ට වැඩ කිරීමට සිදු වේ. එනිසාවෙන් ඔවුන්ට වෘත්තීය සමිති වටා එක් රැස් වීමට බාධා පැමිණේ. කිසියම් ආයතනයකට වෘත්තීය සමිතියක් අවශ්‍ය වන්නේ සේව්‍යයා සහ සේවා දායකයා අතර

ආයතනයේ දියුණුව සහ සේවක දියුණුව පිළිබඳව සුහදව සාකච්ඡා කිරීම තුළින් වඩාත් ඵලදායී සේවාවක් ලබා ගැනීමට සහ ලබා දීමටයි. අවාසනාවකට කරුණ නම් ඒ පිළිබඳව සේව්‍ය-සේවක දෙපාර්ශවයම අවධානය යොමු නොකිරීමයි.

නමුත් BOI ආයතනයේ කළමණාකරු ඩාබිඳු කාර්යාලයට පැමිණ අප සමඟ සුහද සාකච්ඡාවක් පවත්වා පවසා සිටියේ, "ඩාබිඳු පුවත්පත අපට ද ලැබෙනවා. එහි කම්කරු ප්‍රශ්න ගැටළු අඩංගුයි. අපිත් සඟරාවක් කරනවා. ඩාබිඳු වලට ගොඩක් කම්කරු පුවත් ලැබෙනවා. එම නිසා අපිත් එක්ක එකතුවෙලා වැඩ කරමු ද ?" යන්න යි. නමුත් අප එයට එකඟ වූයේ නැත. ඒ මන්ද යත් එවිට අපට ස්වාධීනව ඩාබිඳු පුවත්පතට ලිවීමට නොහැකි වන නිසාය. එහෙත් පසුව, වෘත්තීය සමිතිය සහ කාන්තා සංවිධාන සමඟ කලාපය තුළ පවතින අසාධාරණකම් අඩුපාඩුකම් පිළිබඳව සාකච්ඡා කර ඒවාට විසඳුම් ලබාදීමට ඔවුහු එකඟ වූහ.




මෑත කාලයේ ඩාබිඳු සාමූහිකය තුළ සමන්මලී සහෝදරියගේ ක්‍රියාකාරීත්වය






මෑත කාලයේ ඩාබිඳු සාමූහිකය තුළ සමන්මලී සහෝදරියගේ ක්‍රියාකාරීත්වය



චාරුණී ගමගේ

# කම්කරු අයිතීන් උදෙසා කැප වූ ආදරණීය ගමන

රාජ්‍ය ත්‍රස්තවාදයේ ගොදුරක් බවට පත්වන්නට සිදු වූ මා හට ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක ප්‍රදේශය වෙත සංක්‍රමණය වන්නට සිදු වූයේ, මාගේ ඉදිරි අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා විකල්පයක් මා උපන් ගම තුළ තවත් නොතිබූ පසු බිමක ය. ඒ 1990 දශකයේ මුල්භාගයේ දී ය.

මම මගේ සහෝදරිය සමඟ සීදූව ප්‍රදේශයේ නවාතැන් ගත් අතර, කටුනායක නිදහස් වෙළඳ කලාපයේ සේවිකාවක ලෙස රැකියාවක් ලබා ගැනීමට මට හැකියාව ලැබුණි.

මා උසස් අධ්‍යාපනය හදාරා තිබුණේ කලා අංශයෙන් නොවුන නමුත් කියවීමට මෙන්ම ලිවීමට ද මම බොහෝ ආශා කළෙමි. හැකි සෑම අවස්ථාවකම පාහේ මා විවේක කාලය ගත කිරීමට තෝරා ගත්තේ ලිවීම හෝ කියැවීමයි. එහි දී මා හට එවකට පැවති 'හරය' පුවත් පතට විවිධ ලිපි සැපයීමෙන් දායකවන්නට හැකි වූ අතර, මාගේ නිදහස් වෙළඳ කලාප රැකියාවට ද මාස දෙකක වැනි කෙටි කලෙකින් ආයුබෝවන් කීමට මට සිදු වූයේ රජයේ ගිණුම් ලිපිකරු තනතුරු සඳහා වන තරඟ විභාගයට යාම සඳහා දීර්ඝ නිවාඩුවක් ලබා ගැනීමට අවශ්‍ය වූ බැවිනි. කෙසේ වෙතත් පැවති දේශපාලන වාතාවරණයන් තුළ සියලු සුදුසුකම් සපුරා තිබියදීත් දේශපාලන පළිගැනීම් හේතුවෙන් රජයේ රැකියාවක් මා වෙත නොලැබී

ගිය තත්ත්වයක් තුළ නැවත කටුනායකට පැමිණීම හැර අන් විකල්පයක් මා වෙත නොවූයේ නිවසේ රැඳී සිටීම ද එවක පැවති වතාවරණය සුදුසු නොවූ බැවිනි.

කෙසේ වෙතත් මා, මාගේ සහෝදරිය වෙත නැවත පැමිණ රැකියාවක් සොයා ගැනීම සඳහා උත්සාහ දරමින් සිටින අතරතුර, මාගේ ජීවිතයේ අලුත් ගමනක් ආරම්භ කිරීමට ඩාබිඳු සාමූහිකය මා වෙත ඉඩහසර ලබා දුනි. සැබවින්ම එය මාගේ ජීවිතයේ ලත් වටිනාම අවස්ථාව බැවි අද මේ මොහොතේ දී පවා සිහිපත් කරන්නේ සෙනෙහසිනි. එය මාගේ ජීවිතයට නව අරුතක් නව දැක්මක් ලබා දුන් අවස්ථාවක් විය. විවිධ ආකාරයේ පීඩනයන්ට මුහුණපාමින් සිටි නිදහස් වෙළඳ කලාප කම්කරුවන්ට සාධාරණය ඉටු කිරීම සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම වෙනුවෙන් බොහෝ දුෂ්කරතා මධ්‍යයේ කැප වී ක්‍රියා කරමින් සිටි ඩාබිඳු සාමූහිකය සහ එහි නායකත්වය සමග මගේ අරමුණු සහ ආශාවන් මනා ලෙස ගලපා ගැනීමට හැකියාව ලැබුණි.

90 දශකයේ මුල් අවධියේ නිදහස් වෙළඳ කලාප කම්කරුවන්ගේ ප්‍රශ්න සහ ගැටළු වෙනුවෙන් පෙනී සිටීමට අපට විශාල වෙහෙසක් දැරීමට සිදු විය. අවම ප්‍රවාහන පහසුකම්, අවම මාධ්‍ය පහසුකම් තුළ අපට නොවැටී ක්‍රියා කිරීමට ශක්තිය දුන්නේ සමන්මලී අක්කාගේ අප්‍රතිහත ධෛර්ය සහ මග පෙන්වීමයි. ඇගේ ශක්තිය තුළ, ඇගේ දරාගැනීමේ හැකියාව තුළ, එකම අරමුණක එල්බ සිටීමේ ඇගේ හැකියාව තුළ කන්කෙඳිරි ගාන්නට අපට ඉඩක් නොදුන්නා වැනිය. සියලු අවහිරකම් අපහසුතාවයන් විඳ දරා ගනිමින් කම්කරුවන්ට වඩාත් හොඳ අනාගතයක් නිර්මාණය කිරීම සඳහා අප යන ගමන ශක්තිමත් කළේ ඇයයි. කටුනායක සහ බියගම නිදහස් වෙළඳ කලාප තුළ අපි ක්‍රියාකාරීව සිටියෙමු. කම්කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සෑම ඉරු දිනෙකම පාහේ සංවිධානය කළ අතර, කම්කරු නීතිය, ගෘහස්ථ හිංසනය වැනි මාතෘකා පිළිබඳව වඩා ඉස්මතු කිරීම් හා වඩාත් කම්කරු කාන්තාවන්ට දැනෙන අයුරින් කතා කිරීම සඳහා අපි බොහෝ අවස්ථාවල කෙටි නාට්‍ය නිර්මාණය කළෙමු. ඒ සඳහා හැකි සෑම අවස්ථාවකම කම්කරුවන්ගේ සහයෝගය ද ලබා ගන්නට කටයුතු කළෙමු.

කම්කරුවන්ගේ ප්‍රශ්නවලට මූලිකත්වය දෙමින් ප්‍රකාශයට පත් වූ ඩාබිඳු පුවත්පත ද සමාජ මාධ්‍ය නොතිබූ එම වකවානුවේ කම්කරු ප්‍රශ්න කතාකිරීම සඳහා වූ තෝතැන්නක් විය. කම්කරුවන්ගේ නිර්මාණ එළිදැක්වීම සඳහා හොඳ අවස්ථාවක් ද ඒ තුළින් හිමිවිය.

කටුනායක නිදහස් වෙළඳ කලාපයේ ස්මාර්ට් ෂර්ට් ආයතනය ස්වකීය අයිතීන් ඉල්ලා සිදු කරන ලද වැඩ වර්ජනයක් හේතුවෙන් කම්කරුවන් සියයකට අධික ප්‍රමාණයක් රැකියාවෙන් දොට්ට දැමීමට එවක පාලකයන් විසින් කටයුතු කරන ලදී. එහිදී ඩාබිඳු සාමූහිකය, ඒ වෙනුවෙන් පූර්ණ මැදිහත්වීමක් සිදු කළ අතර, එකී කම්කරුවන්ට නීති ආධාර ලබා දීමට මැදිහත් වෙමින් ක්‍රියා කළා සේම කැට ව්‍යාපාර කරමින් පරිත්‍යාගශීලීන්ගේ ආධාර ලබා ගනිමින් ඔවුන්ගේ ආර්ථිකයට හයියක් වීම වෙනුවෙන් ඔවුන් සමඟ එක්ව කටයුතු කළාය.

ඒ අවධියේ සිදු වූ බියගම ඇන්සල් ලංකා වර්ජනය හේතුවෙන් සේවයෙන් පහකරනු ලැබූ කම්කරුවන් වෙනුවෙන් ද එවැනිම සේවයක් කිරීමට ඩාබිඳු සාමූහිකයට හැකියාව ලැබුණි. දිගු කාලයක් පුරා පැවති ඔවුන්ගේ නඩු විභාගය වෙනුවෙන් ඩාබිඳු එම කම්කරුවන්ට සහයෝගය ලබා දෙන්නට කටයුතු කරන ලදී. එවක "අංගුලිමාල මැෂින් යැයි අන්වර්ත නාමයෙන් හඳුන්වනු ලැබූ ෆ්ලෝරල් ග්‍රීන්ස් ආයතනයේ අනතුරුදායක ලෙස කම්කරුවන්ගේ ඇඟිලි කැපී යන මැෂින් ඉවත් කරන ලෙස සහ ඒවාට හසුව ඇඟිලි අහිමි වූ කම්කරුවන් වෙනුවෙන් හඬක් නගන්නට ඩාබිඳු සාමූහිකයට හැකි වූවා සේම, පාලකයන් විසින් වන්දි ලෙස ඉතා අඩු මුදලක් ලබා දීමට තීරණය කර තිබූ ෆ්ලෝරල් ග්‍රීන්ස් කම්කරුවෙකුට පූර්ණ වන්දි මුදල ලබා ගැනීම සඳහා මෙහෙයවීමට ද හැකියාව ලැබිණි. ඩාබිඳු සාමූහිකයේ අවධානය යොමු වූයේ කම්කරුවන්ගේ වෘත්තීමය ගැටළු සම්බන්ධයෙන් පමණක් නොවේ. කෝට්ටන්න ප්‍රදේශයේ දී දූෂණයට ලක් වූ තරුණියක වෙනුවෙන් ඇය රෝහල් ගත කිරීමේ සිට උසාවියෙන් චූදිතයාට දඬුවම් නියම කිරීම දක්වා වූ සියළු කර්තව්‍යයන් වෙනුවෙන් පෙනී සිටිමින් තරුණියගේ කායික මානසික සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම දක්වා වූ සියළු ක්‍රියාවලීන් සඳහා දායකත්වය සපයන

ලද්දේ ඩාබිඳු සාමූහිකය බවට මාගේ මතකයේ ඇත. එසේ එවක රාජ්‍ය අවධානය කිසිසේත් නොලද, මාධ්‍ය අවධානය පවා අහිමිව තිබූ, සමාජ ගෞරවය අංශු මාත්‍රයක් පවා නොලද කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටින්නට ඩාබිඳු සාමූහිකය ක්‍රියා කළේ, රජයේ, නිදහස් වෙළඳ කලාප පාලකයන්ගේ මෙන්ම නේවාසිකාගාර හිමියන්ගේ විවිධ කෙනෙහිලිකම් සහ තර්ජනයන් මධ්‍යයේ බැව් නොකියාම බැරිය. එකී අභියෝග ජයගැන්මෙහි ලා ඩාබිඳු සාමූහිකයේ නායකත්වය මෙන්ම, එකිනෙකා අතර පැවති ආදරණීය සබැඳියාවත්, බලහත්කාරයෙන් තොරව එකිනෙකා වෙත පවරාදුන් වගකීම් සමූහයත් ඉවහල්වන්නට ඇතිබැව් සිහිපත් කරන්නෙමි. සැබැවින්ම ඩාබිඳු සමඟ එක්ව ගතකළ පස් වසරක් තරම් වූ කාලය අදටත් මතකයට නගන්නේ මහත් සොම්නසිනි.







මෑත කාලයේ ධාබිඳු සාමූහිකය තුළ සමන්මලී සහෝදරියගේ ක්‍රියාකාරීත්වය



චමිලා තුෂාරි

# ඇය දැල්වූ පහන් ආලෝකය ඔස්සේ පෙරට...

ධාබිඳු සාමූහිකයට වසර 40 ක් පිරෙන මොහොතක එහි නිර්මාතෘ භූමිකාවෙහි වගකිව යුතු කාර්යභාරයක් ඉටු කළ, මාගේ මව වන එච්.අයි. සමන්මලී ගේ ජීවන අත්දැකීම් අළලා කෙරෙන අතීතාවර්ජනයට මෙලෙස පවුලේ වැඩිමහල් දියණිය ලෙසත් ඔවුන්ගේ අරගලය අතනොහැර ඉදිරියට ගෙන යාමට දායකත්වය ලබා දෙන ක්‍රියාකාරිනියක ලෙසත් මෙහි යමක් සනිටුහන් කිරීමට ලැබීම මා ලද මහඟු අවස්ථාවක් ලෙස හැඳින්විය හැක.

මගේ තාත්තා කාර්මික ජනපදය තුළ සේවය කිරීම නිසා අප ජීවත් වූ කැලණිය ප්‍රදේශයෙන් ජා ඇළ ප්‍රදේශයට ඒමට අපට සිදු විය. තාත්තාගේ වෘත්තීය සමිති ජීවිතය නිසා අපගේ අධ්‍යාපන කටයුතු හා සමගාමීව එම සමාජ කටයුතුවල නිරත වීමද අපේ පවුලේ සාමූහික වගකීමක් සහ කාර්යයක්ව පැවතුණි. 1980 වසරේ පොලිටෙක්ස් අරගලයේ ද, යුනියන් කාබයිඩ්, ට්‍රයිකෝ, මොන්ටා ගාමන්ට් යනාදී වැඩ වර්ජන සිදු වෙද්දී මට අවුරුදු දහයක් වූවා පමණි. නමුත් අදටත් මතකයේ තැන්පත්ව තිබෙන එම සටන්, අරගල සිහිපත් කිරීම මා වෙත ගෙන එනු ලබන්නේ විශාල පන්නරයකි, ආශ්වාදයකි, සටන් කිරීමට ධෛර්යයකි.

1983 වසරේ ජූලි මස මෙරට සිදු වූ දෙමළ ජනයාට එරෙහි ප්‍රචණ්ඩත්වය, එම වින්දිතයින් බේරා ගැනීමට මාගේ දෙමව්පියන් විසින් සිදු කළ මැදිහත් වීම් සිහිපත් කරනවිට දැනෙන්නේ සතුටකි. එමෙන්ම එම දරුණු තත්ත්වයන් ඇති වූ සමයෙහි කුඩා දරුවන් ලෙස අප මුහුණ දුන් බිය, අනාරක්ෂිතභාවය සිහිපත් කරන විට අදටත් දැනෙන්නේ තැතිගැන්මකි. කර්මාන්තශාලා සහ නිවාස ගිනිබත් වීම්, කඩසාප්පු කඩා බිඳදැමීම් හමුවේ, එම වින්දිතයින්ට මෙන්ම ගමේ දමිළ පවුල් වලට ආරක්ෂාව සැපයීම, දේශපාලන ක්‍රියාකාරීත්වය නොකඩවා පවත්වාගෙන යාම, කම්කරු වැඩ වර්ජන වලදී ආණ්ඩුවේ සහ පාලකයින්ගේ මර්දනයට මුහුණ දීම යනාදී වශයෙන් වූ විවිධ කාරණා වලදී මගේ මව සහ පියා ඒවායේ කොටස්කරුවන් වීම හේතුවෙන් අප මුහුණ දුන් දුෂ්කරතාවයන් බොහෝ වූ බව අද පවා සිහිපත් කරගත හැකිය. ඇතැම් දිනවල කෑමට කිසිත් නොමැතිව ඔවුන් රාත්‍රියේ කීයට හෝ නිවසට පැමිණෙන තුරු බඩගින්නේ සිටීමට අපට සිදු විය. ණයට ගත් පාන් රාත්තල පොලුයි, සීනියි සමඟ හතර දෙනෙකුට භුක්ති විඳීමට සිදුවුණු වාර අනන්තය. සමාජය වෙනුවෙන් කැප වූ මවකගේ සහ පියෙකුගේ දරුවන් හතර දෙනා වූ අපට තනිවම අපගේ වැඩ කටයුතු කර ගැනීමටත් විවිධ වූ දුෂ්කරතාවයන්ට මුහුණ දීමටත් සිදුවිය. කුඩා කල සිටම සමාජ වැඩවලට සහාය වීම, නිවසේ වැඩ කටයුතු බෙදාගෙන කිරීම යනාදිය පවුල තුළ ජීවත්වන අප කාගේත් වගකීමක් ලෙසින් තේරුම් ගෙන තිබීම නිසා අදටත් අපි සියලු දෙනාම වගකීමක් සහිත පුරවැසියන් ලෙසින් සමාජය තුළ ජීවත් වන්නෙමු.

වැඩිමහල් සොයුරාගේ ජීවිතය 89 භීෂණය සමයේ දී අප රැක ගත්තේ ඉතා අමාරුවෙනි. ඒ ඔහු රාජ්‍ය විරෝධී වැඩ කළ ද නොකළ ද පැවති දේශපාලනික භීෂණය නිසා ඔහුව පාරටවත් යැවීමට අපි බිය වූ නිසාවෙනි. ඒ කාලයේම ඔක්තෝබර් 27 වැනිදා මාගේ මව, පියා වතුකරයේ වැඩසටහනකට සහභාගි වීමට ගිය අවස්ථාවේ දී, ලයනල් මාමා සහ රංජිත් සහෝදරයා අතුරුදහන් කොට රද්දොළුගම හන්දියේ මරා පුලුස්සා දමා තිබුණි. මේ සිදුවීම ඇස් දෙකෙන් දැක්කේ මගේ අයියා පමණි. නමුත් අයියා 1990 නොවැම්බරයේ දී හදිසි අනතුරකින් මිය ගියේය. ඔහුගේ මරණය අප පවුලට වැදුණු මරු පහරක් වීය. අයියා පවුලේ වගකීම් අතට ගත් සමාජභාවීය තත්ත්වයන් තේරුම් ගත් සංවේදී පුද්ගලයෙක් වුවේය. ඔහු මවට ඉතාමත් ලැදි වූ ඇය හා සමඟ දුක බෙදා

ගත් දරුවෙකි. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම යහපත් ගුණගරුක දරුවෙකි. ඔහුගේ ඒ හදිසි වෙන්වීම හේතුවෙන් අප පවුල කඩා වැටීමට ලක් වූවා යැයි කිවහොත් එය නිවැරදිය. ලයනල් මාමලා මරා පුළුස්සද්දී, පවුලක් ලෙසින් එකට ජීවත්වීමට හැකි පරිසරයක් අපට ඉතිරිව නොතිබුණි. අපි, රෑ අඳුර වැටෙන විට තැන් තැන්වල ලැගුම් ගනිමින් ජීවිත රැක ගැනීමට උත්සුක වූවෙමු. මේ සිදුවීමේ සත්‍ය එළි දැක්වීමට අම්මලා දැරූ උත්සාහයන්, පොලීසියට රැගෙන යාම, පොලිසියෙන් නිවසට පැමිණීම, අපගේ අධ්‍යාපනය අඩාල වීම යනාදිය හේතුවෙන් අප හය දෙනාගේ ජීවිතවලට බිය, සැක, සංකා, පහල වීම නිසාම සෑමවිටම අප සාමුහික තීන්දු ගැනීමට පෙළඹුණි. ජීවත් වනවා නම් අප හැම දෙනාම ජීවත් වීමටත්, මිය යනවා නම් අප හයදෙනාම දිවි දිය යුතු බවත් පවුලේ මතය වුණි. මේ අනාරක්ෂිත වටපිටාව තුළ එයින් මිදීමට අප නොගත් උත්සාහයක් නැත. මෙවැනි පසුබිමකදී අයියා හදිසි අනතුරක් හේතුවෙන් පවුලෙන් සමු ගැනීම අපට කෙසේ වෙතත් අම්මා සහ තාත්තාට කොහෙත්ම දරාගත නොහැක්කක් වූයේය. අම්මා නැවත ගොඩ ඒමක් ගැන අපට සිතා ගැනීමටවත් නොහැකි විය. සෝ සුසුම් මැද හඬා වැළපෙමින් යුක්තිය, සාධාරණය සෙවීමට අපට සිදුවූයේ ලයනල් මාමාගේ දරු පවුල ආරක්ෂා කිරීමත්, ජයන්ති අක්කාගේ ආරක්ෂාව ගැන බැලීමත් යනාදී වශයෙන් වූ න්‍යෂ්ටික පවුලෙන් බැහැර විශාල සමාජ වගකීමක් ද අප වෙත පවරා ගනිමිනි.

අප පස්දෙනාගෙන් කිසිවෙකුටත් අයියා පවුල වෙනුවෙන් කළ කාර්යය සැපිරීමට නොහැකි විය. ශාරීරිකව මෙන්ම මානසිකව ද අම්මා සහ තාත්තා රෝගාතුර වෙමින් කාලය ගත කරන්නට විය. සෑම විටම අප අම්මාගේ දෛනික තොරතුරු රාත්‍රී ආහාර වේල ගැනීමේදී බෙදා ගත්තෙමු. එහි මූලික පුරුක අහිමිවීම ඇය දරා ගත්තේ ඉතාමත් ආයාසයෙන් හා කැප කිරීමෙනි. මේ දුක සමනය කර ගැනීමට අම්මා තව තවත් ඩාබිඳු වැඩවලට බර දමමින් අයියාගේ ලෝකයෙන් මිදීමට වෙර දරුවාය. ඒ නිසාම කලක් යද්දී ඩාබිඳු ඇගේ ජීවිතයම බවට පත් වූවාය. ඇයගේ ලොකු පුතාගේ වියෝව, දරා ගැනීමට හැකි මානසිකත්වයක් ඇය සකසා ගත්තේ වැඩ කිරීමෙනි.

මෙවැනි සංසිද්ධීන් ගණනාවක් ඔස්සේ අම්මා අවුරුදු හතලිහක් ඩාබිඳු සමඟ ද, ඉන් වසර පහක් පමණ කාන්තා ක්‍රියාකාරිනියක් ලෙසින් විවිධ හැලහැප්පීම් වලට ලක් වෙමින් පුරුෂ මූලික සමාජය තුළ අභියෝගයට ලක් වෙමින් කළ මෙහෙය සහ දැරූ වගකීම අඛණ්ඩ වසර හතළිහක ඉතිහාසයට ශක්තිමත් බැම්මක් විය. එහි පංගුකාරියක් වීමට අවස්ථාව ලැබීම මා ලද භාග්‍යයකි. ක්ෂේත්‍රය පිළිබඳ අත්දැකීම් සහ නිපුණත්වය මා කුඩා කල සිට දෙමාපියන්ගෙන් ලද ආභාෂයකි.

1968 වර්ෂයේ දී පමණ මාගේ පියා කාර්මික ජනපදයේ සේවය කරනු ලැබූ අතර එම කාලවකවානුවේ දී ඔහු වෘත්තීය සමිති සාමාජිකයෙක් ලෙසින් කටයුතු කළේය. එම වෘත්තීය සමිතිවල රැස්වීම්, වැඩ වර්ජනවල රැස්වීම් ආදිය සඳහා අපගේ නිවස නිරන්තරයෙන්ම විවෘතව පැවැති ස්ථානයක් වූ නිසා කම්කරු ඉල්ලීම්, ඔවුන් මුහුණ දෙනු ලබන අසාධාරණතා පිළිබඳව දැනුමක් සහ සංවේදීතාවයක් අප තුළ තිබුණි. බොහෝ වෘත්තීය සමිති සාමාජිකයින් අපේ නිවෙස තුළට පැමිණෙද්දී කුඩා කාලයේ මමත්, මගේ අයියාත්, නංගීත්, මල්ලිත් අනිකුත් වෘත්තීය සමිති සමාජිකයින්ගේ දරුවනුත් මේ දෙස බලා සිටින්නේ මහත් වූ කුතුහලයකිනි. කාලයක් යන විට අපගේ කුතුහලය බිඳී ගොස් එය අපගේ එදිනෙදා ජීවිතයේ අංගයක් බවට පරිවර්තනය විය. බොහෝ විට මගේ මව පෝස්ටර් ගැසීමට සහ රැස්වීම් සාකච්ඡාවලට යන බැවින් අපගේ පාසල් වැඩ වලදී අපි ඒවා නිහඬවම තනියම සිදුකර ගැනීමට හුරු පුරුදු වීමු. සමහර කාලවල දී පාසල් නොගොස් 'අපේ තාත්තලාගේ වැටුප් වැඩි කරනු' යන පුවරු අල්ලමින් විවිධ උද්ඝෝෂණ වලට සහභාගි වූ අවස්ථා ද නැතුවාම නොවේ. බහුල වශයෙන්ම ග්‍රාමීය ප්‍රදේශයන් ගෙන් නාගරික ප්‍රදේශයන්ට සංක්‍රමණය වූ කම්කරුවන්ගේ දරුවන් ලෙස පෙනී සිටීමට ද අපට සිදු විය. එයට හේතුව වූයේ එම වර්ජකයින්ගේ දරුවන් දුර ප්‍රදේශවල ජීවත්වීමයි. විවිධ අවස්ථාවල දී පාසල් නිල ඇඳුම් ගැනීමට අවශ්‍ය පරිදි වැටුප් වැඩි කරන මෙන් ඉල්ලමින් ඔවුහු උඝෝෂණය කළහ. අපිද ඒවාට සහභාගි වීමු.

මේ සමයෙහි දී අපගේ පාසල් කාලය හවස් වරුවේ පැවති නිසා කම්කරුවන් විසින් සංවිධානය කරනු ලබන වැඩ වර්ජන වලට සහාය දැක්වීමට අපිට හැකි වීමු. මේ නිසා ස්ට්‍රයික් චමිලා යන නාමය ද මා වෙත

පටබැඳුණි. ඇතැම් දිනවල අප පාසැල නිමවී පැමිණෙන විට නිවසේ සාලයේ විශාල සෙනග පිරී සාකච්ඡා පැවැත්වෙමින් තිබුණි. අප හොරෙන්ම කුස්සියට වැද දිවා ආහාරය ගන්නේ ගෙට ගොඩවීමට නොහැකි පරිසරයක් පැවතීම නිසාය. මේ කාලයේ දී නිවස තුළ පෝස්ටර් අඳිමින් ඒවාගේ තීන්ත ආලේප කරමින් වැඩ වර්ජනයන් සඳහා උපරිම දායකත්වයන් ලබා දීමට අපි කටයුතු කළෙමු. විවිධ අවස්ථාවන්වල දී එම තීන්ත අපගේ ඇඳුම්වල පවා තැවරුණි. අප පෙළපාලි ගියේ කම්කරු අයිතිවාසිකම් දිනා ගැනීම පිණිසය. ඒ අනුව කුඩා කාලයේ වුවද කම්කරු අයිතීන් පිළිබඳ යම් දැනුමක් සහ අදහසක් මා වෙත තිබුණා යැයි මට සිතේ. මගේ ළමා කාලය වැඩ වර්ජන තුළම ගෙවුණි.

මගේ පවුලේ සහෝදර සහෝදරියන් හතර දෙනෙක් විය. අයියා නංගී සහ මල්ලී සමඟ ගෙවූ මගේ ළමා කාලය ඉතාමත් සුන්දර එකකි. 1980-82 වකවානුව තුළ තාත්තා අරගල වලට සහයෝගය දක්වන විට මගේ අම්මා අනෙකුත් සහෝදරියන්ට විශාල කල්දේරම්වල කෑම පිසූ ආකාරය මට අදටත් මතකය. 1982-83 කාලයේ දී එක් දිනක් මගේ පියා පෝස්ටර් ගැසීමට ගිය අවස්ථාවක දී ඔහුට පහර දී ඔහුගේ කරේ තිබූ මවගේ රන් මාලය කවුදෝ කඩාගෙන ගොස් තිබුණි.

මෙම කාල වකවානුවේ දී පොලිසිය විසින් කර්මාන්තශාලා සේවකයින්ට කරන ලද පහර දීම් බහුල වශයෙන් දක්නට ලැබුණි. උදාහරණයක් වශයෙන් එක් කර්මාන්තශාලාවක සේවය කළ ගැබිණි මවකට පහර දී ඇයව පොලිස් රථයට දැමූ අවස්ථාවක් මගේ මතකයේ රැඳී ඇත.

වෘත්තීය සමිති පිළිබඳ සාකච්ඡාවේ දී ඒවායෙහි අත්දැකීම් මට ලබා ගැනීමට හැකිවන්නේ මාගේ ළමා කාලයේ දීමය. වර්තමානයේ මම රාජ්‍ය නොවන සංවිධානයක් ලෙසින් පෙනී සිටිය ද මාගේ ළමා කාලය ගෙවුණේ වෘත්තීය සමිති සමඟ සහ විවිධ වූ වෘත්තීය ක්‍රියාමාර්ගයන් සමඟය. ඒ කාලයේ විවිධ විදේශික රටවල පුද්ගලයින් සාකච්ඡා සඳහා අපේ නිවසට පැමිණෙන අතර CMU හි අත්දැකීම මාගේ ජීවන ගමනේ මා ලද මහඟු අත්දැකීමක් ලෙසට දැක්විය හැකිය.

මෙහි වටිනාම කාරණයක් ලෙසට මා දකින්නේ, උදාහරණයක් වශයෙන් යුනියන් කාබයිට් ස්ට්‍රයික් එකේ දී වූ සිදුවීමකි. CMU එකේ ශාඛාවක්

යාපනය පරන්තන් ප්‍රදේශයේ වීදුරු කර්මාන්තශාලාවක පිහිටුවා තිබුණි. යුනියන් කාබයිඩ් සේවක වර්ජනයේ දී සේවකයින් වැඩ වර්ජනවල නියැලෙද්දී යාපනය ප්‍රදේශයේ සේවකයෝ වර්ජකයින්ගේ සහායට කෑම බීම, වියළි සලාක ආදිය ගෙනැවිත් ඔවුන්ගේ වැඩ වර්ජනය සාර්ථක කරගැනීමට සහාය වෙති. ඒ වර්ජනයේ නියුතු අති බහුතරයක් දෙනා වෙනත් පළාත් වලින් නගරයට සංක්‍රමණය වී සේවය කරන අයවලුන් වීම නිසාය. සැබැවින්ම එම සම්බන්ධතාවයන් පැවතීම වැඩ වර්ජකයින්ට ධනාත්මක කාරණාවක් වූයේය. මේ සබඳතාවන් අදටත් අපගේ වෘත්තීය ජීවිතවලදී, අපගේ වැඩකටයුතු වලදී අපි පවත්වාගෙන යනු ලබන්නේ ක්‍රමවත් බව ඇති කර ගැනීමට පහසු කාරකයක් ලෙසිනි. විවිධ රටවල ජීවත් වෙන පිරිස් අප සමඟ තවමත් සබඳතා පවත්වනුයේ මේ නිසාවෙන් යැයි මට සිතේ. ඔවුන් අදටත් ස්ත්‍රී අධ්‍යාපන හා පුහුණු වීමේ ආයතනයට සම්බන්ධ වෙමින් විවිධ පත්‍රිකා සාදමින් 'රැල්ල' යන නමින් ඩාබිඳු පුවත් පතේ ලිපි නිර්මාණ ජර්මන් භාෂාවට පරිවර්තනය කරමින්, විවිධ වූ ප්‍රජා සන්ධාන ගොඩනගමින් පුවත් පත බෙදා හැරීම ධනාත්මක ලක්ෂණයක් ලෙසින් මම දකිමි. මෙවැනි ක්‍රමවේදයන් දීර්ඝ කාලීනව පැවතිය යුතු ඒවා බව මාගේ අදහසයි. වර්තමානය වන විට එවැනි ක්‍රියාකාරීත්වයන් දුලබ වීම වෘත්තීය සමිති අඩපණ වීම කෙරෙහිද බලපාන්නක් විය හැකිය.

අතීතය ගැන සිහිපත් කිරීමේ දී මට තවත් එක් සිදුවීමක් සිහියට නැගෙයි. මෙය අපේ ජීවිතවල හැරවුම් ලක්ෂයක් ලෙස ද පෙන්වා දිය හැකිය. ඩාබිඳු පුවත්පතට ලිපි ලියූ එක් කර්මාන්තශාලා සේවකයෙකුගේ ඇඟිලි යන්ත්‍රයකට හසු වී තිබුණි. ඒ වෙනුවෙන් කර්මාන්ත ශාලාවේ පාලකයින් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර ඒ පිළිබඳ ඩාබිඳු පුවත්පතට ලියූ හෙයින් ඔහු වැඩ තහනමට ද ලක් වූයේය. මේ අවස්ථාවේ දී මගේ පියා නීති උපදෙස් මධ්‍යස්ථානයේ සේවය කළෙන් මෙම සිදුවීම අරඹයාම ඔවුහු සංවිධාන ගත වූහ. විප්ලවීය මාක්ස්වාදී පක්ෂය විසින් මේ සඳහා මහත් සහායක් ලබා දෙන ලදී. මෙම සිදුවීමේ දී මගේ පියාගේ යහළුවෙක් වූ නීති උපදේශක මධ්‍යස්ථානයේ නීති උපදේශකවරයකු ලෙස සේවය කළ ලයනල් මාමා මෙම සිදුවීමට කම්කරු සොයුරාගේ පාර්ශවය නියෝජනය කරමින් නීති උපදේශක ලෙසින් පෙනී සිටියේය. කර්මාන්තශාලාව තුළ දී මෙම විමර්ශනය සවස් කාලයේ පැවත්වීමට නියමිතව තිබුණද පාලක පක්ෂය විසින් එය වුවමනාවෙන්ම රාත්‍රී කාලය

දක්වා කල්දමා ගෙන තිබුණි. එම පැමිණිල්ල විභාගයට පාලක පක්ෂය වෙනුවෙන් පෙනී සිට ඇත්තේ අධිනීතිඥ ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මහතා ය. ලයනල් සහ රංජිත් ගේ අතුරුදහන් වීම සම්බන්ධයෙන් ජෙයරාජ් මහතා විසින් ලබා දෙන ලද කටඋත්තරයෙහි සඳහන් කර ඇත්තේ එම අවස්ථාවේ මෙහි සිටි කර්මාන්තශාලා කළමනාකාරිනියක නිතර නිතර නැගිට ගොස් සැක උපදවන පරිදි දුරකතන සංවාදයකට හවුල් වූ බවයි. එදින ඔහු කර්මාන්ත ශාලාව පැත්තෙන් පෙනී සිටි නීතිඥවරයා වූ බැවින් මේ සම්බන්ධයෙන් අවධානයක් යොමුකොට නැත. එහෙත් ඔහු ප්‍රකාශකොට තිබුණේ පැමිණිල්ල විභාග වන අවස්ථාවේ දී මේසය යටින් ඔහු ලයනල් මාමාගේ සෙරෙප්පුව දුටු බවත්, එය ඔහුට මතක තිබූ බවත් ය. පසුදින ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මහතා විසින් ඔහුගේ ආරක්ෂක නිලධාරීන්ගේ මාර්ගයෙන් වෙඩි තබා පුළුස්සා දැමූ මළ සිරුරු හඳුනා ගත් බව ඔහුගේ සාක්ෂියෙහි සටහන්ව ඇත.

මෙම පැමිණිලි විභාගයේ ප්‍රතිඵලයක් ලෙසින් අදාළ සේවකයා හිඟ වැටුප් සමග නැවත රැකියාවේ පිහිටුවීමට තීරණය කර තිබුණි. එහෙත් ලයනල් සහ රංජිත් මෙම සාකච්ඡාව නිමවී රාත්‍රියේදී නැවත නිවෙස් කරා පැමිණීමේදී ඔවුන් සුදු වෑන් රථයකින් පැහැර ගෙන ගොස් රද්දොළුගමදී මරා පුලුස්සා දමා තිබුණි. එදින මගේ මව සහ පියා නිවසේ නොසිටි අතර ඔවුන් සිටියේ වතුකරයේ වැඩසටහනකට ගොස් ආපසු එමිනි. මම සහ මගේ සහෝදර සහෝදරියන් නිවස තුළ සිටි අතර එකල අද මෙන් ජංගම දුරකථන නොතිබිණි. වෙඩි තබා මරාදමා පිළිස්සූ ලයනල් සහ රංජිත් මාමලාගේ බිරින්දෑවරුන් අප නිවසට පැමිණියේ ඔවුන් අප නිවසේ සිටිනවාදැයි බැලීමටය.

පසුව ඔවුන් විසින් පොලිසියට පැමිණිලි කරන ලදුව මළමිනී දෙකක් ඇති බවට ආරංචියක් පැතිරුණි. මේ කාලය වනවිට මාගේ වැඩිමහල් සහෝදරයා උසස් පෙළ හදාරා නිමවූවා පමණකි. ඔහු සිය පාපැදියේ නැගී මළ සිරුරු බැලීමට ගොස් ඇති අතර ඒ ළඟ සිටි කිසිවෙකු ඔහු සමඟ කතා බස්කර නොතිබුණි. එහෙත් එතැන සිටි ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මහතාගේ ආරක්ෂකයින් දෙදෙනෙක් විසින් ප්‍රකාශ කර ඇත්තේ මිනී දෙකක් පිච්චෙනවා යනුවෙනි. පසුව ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මහතා විසින් මියගිය තැනැත්තන් හැඳ සිටි ඇඳුම් පිළිබඳව කරන ලද සොයා

බැලීමේ දී එම ඇඳුම් සහ සෙරෙප්පු කර්මාන්තශාලාවේ විමර්ශනය අවස්ථාවේ දී එහි සිටි පුද්ගලයින් විසින් ඇඳගෙන සහ පැළඳගෙන සිටි ඒවා බවට හඳුනා ගෙන තිබුණි. මෙම සිදුවීමේ එක් සාක්ෂිකරුවකු ලෙසින් ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මහතා නම්කොට තිබුණි. එමෙන්ම ඒ අසල පල්ලියේ පියතුමන්ද සාක්ෂිකරුවෙකු ලෙසට සාක්ෂි දී ඇත. මොවුන්ට වෙඩි තබන ශබ්දය සහ ඔවුන් කෑගසන හඬ මෙම පියතුමාට ඇසී තිබුණි.

එම කාල වකවානුවේ දී මගේ මව ඩාබිඳු කාර්යාලයේ සේවය කළාය. ඩාබිඳු පුවත්පත් දසදහසක් මුද්‍රණය කර ඒවා බෙදා හැරීම මේ කාලයේ දී සිදු විය. ඒ සඳහා අපගේ උපකාරයන් ද ඇයට ලැබුණි. විවිධ ලිපිනයන් ලියා ගම්වලට පත්තර බෙදා හැරීමට, කඳානේ සිට කටුනායකට පැමිණ පත්තර බෙදා දීමට අපට සිදු විය. මේ කාලයේ දී මගේ පියා නිතරම පොලිසියට රැගෙන යන අතර මාගේ වැඩිමහල් සහෝදරයාද ඒ පසු පසින් යයි. එකල ජංගම දුරකථන නොතිබූ අතර අපි පාසල් ඇරී නිවසට පැමිණෙන බොහෝ අවස්ථාවන්හි දී මාගේ මව සහ පියා ගෙදර නොවීය. එවැනි අවස්ථාවන්වල දී අප ඔවුන් සෙවීමට කටයුතු කළේ බියෙනි.

මේ සියල්ල විසඳා ගැනීමෙන් අනතුරුව මාගේ පියා කියා සිටියේ, "මේක කළේ කවුද කියලා අපි දන්නේ නැහැ ජීවත් වෙනවනම් අපි හය දෙනාම එකට ජීවත් වෙන්න ඕනේ. මැරෙනවා නම් එකට මැරෙන්න ඕනේ ඉස්සෙල්ලාම අපි ජීවත් වෙන්න උත්සාහ කරමු" කියා ය. එහෙත් ආරක්ෂාව පිණිස ඥාතීන්ගේ නිවෙස් වෙත යාමට අපට සිදු විය. අම්මාත්, තාත්තාත්, මමත් කැළණියට ගිය අතර නංගි පුංචිලාගේ ගෙදරට ගොස් ඇරලීය. අයියාද යහළුවෙකුගේ නිවෙසට ගියේය. සවස් කාලය වන විටදී ගෙදර සියල්ලෝම සීසීකඩ විසිරී ආරක්ෂාව සොයා ගත්තේ අම්මාට සහ තාත්තාට අනතුරක් වේදැයි බියෙනි. නැවත නිවසට පැමිණෙන විට අපි යුහුසුළුව බලන්නේ නිවසෙහි මිදුලෙහි ටයර් සළකුණු තිබෙනවාද යන්නයි. මෙලෙස විවිධ උපක්‍රම සොයමින් ආරක්ෂා වීමට උත්සාහ කළද මගේ පියා පසුව පවසා සිටියේ, 'මේක හැමදාම කරන්න බැහැ. මැරෙනවනම් අපි එකට මැරෙමු' යනුවෙනි. ගෙදර තිබුණු පරණ කඩුවක් දොරකඩ මුල්ලේ තියා ඒ අසලින් මන්නෙකුත් තියා කවුරුන් හෝ පැහැර ගැනීමට ආවොත් පහර දෙන්න යැයි කියා සිටියේය. එම කාලයේදී මා උසස් පෙළ හදාරන්නට පටන් ගත්තා පමණි. මෙසමය පිළිබඳව සිහිපත් කරන විට මට

මතක් වෙන්නේ අපිට තිබූ කුඩා යතුරු පැදියයි. බයෙන් බිරාන්ත වූ අප නිතරම ගමන් කරන්නේ හුණුපිටිය ප්‍රදේශයේ තිබුණු රබර් වත්තක් මැද්දෙනි. මා නිතරම බයෙන් වෙව්ල වෙව්ලා, පිටුපස හැරී බල බලා යනවා මට හොඳට මතකය. අදටත් අපගේ සිත් තුළ ඒ බය ඒ විදියටම තියෙනවා නේදැ යි වරෙක මට සිතේ. අදටත් පොලිස් නිලධාරියෙක් පිටිපස්සෙන් පැමිණෙන විට මගේ සිතට එන්නේ බිය මුසු හැඟීමකි.

මෙම සියලු දේවල් නිම වී වසරක පමණ කාලයක් ගත වූ පසු අයියා රිය අනතුරකින් මිය ගියේය. එවිට ඔහු විසි එක්වන වියේ පසු වුණි. ඔහු තේ කොළ ව්‍යාපාරයක් සිදුකළ අතර කජු ව්‍යාපාරයක්ද කරගෙන ගියේය. කජු හෝටල් වලට දමා, තේ කොළ රැගෙන නැවත පැමිණෙද්දී ඔහු අනතුරකට ලක්වුණි. අයියාගේ මේ නික්ම යාම අප සියළු දෙනා දුකෙන් දුකට පත් කළ සිදුවීමක් විය. අම්මා නිතරම අඬමින් කාලය ගත කිරීමට පටන් ගත්තාය. මේ හේතුවෙන් නිවසේ සියලු වැඩ කටයුතු සිදු කිරීමේ වගකීම මාවෙත පැවරුණි. මෙය මාගේ අධ්‍යාපන කටයුතු වලට එල්ල වූ ප්‍රබල පහරක් වීය.

ඩාබිඳු සහ මා ගැන කතා කිරීමේ දී, මට ඩාබිඳු සාමූහිකයට සම්බන්ධ වීමට සිදු වූයේ මගේ මවට එය දිගටම සිදු කරගෙන යාමට උවමනා වූ නිසාය. ඩාබිඳු සමඟ එක්ව වැඩ කිරීම, අයියා නැති වීමේ දුක දරා ගැනීමට අම්මාට ඉමහත් පිටුවහලක් විය. දරු මුණුබුරන් වටා ගෙතුණු අතීතයක් ඇයට නැත. ඇයට ඒ පිළිබඳව සිතීමටද කල්පනාවක් නොවීය. සමාජ සේවයෙහිම යෙදෙමින් සිත හදා ගන්නවා ඇරෙන්නට ඇයට වෙනත් විකල්පයක් නොවීය. මෙම කාලයේ දී මගේ බාල සොහොයුරාට අධ්‍යාපනය අහිමි වීය. ඔහු ඉගෙන ගත්තේ සාමාන්‍ය පෙළ දක්වා පමණකි.

ඈත දුර ගම්වලින් නගරයට සංක්‍රමණය වී පුංචි නේවාසිකාගාරවල කිසිඳු පහසුකමක් නොමැතිව සිටි කාන්තාවන්ට ශක්තියක් වීමට ලැබීම මාගේ ජීවිතයේ ලද භාග්‍යයක් ලෙස මම සලකමි. අම්මාගේ සහ තාත්තාගේ ශක්තියෙන් ගොඩනගා ගත් ඩාබිඳු දිගටම පවත්වාගෙන යා යුතු නිසාවෙන් දරුවන් දිවා සුරැකුම් මධ්‍යස්ථාන වල පවා දමා මේ වෙනුවෙන් ඇප කැප වී කටයුතු කිරීමට මටද සිදු විය.

මගේ මව විවිධ වූ කාන්තා ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වූවාය. ලක්බිමේ මව්වරු සහ දියණියෝ යන සංවිධාන ජාලයෙහි ආරම්භක සාමාජිකාවක් වූ මගේ මව වරක් එහි සම්බන්ධීකාරක තනතුරට පත්ව සිටි අතර ඒ කාලයේ දී කාන්තා සංවිධාන තිස් දෙකක් පමණ එහි සාමාජිකත්වය ගෙන තිබුණි. යුද්ධය අවසන් වී රැඳී සිටි කාන්තාවන්ට උපකාර කරමින් ඔවුන්ගේ දරුවන්ට උපකාර කරමින් පොත්පත් මනෝ උපදේශන සේවාවන් ආදිය ලබාදෙමින් කටයුතු කිරීමට ඇයට හැකි විය. මේ හේතුවෙන් විවිධ ප්‍රදේශවලට මගේ මවට යාමට සිදු විය. සාමය සඳහා ගොඩනැගුණු ව්‍යාපාරවලට ද ඇයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබුණි. මෙම ක්ෂේත්‍රය සම්බන්ධ වී කෙරෙන විවිධ වැඩසටහන්වල දී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විදේශගත වීමට ඇයට අවස්ථාව ලැබුණි. මෙවැනි අවස්ථාවන් තුළ ලෝකයේ විවිධ ප්‍රතිපත්තීන්, චර්යාධර්ම පද්ධතීන් සකස් කිරීමේ වැඩසටහන්වලට සහභාගිවන්නට මූලිකත්වය ගන්නට ඇයට අවස්ථාවන් ලැබෙන්නට ඇත. මෙහිදී ඩාබිඳු පත්තරය ද මහත් රුකුලක් විය. විදේශ රටවල සංවිධාන කමිටු ව්‍යාපාර ආදීය තුළ මැදිහත් වීමෙන් බොහෝ වෙලාවට විවිධ නිරීක්ෂක සංවිධාන මෙහි පැමිණීමද සිදු විය.



1997 ජර්මානු සෙනට් සභාවෙන් ලද සම්මානය

අම්මාගේ ජීවිතයේ විවිධ අවස්ථාවන්හි දී ඇයගේ කැපවීම වෙනුවෙන් ඇය සම්මානයට පාත්‍ර විය, ඇය ලද වඩාත්ම වැදගත් සම්මානය වූයේ, 1998 වසරේ ජර්මනියේ සෙනෙට් සභාවෙන් පිරිනමන ලද Bremen Solidarity Prize නම් වූ ජාත්‍යන්තර සම්මානයයි. ඇයට මෙම සම්මානය ලබා දුන්නේ කම්කරු කාන්තාවන්ගේ මානව අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා  මෙන්ම වර්ගවාදයට එරෙහිව කැප කළ සේවය අගයමිනි.




එමෙන්ම සීඩෝ ව්‍යාපෘතිය වෙනුවෙන් කළ කැපවීම උදෙසා ද ඇය වෙත “ශක්ති” සම්මානය පිරිනැමුණි. ආසියාතික රටක වසර හතළිහක ඉතිහාසයක් තිබෙන ඩාබිඳු සාමූහිකයේ වැඩ කරගෙන යාමට ඇයට හැකි වී ඇත්තේ ඇගේ සිතේ පවතින අප්‍රතිහත් ධෛර්ය නිසාවෙනි. ඇය තවමත් මෙරට ස්ත්‍රී ව්‍යාපාරයේ ක්‍රියාකාරී සාමාජිකාවකි.

1989 ට පසුව ඇතැම් කර්මාන්තශාලා වලින් අපි සොයාගෙන පැමිණ විවිධ පුද පඬුරු පෙන්වමින් අපගේ වැඩකටයුතු අඩාල කිරීමට විවිධ උපාය මාර්ග භාවිතා කරන ලදී. එහෙත් අප ඒවාට නැමුනේ නැත. රැවටුනේද නැත.

නිදහස් වෙළඳ කලාප බිහිවන විටම කම්කරු මර්දනය ද දියත් වී තිබුණේ ඒවාට විවිධ දේශපාලන වාසි තකා උපදෙස් සහ පහසුකම් සැලසූ පිරිස බලවත් වූ බැවිනි. මේවායෙහි රැකියා අවස්ථාවන් තිබුණි. එහෙත් විවිධ මර්දන නීති අණ පනත් තුළ කම්කරු අයිතිවාසිකම් යටපත් කර තිබුණි. නේවාසිකාගාර පහසුකම් යහපත් නොවූ අතර පාරවල් ඇතුළු පහසුකම් දුෂ්කර වූ අතර විවිධ අවස්ථාවන්හි දී කාන්තාවන්ට සමූහ දූෂණ, අපයෝජන ආදිය සිදු විය. උදාහරණයක් වශයෙන් එක් දිනක දී කම්කරු සේවිකාවක් සිය නේවාසික කාමරයට යමින් සිටිය දී ඇයව කනත්තකට ඇදගෙන ගොස් දූෂණය කර තිබුණි. එම සිදුවීමට මැදිහත් වූ ඩාබිඳු සාමූහිකය දූෂිතයාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට එම කම්කරු සොයුරියට සහාය වූවාය. එම පුද්ගලයාට වසර තිස් පහක සිර දඬුවම් ලැබුණු අතර මෙය ඩාබිඳු සාමූහිකයේ අප ලද එක් ජයග්‍රහණයකි.

එමෙන්ම තවත් අවස්ථාවක දී සමූහ දූෂණයක් සිදු වූ අතර එයටද මැදිහත් වී එම සහෝදරියට යුක්තිය ඉෂ්ට කර ගැනීමට සහාය වීමු. ආහාර විෂ වීම් යනාදිය පිළිබඳව මෙන්ම කර්මාන්තශාලා සේවකයින්ගේ විවිධ අයිතීන් පිළිබඳව ඩාබිඳු පත්තරය මහත් බලපෑමක් සිදුකරනු ලබයි. ඇතැම් අවස්ථාවන් වලදී දේශපාලකයින්ගේ බලපෑම් ද ඇති විය. ඩාබිඳු සාමූහිකය පිළිබඳ ඉතිහාසය නැවත සිහිපත් කිරීමේ දී මා හට දැනෙන්නේ නිහතමානි ආඩම්බරයකි. මගේ මව ඇතුළු ආරම්භක සාමාජිකාවන් සියලු දෙනා විසින් මර්දනයට, භීෂණයට මුහුණ දෙමින් දිවි පරදුවට තබා කරන ලද කැපකිරීම්වල හරය අප වෙත ඉතිරිකොට ඇත. අරගල මාවතෙහි, සටන් බිමෙහි සිට ගැනීමට අප පන්නරය ලබන්නේ එම කැප කිරීම්වල ශක්තියෙනි.



# පහන් ටැඹ දැල්වුවෙමු

එච්.අයි. සමන්මලී... මතක ආවර්ජනා

මෙය, සමන්මලී අක්කා වරින් වර ලියූ දශක හතරක ඇගේ ජීවන ගමනේ මතක සටහන් පොතක් වශයෙන් එළි දැක්වීමට දරණ උත්සාහයයි.

මෙය හුදෙක් ජීවන මතක සටහන් පොතක් නොවේ. මෙය ස්ත්‍රීවාදී සටන්කාරියකගේ, මානවවාදියෙකුගේ අභීත සටන් ඉතිහාසය පිළිබඳ කතාවයි. නිදහස් වෙළඳ කලාපයේ ඇඟළුම් සේවක ස්ත්‍රීන් සංවිධානය කිරීමේ, ස්ත්‍රී කම්කරු සටන් මෙහෙයවීමේ සහ ඒවාට මග පෙන්වීමේ ඉතිහාසයයි.

'පහන් ටැඹ දැල්වුවෙමු' මේ මතක සැමරුම් පොත සඳහා ඇය විසින් ලබාදුන් නමයි. ඇය පහන් ටැඹ දල්වා ඇත. නිදහස් වෙළඳ කලාපයේ ස්ත්‍රී සේවක අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් ආරම්භ කරන ලද පළමු කාන්තා සංවිධානයෙහි ආරම්භක සාමාජිකාවක ලෙසින්, පැවැති පීතෘමූලික වෘත්තීය සංගම්වලට අභියෝග කළ ස්ත්‍රීවාදී වෘත්තීය සංගම් ක්‍රියාකාරිනියක ලෙසින්, සාමය, සත්‍ය සහ සාධාරණය උදෙසා රාජ්‍ය මර්දනයට මුහුණ දෙමින් වැඩකළ සටන්කාරියක ලෙසින් සමන්මලී සහෝදරිය අනාගත ස්ත්‍රී පරම්පරාව වෙත සිය ජීවන ධෛර්යයේ ආලෝකය පතුරුවා ඇත.

සුමිකා පෙරේරා
2025.10.20

ISBN 978-955-8023-09-9

පහන් ටැඹ දැල්වුවෙමු - එච්.අයි. සමන්මලී... මතක ආවර්ජනා